# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,934 — 1970 නොවැම්බර් 27 වැනි සිකුරාදා — 1970.11.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1665 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 1692 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1676 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1681 | රට බිම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 1690 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | 1692 |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 1691 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... — ... | 1693 |


## තනතුරු — ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරීයා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට $7\frac{1}{2}$ කට සමාන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙසු සත්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණ යකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට ඇතුළු නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

**1970 ජූනි මස 2 වැනි දින,**
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

## ලංකා ටයර් සංස්ථාව

### ඇබෑර්තු (ස්ථිර)

ලංකා ටයර් සංස්ථාවේ පහත සඳහන් ඇබෑර්තු සඳහා මූලික සුදුසුකම් ඇති ලාංකික පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ.

### (1) අලෙවි කළමනාකාර තනතුර

**රැකියා සුදුසුකම්.**—කර්මාන්ත ආයතනයක විකිණීම්/වෙළඳ කටයුතු/ අලෙවි පර්යේෂණ කටයුතු පිළිබඳ විධායක තත්ත්වයේ අවුරුදු 5 ක පළපුරුද්ද හා පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් **හෝ** විධායක තත්ත්වයේ අවුරුදු 7 ක පළපුරුද්ද ඇතුළුව අවුරුදු 12 ක පළපුරුද්ද හා අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය **හෝ** විධායක තත්ත්වයේ අවුරුදු 10 ක පළපුරුද්ද අතුළුව අවුරුදු 15 ක පළපුරුද්ද හා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය.

වැටුප් **පරිමාණය.**—රු. 1,150—50×5—රු. 1,400 (සියලු දීමනා අඩංගුව).

### (2) අලෙවි කිරීම් ප්‍රවෘත්ති නිළධාරී තනතුර

**රැකියා සුදුසුකම්.**—අලෙවි/අලෙවි පර්යේෂණ කටයුතු පිළිබඳ අවුරුදු 3 ක පළපුරුද්ද හා ආර්ථික විද්‍යාව/වාණිජ විද්‍යාව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය.

වැටුප් **පරිමාණය.**—රු. 800—45×7—රු. 1,115 (සියලු දීමනා අඩංගුව).

අයදුම්කරුවන් තම වයස, අධ්‍යාපනික සුදුසුකම්, පාසැලින් අස්වූ පසු කරන ලද රැකියා ආදී සියලුම විස්තර තම ඉල්ලුම් පත්‍රවල සඳහන් කළ යුතු අතර, සහතික පත්වල පිටපත් ද ඉදිරිපත් කල යුතුය.

රජයේ හා සංස්ථාවන්හි සේවයෙහි නියුතු ඉල්ලුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර තමන්ගේ අංශ ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කල යුතුය.

සියලුම ඉල්ලුම්පත්‍ර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් 1970.12.10 වෙනි දිනට හෝ ඊට ප්‍රථම කැළණිය, ලංකා ටයර් සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂ තැනට ලැබෙන සේ එවිය යුතුය.

**සේවක මණ්ඩල කළමනාකාර.**

1970 නොවැම්බර් මස 17 වෙනිදා,
ලංකා ටයර් සංස්ථාව,
කැළණිය.

11–1050—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා ගුවන් හමුදාව

### විකිරණ ශිල්පී තනතුර

කටුනායක, රාජකීය ලංකා ගුවන් හමුදා රෝහලේ, විකිරණ ශිල්පී තනතුරක් සඳහා අයැදුම් පත් කැඳවනු ලැබේ.

**අයදුම් පත**—

(අ) පහත සඳහන් ආකෘතිය අනුව සකස් කළ යුතුයි;

(ආ) සිවිල් පාලක නිලධාරි හා ගණකාධිකාරි, රාජකීය ලංකා ගුවන් හමුදාව, තැ. පෙ. 594, කොළඹ 2 යන ලිපිනයට එවිය යුතුයි;

(ඇ) 1970 දෙසැම්බර් මස 14 වැනි දින හෝ ඊට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

ඉල්ලුම් පත් බහා එවන කවරයේ උඩ වම් කෙළවරේ "විකිරණ ශිල්පී තනතුර සඳහා අයදුම් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය.

2. **වැටුප් පරිමාණය.**—ඒකාබද්ධ—වර්ෂයකට රු. 3,864 න් පටන් ගෙන රු. 144 බැගින් වූ වැටුප් වර්ධක 18 කින් රු. 6,456 දක්වා වැඩිවේ. (වර්ෂයකට රු. 4,584 ට සහ රු. 5,592 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වේ.)

කල්පිත—වර්ෂයකට රු. 1,620 න් පටන්ගෙන රු. 120 බැගින් වූ වැටුප් වර්ධක 18 කින් රු. 3,780 දක්වා වැඩිවේ. (වර්ෂයකට රු. 2,220 ට සහ රු. 3,060 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වේ).

3. **වයස් සීමාව.**—වයස අවුරුදු 25 ටත් 35 ටත් අතර විය යුතුයි. රජයේ සේවයේ නියුක්ත වූවන්ට ඉහළ වයස් සීමාව බල නොපැවැත්වේ.

4. **බඳවා ගැනීමේ වගන්ති.**—තනතුර තාවකාලිකයි. විශ්‍රාම වැටුප් රහිතයි. තෝරා ගනු ලබන අයදුම්කරු විසින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුයි.

5. **සුදුසුකම්.**—(i) රසායන විද්‍යාව සහ භෞතික විද්‍යාව විෂයයන් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන හෝ උසස් හෝ විභාගයක් සමත් වී සිටිය යුතුයි, සහ

(ii) ලන්ඩන්හි විකිරණ ශිල්පී සංගමයේ සාමාජිකත්ව ඩිප්ලෝමාව ලබා තිබිය යුතුයි.

6. පහත සඳහන් ලේඛනවල පිටපත් පමණක් (මුල් පිටපත් නොවේ) ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි:—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ආධ්‍යාපනික සහ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්.

7. **සේවා කොන්දේසි.**—තෝරාගනු ලබන අයදුම්කරු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු නම්—

(අ) පත්වීම දෙනු ලබන්නේ වර්ෂ 3 ක පරීක්ෂා කාලයක් මතය;

(ආ) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත්, දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මතුවට පනවනු ලබන ව්‍යවස්ථාවලටද අනුකූලව ක්‍රියා කළ යුතුයි;

(ඇ) ඔහුගේ පරීක්ෂා කාලය තුළදී සිංහල භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුයි;

(ඈ) පරීක්ෂා කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම අනිකුත් කරුණු අතර, නියමිත කාල සීමාවන් තුළදී නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම මත රඳා පවතී. එසේ නියමිත කාල සීමාවන් තුළදී නියමිත පරීක්ෂණයන්ගෙන් සමත් නොවුවහොත් ඔහුගේ වැටුප් වර්ධක අත්හිටවනු ඇත. නියමිත කාලයෙන් පසු තවත් සමසක් ගත වන්නට පෙර පරීක්ෂණයෙන් සමත් නොවුවහොත් වැටුප් වර්ධක අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කර, එම නතර කිරීම පරීක්ෂණයෙන් සමත් වන තෙක් ක්‍රියාත්මකව තබනු ඇත;

(ඉ) පරීක්ෂා කාලය අවසානයේදී නියමිත සිංහල ප්‍රවීණතාවය ලබා නොගතහොත්, පාලන රෙගුලාසි 120 හා 121 ප්‍රකාර ක්‍රියා කරනු ඇත;

(ඊ) ඔහුගේ පත්වීම ස්ථිර කළ දිනයේ සිට වර්ෂ දෙකක් ඇතුළත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයේ සිංහල භාෂාව පිළිබඳ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත් විය යුතුයි. මෙම පරීක්ෂණයෙන් අසමත් වුවහොත් වැටුප් වර්ධකය පමා කරනු ඇත. (දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයෙන් බඳවා ගනු ලැබූ අයට ඉහත සඳහන් (ඇ), (ඈ) සහ (ඉ) කොන්දේසි බලපවත්වනු ඇත).

8. නියමිත දිනට පසු එවනු ලබන ඉල්ලුම් පත් භාරගනු නොලැබේ. ඉල්ලුම් පත් හෝ ඒ සම්බන්ධ වෙනත් ලියවිලි හෝ එවිය යුත්තේ, රාජකීය ලංකා ගුවන් හමුදාවේ, සිවිල් පාලක නිලධාරී හා ගණකාධිකාරී නමට මිස මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට නොවේ.

9. දැනට රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගේ ඉල්ලුම් පත් ඔවුන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මාර්ගයෙන් එවිය යුතුයි. අයදුම්කරු තෝරා ගනු ලැබුවහොත් ඔහු මුදා හැරීමට හැකි බවට සහතිකයක් ද ඒ සමග එවිය යුතුයි.

10. දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවනු ලබන ඉල්ලුම් පත් නියම දිනට පසු මෙම කාර්යාලයට ලැබුණහොත් ඒවා භාරගනු ලබන්නේ එම ඉල්ලුම් පත් නියම දිනට ප්‍රථමයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ලැබී, ප්‍රමාද වීමට හේතු දක්වා නිර්දේශ කළහොත් පමණී.

11. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ පළ කෙරෙන රජයේ සේවයේ තනතුරුවලට කෙරෙන පත්වීම්වලට බලපාන්නා වූ පොදු කොන්දේසි ද බලනු මැනවි.

12. ඉල්ලුම් පත් ලැබුණු බැව් දන්වනු නොලැබේ.

ඒ. සී. අරසරත්නම්,
සිවිල් පාලක හා ගණකාධිකාරී.

මූලස්ථානය, රා. ලං. ගු. හ.,
තැ. පෙ. 594, කොළඹ,
1970 නොවැම්බර් මස 15 දින.

### අයදුම් පත් ආකෘතිය

**විකිරණ ශිල්පි තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :———.
   පෙළපත් නම :———.
   අනෙක් නම් :———.

2. තැපැල් ලිපිනය :———.

3. 1970.12.14 වැනි දිනට නියම වයස :—
   අවුරුදු :——, මාස :——, දින :——.

4. උපන් දිනය සහ ස්ථානය :———.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

5. ජාතිය :———.
   (අ) අයදුම්කරුගේ පියාගේ උපන් ස්ථානය :———.
   අයදුම්කරුගේ මුත්තාගේ උපන් ස්ථානය :———.
   (ආ) ඔබ ලාංකිකයෙකු වූයේ පරම්පරාවෙන් ද නැතහොත්, ලියාපදිංචි වීමෙන් ද යන වග සඳහන් කරන්න. ලියා පදිංචි වීමෙන් නම් එම සහතිකයේ අංකය සහ දිනය ද, එය නිකුත් කළේ කවරෙකු විසින් ද යන වග ද සඳහන් කරන්න :———.

6. (අ) ආධ්‍යාපනික හා කාර්මික සුදුසුකම් (සහතිකපත්වල පිටපත් ඇමිණිය යුතුයි) :———.
   (ආ) වෙනත් සුදුසුකම් :———.

7. ඔබේ පළපුරුද්ද පිළිබඳ සම්පූර්ණ විස්තර සපයන්න : ———.

8. දැනට නියුක්ත රක්ෂාවේ විස්තර :———.

9. අයදුම්කරු පිළිබඳ විස්තර සැපයිය හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් (ඔබ ගැන හොඳින් දන්නා ඥාතීන් නොවන වගකිව යුතු පුද්ගලයින් විය යුතුයි. රජයේ සේවකයින් ගෙන් මෙය අනවශ්‍යයි) :———.

10. කවර කාලයක හෝ උසාවියක් මගින් ඔබට දඬුවම් පමුණුවා තිබේද ? එසේ නම් එහි විස්තර සපයන්න :———.

11. මෙම අයදුම්පතේ ම විසින් සපයා ඇති තොරතුරු සැබෑ බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරා ගැනීමට පෙර දැන ගන්නට ලැබුණහොත් මා නුසුදුස්සකු කරනු ලැබිය හැකි බවත්, පත් කිරීමෙන් පසුව දැන ගන්නට ලැබුණහොත් කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකර දැමිය හැකි බවත් මම දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

11-934—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## බදුල්ල දිස්ත්‍රික්කයේ කණහෙල කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ යටිකිඳ කොට්ඨාශයේ විවාහ (උඩරට හා සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

කණහෙල උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොට ගෙන ගම් වාසීන් ගෙන් සැලකුම් ලබන ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසි එකකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාමසේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල්, සහ සමුපකාර සමිති, ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාල වල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වල ඇතුළත් වේ.

3. සියළුම ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1971 ක්වූ ජනවාරි මස 10 වැනි දින හෝ එදිනට පෙර මා වෙත ලැබෙන සේ ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

බ. සු. විජේවීර,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1970 ක්වූ නොවැම්බර් මස 16 වන දින,
බදුල්ලේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේදීය.

11-949—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## බදුල්ල දිස්ත්‍රික්කයේ ඔයපලාත බටහිර කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ වියළුව කොට්ඨාශයේ විවාහ (උඩරට හා සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

ඔයපලාත බටහිර උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොටගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසි එකකට නො අඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කායර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කායර්ාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිඩ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති, ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාල වල ප්‍රදශීනය කර ඇති දැන්වීම් වල ඇතුළත් වේ.

3. සියළුම ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල සකස්විය යුතු අතර, ඒවා 1970.12.30 වන දින හෝ එදිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

බ. සු. විජේවිර,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1970 ක්වූ නොවැම්බර් මස 16 වන දින,
බදුල්ලේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේදීය.

11-950—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

අංකය : එස්.එච්. 332/60

## පොලිස් දෙපාර්තමේන්තුව

**පොලිස් කොස්තාපල් යාන්ත්‍රිකයින් බඳවා ගැනීම**

ලංකා පොලිස් සේවයේ මතු සඳහන් වෘත්තීන්හි පොලිස් කොස්තාපල් යාන්ත්‍රික ශ්‍රේණියේ ඇබෑර්තු පිරවීම සඳහා, පහත 4 වැනි ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලත් ලාංකිකයින් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :—

පෙදරේරුවන්,

වඩු කාර්මිකයන්,

ඊයම් වැඩ කරුවන්,

විදුලි කාර්මිකයින්,

අයදුම් පත් ඉදිරිපත් කළ යුත්තේ ඉහත වෘත්තීය සුදුසුකම් ලත් අය පමණකි.

2. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කර ගත් අයදුම් පත් කොළඹ 5, නාරාහේන්පිට, පොලිස් ප්‍රවාහණ කාර්යාලයේ, පොලිස් අධිකාරි, ප්‍රවාහණ, වෙත ලිපිනය කර, 70.12.20 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු යි.

3. **වැටුප් ක්‍රමය.**—පළමුවැනි අවුරුද්ද—වර්ෂයකට රු. 2,640, ඉන්පසුව වර්ෂයකට රු. 2,760—22 × 60—රු. 4,080, රු. 3,060, රු. 3,360, රු. 3,660 සහ රු. 3,900 යන වැටුප් තලයන්ට ළඟා වෙන්ට පෙර කාර්යක්ෂමතා කඩඉම් වෙයි.

4. **අවශ්‍ය සුදුසුකම්.**—අයදුම්කරුවන්—(අ) 70.12.20 වැනි දින ට වයස අවුරුදු 18 ක් 30 ත් අතර විය යුතු ය. සේවා මුක්ත භටයින් ට සාමාන්‍ය වයස පිළිබඳ අනුග්‍රහය ලැබෙනු ඇත. ලංකාවේ එක්සත් රාජධානි කඳවුරු වල නියුක්තව සිටි සේවකයින්ට අංක 427 සහ 434 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛ වලින් පැවරෙන සියළු අනුග්‍රහයන් හිමි වේ.

(ආ) මතු දක්වෙන භාෂා වලින් එකක් හෝ කියවීමට හා ලිවීමටත් හැකි තත්ත්වයක සිටිය යුතුය : සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි.

(ඇ) පිළිගත් මෝටර් ඉංජිනේරු සමාගමක හෝ වෙනත් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ අවුරුදු 4 කට නොඅඩු කාලයක් ආධුනිකත්වය සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබිය යුතු ය.

(ඈ) එක් ඇසකින් 6/12 ක පෙනුම ඇති අය විය යුතු ය. එක් ඇසක පෙනුම 6/6 නම් අනෙක් ඇසින් 6/18 පෙනුම පිළිගනු ලැබේ.

(ඉ) වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු යි.

5. බඳවා ගැනීමේ කොන්දේසි.—(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාලයකට යටත්වේ.

(ආ) තෝරාගනු ලබන අපේක්ෂකයින් ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත් විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථා වලට මෙන්ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථාවලටද අනුකූලව ක්‍රියා කළ යුතුය.

(ඇ) තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි කාර්ය සංවිධානයෙන් වන රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, පොලිස් විනය නීති සංග්‍රහය සහ පොලිස්පතිවරයා විසින් හෝ ආණ්ඩුව විසින් හෝ විටින් විට නිකුත් කරන වෙනත් නියෝගයන්ට යටත් විය යුතුවේ.

(ඈ) තෝරාගනු ලබන අපේක්ෂකයින් අවිවාහක නම් පත්වීම ස්ථිර කරනතුරු විවාහවීමට අවසර දෙනු නොලැබේ. කෙසේ වෙතත්, මේ සඳහා අවුරුදු දෙකක සතුටුදායක සේවයක් ඇති ආධුනික කොස්තාපල් යාන්ත්‍රිකයින් ගෙන් ලැබෙන ඉල්ලුම්පත් සලකා බලා පොලිස්පතිවරයාගේ අභිමතය පරිදි අවසර දෙනු ලැබේ.

(ඉ) තෝරාගනු ලැබූ අපේක්ෂකයින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය විෂය යෙහිලා නව ප්‍රවේශකයින් වෙත් නම් ඔවුන් විසින් ඔවුන්ගේ ආධුනික කාලය තුළ සිංහල ප්‍රවීනතාවයක් ලබා ගත යුතුය. ආධුනික කාලසීමාව අවසානයේ දී තනතුරෙහි ස්ථිර කිරීම වෙනත් කරුණු අතර සිංහල ප්‍රවීනතා පරීක්ෂනයකින් සමත්වීම මත රඳා පවතී. ආධුනික කාලය තුළදී නියමිත සිංහල ප්‍රවීනතා තත්ත්වයට එළඹීමට අපොහොසත් වන අයගේ සේවය නතර කළ හැකිය. එහෙත් ඔවුන් රාජ්‍ය භාෂා හැදෑරීමට නියම උත්සාහයක් කර ඇති බවට පත්කරන බලධාරියා සෑහීමකට පත්විනම් සේවය නතර කිරීම කල් දැමිය හැකිය. නියමිත දිනයෙන් පසුව සාධාරණ කාලයක් ඇතුළත ඔවුන් පරීක්ෂණයෙන් සමත්වුවහොත් පත් කිරීමේ බලධාරියාගේ අභිමතය පරිදි අහිමිවූ ජ්‍යෙෂ්ඨත්වය අත්හැර දැමිය හැකිය.

(ඊ) සිංහල මාධ්‍යයෙන් රජයේ සේවයට ඇතුලත්වීමට සුදුසුකම් ලබන්නා වූ නිළධාරීන් ප්‍රවීනතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡෙදයේ ආරම්භයේ පළකරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසි වලටද අවධානය යොමු කළ යුතුයි.

7. කොස්තාපල් යාන්ත්‍රිකයින්ට —

(අ) නොමිළයේ නිවාස,

(ආ) නොමිළයේ නිල ඇඳුම්, සහ

(ඇ) ඇඳුම් කට්ටල පෙට්ටි, පලස්, සපත්තු සහ පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය යනාදිය ද සපයනු ලැබේ.

8. ඉල්ලුම්කරුවන් ඔවුන්ගේ ඉල්ලුම්පත් වලට පහත සඳහන් සහතික වල පිටපත් අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) මැතදී ගන්නා ලද චරිත සහතික දෙකක් සහ

(ඇ) සිව් වසරක වැඩ ඉගෙන ගත්තකු ලෙස පුහුණුව ලැබීමේ සහතිකය.

9. අවසාන දිනට පසුව ලැබෙන සහ මෙම ගැසට් නිවේදනයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. එවැනි අපේක්ෂකයින්ට පිළිතුරු සපයනු නොලැබේ.

ඩී. එස්. ඊ. පී. ආර්. සේනානායක,
පොලිස්පති.

1970.11.19,
කොළඹ 1,
පොලිස් මූලස්ථානයේ දීය.

## ඉල්ලුම් පත්‍රය

1 අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

2 ලිපිනය :————.

3 උපන් දිනය සහ 1970.12.20 වැනි දිනට වයස :————.

(1) ජාතිය :————.
(ලාංකිකවූයේ ලියාපදිංචි වීමෙන්ද පරම්පරාවෙන්ද ? :—

(2) පරම්පරාවෙන් ලාංකිකයකු වී නම් මතු දක්වෙන අය උපන් ස්ථාන සඳහන් කරන්න :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ මුත්තා :————.

(ඈ) අයදුම්කරුගේ මී මුත්තා :————.

අයදුම්කරු ලංකාවේ උපන්කෙනෙකු වී නම් (අ) හැරුණ විට (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුය. අයදුම්කරු ලංකාවේ නූපන් අයෙක් නම් (අ) හැරුණ විට (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඈ) හෝ පිරවිය යුතුය.

4 අධ්‍යාපනික සුදුසුකම් :

(අ) ඔබ සමත්වී ඇත්තේ කිනම් පන්තියෙන් ද ? :————.
(භාෂා මාධ්‍ය සඳහන් කරන්න)

(ආ) ඔබට සිංහල දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා කියවන්නට සහ ලියන්නට පිළිවන්ද ? :————.

5 වෘත්තීය සුදුසුකම් :————.
(ආධුනික කාලයෙහි රක්ෂාවක් කිරීමට පටන්ගත් කාලය දක්වා වූ වෘත්තීය සුදුසුකම් සවිස්තර ලෙස සඳහන් කරන්න. සහතික පිටපත් ඇමිණිය යුතුය.)

6 මෝටර් රථ පැදවීම පිළිබඳ මොනයම් හෝ දැනීමක් තිබේද ? :———
ලොරි කාර් පැදවීමට සහ සයිකල් පැදීමටත් බලපත්‍රයක් ඔබ සතුව ඇත්ද ? :————.

7 වෙනත් විශේෂ සුදුසුකම් :————.

8 දැනට කරන රැකියාව :————.

9 ඔබ කිසියම් දිනක ආණ්ඩුව යටතේ සේවය කොට තිබේද ? එම් කාල පරිච්ඡෙදයන් සහ ඒ පිළිබඳ විස්තරද දෙපාර්තමේන්තුවේ සහ දරූ තනතුරුද එම දෙපාර්තමේන්තුවෙන් ඉවත්ව යාමට හේතුවූ කරුණු යනාදියද සඳහන් කරන්න :—

10 චරිත සහතික ලබාගත් තැනැත්තන් දෙදෙනාගේ නම් ලිපිනයන් සහ පදවි නාම :————.
(සහතික පිටපත් ඇමිණිය යුතුයි)

11 ලංකා පොලිස් සේවයේ රියදුරු හෝ කොස්තාපල් තනතුරක් සඳහා මීට පෙර ඉල්ලුම් කොට තිබේද ? එසේ නම් ඉන් ලැබුණු ප්‍රතිඵලය කුමක්ද ? හැකිනම් ඒ පිළිබඳ ලිපි යොමුව සඳහන් කරන්න :———.

12 ඔබ හෝ ඔබගේ කිසියම් ඥාතියෙකු යම්කිසි අපරාධයක් සම්බන්ධ යෙන් නඩුවකට පැටලී උසාවියකට කැඳවනු ලැබ නඩු පවරණු ලැබ හෝ දඬුවම් ලබා හෝ ඇද්ද ? :————.

ඉහත සඳහන් තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් ප්‍රකාශ කරමි. ඉහත සඳහන් යම්කිසි තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය (මා පත් කරනු ලැබුවහොත්) එකෙනෙහිම අවසන් කෙළහැකි බවත් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

ස්ථානය :————,

දිනය :————.

11–1051—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව

### (තාවකාලික) ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුරු

ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ II වැනි ශ්‍රේණියේ (තාවකාලික) ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුරු සඳහා පිරිමි අයදුම්කරුවන් ගෙන් ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

(i) මෙම තනතුරට අදාල ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේ ය.— රුපියල් 3,270 න් පණින් ගෙන රුපියල් 90 වේ වාර්ෂික වේතනාධික 21 ක් ලබා රුපියල් 5,160 ක් දක්වා වැඩිවන වාර්ෂික ඒකාබද්ධ වැටුපකි. රුපියල් 3,810 සහ 4,530 යන සීමාවලදී කාර්යක්ෂමතා කඩඉම් දෙකක් ද වෙයි.

(ii) මෙම තනතුර සඳහා ඉල්ලුම්පත්‍ර 1970 දෙසැම්බර් මස 10 දින දක්වා ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂගෙන් ලබාගත හැක. ඉල්ලුම් පත්‍ර අයදුම්කරුවන් විසින් තමාගේ නම සහ ලිපිනය ලියන ලද මුද්දර නොගැසූ 9″ × 4″ ප්‍රමාණයට නො අඩු ලියුම් කවරයක් එවිය යුතු අතර, එම ලිපි කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ " ග්‍රාම සංවර්ධන නිලධාරි තනතුර " යනුවෙන් සඳහන් කළ යුතුය. එක අයදුම්කරුවකුට එක ඉල්ලුම් පත්‍රයකට වඩා නිකුත් කරනු නොලැබේ.

(iii) සෑම ඉල්ලුම් පත්‍රයක් සමගම එම ඉල්ලුම් පත්‍රය පිරවිය යුතු ආකාරය පිළිබඳ විස්තරාත්මක උපදෙස් මාලාවක් එවනු ලබන අතර, ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීමට ප්‍රථම එම උපදෙස් මාලාව හොඳාකාර කියවා තේරුම් කර ගත යුතුය.

(iv) ඉල්ලුම් පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර 1970 දෙසැම්බර් මස 15 දිනට ප්‍රථම ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ, තැ. පෙ. 1,284, කොළඹ 7 ලිපිනයට ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. එම දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත් සහ නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොවන ඉල්ලුම්පත් සියල්ලම ප්‍රතික්ෂෙප කරනු ලැබේ. දැනටමත් රජයේ සේවයේ නියුක්ත ඉල්ලුම් කරුවන් ස්වකීය ඉල්ලුම් පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථම ලැබේනසේ එවිය යුතුය. ඉල්ලුම් පත් මගේ හෝ මගේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

2. **සුදුසුකම්.**—ඉල්ලුම් කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය :—

(අ) පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ආ) 1971.1.1 දිනට වයස ,අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

(ඇ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී, පහත සඳහන් උපලේඛනයේ විෂයයන් අතුරින් සතරකින්වත් යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථය ලබා තිබිය යුතු අතර, ඉන් එකක් භාෂාවද, අනික අංක ගණිතය හෝ ගණිතය හෝ වාණිජ ගණිතය විය යුතුය. සම්මාන සාමාර්ථ සතර දෙවරකට නොවැඩි වාර ගණනකදී ලබා තිබිය යුතුය.

හෝ

(ඇ) දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින්වත් සාමාර්ථය ලැබිය යුතු අතර, යටත් පිරිසෙයින් ඉන් සතරක්වත් පහත සඳහන් උපලේඛනයට ඇතුළත් විෂයයන්ගෙන් සම්මාන සාමාර්ථය ලැබූ විෂයයන් විය යුතුය. මෙම සම්මාන සාමාර්ථ වලින් එකක් භාෂාව සහ අනික අංක ගණිතය හෝ ගණිතය හෝ වාණිජ ගණිතය විය විය යුතුය.

**උපලේඛනය**

| | |
|---|---|
| භාෂාව (සිංහල/දෙමළ ඉංග්‍රීසි) | ප්‍රජාචාරය |
| ඉතිහාසය | අර්ථ ශාස්ත්‍රය |
| භූගෝල ශාස්ත්‍රය | අංක ගණිතය |
| ගණිතය | සත්ව විද්‍යාව |
| භෞතික විද්‍යාව | ජීව විද්‍යාව |
| රසායන විද්‍යාව | සාමාන්‍ය විද්‍යාව |
| උද්භිද විද්‍යාව | වාණිජ ගණිතය |

ඉහත සඳහන් සුදුසුකම් නොමැත්තෝ ඉල්ලුම් නොකළ යුතුය. ඉල්ලුම් කළහොත් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. තෝරා ගැනීම පදනම් වනුයේ පහත සඳහන් කරුනු මතය :—

(අ) යෝග්‍යතා විභාගය වන ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ දක්වන ලද කුසලතාවය සහ වෙනත් උසස් විභාගවලින් ලබා ඇති සාමාර්ථය.

(ආ) අයදුම් කරුවන් සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය.

ඉහත 2 වැනි ඡේදයේ අවශ්‍යතාවයන් සපුරා ඇත්තාවූද, අධ්‍යාපන සුදුසුකම් අනුව සෑහෙන ලකුණු සංඛ්‍යාවක් ලබාගත්තාවූ ද අයදුම් කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

4. කිසිම ලියකියවිල්ලක් හෝ ලියකියවිල්ලක පිටපත් හෝ අයදුම් පතට ඇමිණිය යුතු නොවේ. සම්මුඛ පරීක්ෂණයට කැඳවන අවස්ථාවේ නියම කළහොත් පමණක් ඒවා ඉදිරිපත් කළ යුතුය.

5. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි මෙම පත්වීම් වලට ද අදාලවනු ලැබේ.

6. කොයියම් ආකාරයකින්වත්, අයථා අනුග්‍රහයක් ලබාගැනීමට උත්සාහ කරතහොත් ඒ හේතුවෙන් අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

අයිවන් සමරවික්‍රම,
ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ.

ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1284,
කොළඹ 7.
1970 නොවැම්බර් මස 18 දින.

11–947—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## මඩකලපුව දිස්ත්‍රික්කයේ කොක්කඩ්ඩිචෝලයි කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ මන්මුනේ දකුණ හා එරුවිල් පෝරතිවු පත්තු කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

කොක්කඩ්ඩිචෝලයි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශයතුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොට ගෙන ගම්වාසීන්ගෙන් සැළකුම් ලබන, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම් කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කායඹාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කායඹාල, ග්‍රාම සේවක කායඹාල, පලාත් පාලන ආයතන කායඹාල, ග්‍රාමීය උසාවි, තැපැල් කායඹාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කායඹාලවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම්වල ඇතුලත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කායඹාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල සකස්විය යුතු අතර, ඒවා 1970 දෙසැම්බර් 30 වෙනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

වී. බාලසන්දිරන්,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් (අතිරේක)

1970 නොවැම්බර් මස 14 වෙනි දින,
මඩකලපුව,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කායඹාලයේදීය.

11–882—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## මොණරාගල කොට්ඨාශය

### ග්‍රාම සේවක සේවයට බඳවා ගැනීම

මොණරාගල දිස්ත්‍රික්කයේ ග්‍රාම සේවක සේවයේ තිබෙන ඇබෑර්තු පිරවීම සඳහා පහත 4 වැනි ඡේදයේ දක්වෙන සුදුසුකම් ඇති පිරිමි අපේක්ෂකයන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **ඇබෑර්තු.**—එක් එක් ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ තිබෙයයි ගණන් බලා ඇති ඇබෑර්තු ප්‍රමාණය මෙසේය :—

| ප්‍ර. ආ. නි. කොට්ඨාශය | | ඇබෑර්තු ගණන |
|---|---|---|
| වැල්ලවාය | ... | 2 |
| බිබිතැන්න පත්තුව | ... | 2 |
| වෙල්ලස්ස | ... | 3 |
| මඩුල්ල | ... | 1 |
| එකතුව | ... | 8 |

3. පත්වීම් ලැබීමට සමත්වන අපේක්ෂකයන් පහත 8 (iii) (ඒ) ඡේදයේ දක්වෙන පුහුණුවීම සම්පූර්ණ කළ පසු වර්ෂයකට රු. 3,000 ඒකාබද්ධ වැටුපෙන් පටන්ගෙන රු. 90 වාර්ෂික වැටුප් වැඩිවීම ලබා වර්ෂයකට රු. 5,160 දක්වා නැගෙන වැටුප් ක්‍රමයක් මත පත්කරණු ලැබේ. මෙම වැටුප් ක්‍රමයේ රු. 3,810 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ක්‍රියාත්මක වේ.

4. **සුදුසුකම්.**—(i) අපේක්ෂකයන් ඉතා හොඳ චරිතයකින් යුක්තවිය යුතුය.

(ii) අපේක්ෂකයන් ලාංකිකයන් විය යුතුය*

*(රාජ්‍ය සේවයේ පත්වීම් පිළිබඳ සියළුම කරුණු සඳහා ''ලාංකිකයා'' යන වචනය විග්‍රහ කොට ඇත්තේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ලංකාවේ පුරවැසියකු යනුවෙනි.)

(iii) ග්‍රාම සේවකයකුගේ රාජකාරි නිසියාකාර ඉටුකිරීම සඳහා අපෙක්ෂකයන් කායික වශයෙන් සුදුසු විය යුතුය.

(iv) අපේක්ෂකයන්ට—

(ඒ) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය යන විෂයයන්ගෙන් සාමාර්ථය ද සම්මාන සාමාර්ථ හතරක් ද සහිත ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය, හෝ

(බී) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය, හෝ වාණිජ ගණිතය, හෝ මූලික ගණිතය හෝ ශුද්ධ ගණිතය යන විෂයයන් දෙකෙන් සාමාර්ථය ද සම්මාන සාමාර්ථ හතරක් ද සහිතව විෂයයන් හයකින්, දෙකකට නොවැඩි වාර ගණනක දී ලබාගත් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකය, හෝ

(සී) විෂයයන් හතරක් සහිත අධ්‍යයන පොදු සහතික පත්‍රය (උසස් පෙළ) හෝ උපාධියක් වැනි උසස් සුදුසුකම්,

තිබිය යුතුය.

සටහන.—සිංහල කථා කරන ග්‍රාම සේවක කොට්ඨාශවල ග්‍රාම සේවක තනතුරු සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන් සිංහල භාෂාව ද දෙමළ කථා කරන ග්‍රාම සේවක කොට්ඨාශවල ග්‍රාම සේවක තනතුරු සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන් දෙමළ භාෂාව ද ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ සමත්වී සිටිය යුතුය.

(v) 1970 දෙසැම්බර් 20 දිනට අපේක්ෂකයන් වයස අවුරුදු 21 ට අඩු නොවියයුතු අතර වයස අවුරුදු 35 ට වැඩි නොවිය යුතුය. රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරණ අයට උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.

(vi) (ඒ) ඉල්ලුම් පත්‍ර භාරගැනීමේ අවසාන දිනයට පූර්වයෙහි වූ හය අවුරුද්ද තුළ අපේක්ෂකයන් තමන් පත්වීම් බලාපොරොත්තු වන ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය තුළ යටත් පිරිසෙයින් අවුරුදු 3ක කාලයක් නොකඩවා ස්ථිර ලෙස පදිංචිව සිටි/සිටින අය විය යුතුය. ග්‍රාම සේවක ගෙන් ලබාගත් පදිංචිය පිළිබඳ සහතිකයකින් මෙය ඔප්පු කළ යුතුය.

නැතහොත්

(බී) අපේක්ෂකයන් තමන් පත්වීම් බලාපොරොත්තු වන ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ උපන් අය විය යුතුය. මෙය ඔවුන්ගේ උප්පැන්න සහතික මාර්ගයෙන් ඔප්පු කළ යුතුය.

නැතහොත්

(සී) අපේක්ෂකයන් තමන් පත්වීම් බලාපොරොත්තු වන ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ නොකඩවා අවුරුදු පහකට නොඅඩු කාල යක් අධ්‍යාපනය ලැබූ අය විය යුතුය. මෙය ඔවුන් අධ්‍යාපනය ලැබූ පාඨශාලා වල ප්‍රධානාචාර්‍යවරුන්ගේ සහතික මගින් ඔප්පු කළ යුතුය.

තම මව්පියන් රජයේ හෝ සංස්ථාවල මාරුවීම් සහිත සේවයකට අයත් අයදුම් කරුවන්ට තම ස්ථිර පදිංචිය ලෙස මවගේ හෝ පියාගේ උපන් ස්ථානය තෝරාගැනීමට ඉඩ දෙනු ලැබේ.

5. **තේරීමේ ක්‍රමය.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය හෝ උසස් විභාග හෝ සඳහා අපේක්ෂක යන් ලබා ඇති ශ්‍රේණි උඩ පහත 6 වැනි ඡේදයේ දැක්වෙන ප්‍රමාණ කිරීමේ ක්‍රමය අනුව ලබන ලකුණු සහ පහත 7 වැනි ඡේදයේ දැක්වෙන සම්මුඛ පරීක්ෂණයේදී ලබන ලකුණු සළකා පත්වීම් දීම සඳහා අපේක්ෂකයන් තෝරාගනු ලැබේ.

6. **ප්‍රමාණ කිරීමේ ක්‍රමය.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රයේදී හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහතික පත්‍රයේදී අපේක්ෂකයන් ලබා ඇති ශ්‍රේණි සඳහා පහත සඳහන් පරිදි ලකුණු දෙනු ලැබේ :—

| | | | |
|---|---|---|---|
| ඩී — විශිෂ්ඨ සාමාර්ථය | ... | ලකුණු | 75 |
| සී — සම්මාන සාමාර්ථය | ... | ,, | 50 |
| එස් — සාමාන්‍ය සාමාර්ථය | ... | ,, | 40 |

විෂයයන් 6 කට වැඩි ගණනකට පෙනී සිට ඒවායින් සමත්වූ අයදුම් කරුවකු විසින් විෂයයන් 6 කට පමණක් පෙනී සිට ඒවායින් සමත්වූ අයදුම්කරුවකුට වඩා වැඩි ලකුණු ලබා වැඩි වාසියක් අත්පත්කර ගැනීමේ ඉඩකඩ වැලැක්වීම පිණිස මුළු ලකුණු ප්‍රමාණය ගණන් බැලීම සඳහා සැළකිල්ලට භාජනය කරන්නේ ඉල්ලුම් පත්‍රයේ සඳහන් කෙරෙන විෂයයන් 6 පමණි. අ.පො.ස. (උසස් පොළ) විභාගයේදී විෂයයන් හතරක් සමත්වී ඇති අපේක්ෂකයෙක් අමතර ලකුණු 30 ක් ලබාගැනීමට සුදුසුස්සකු වෙයි. කෙසේ වෙතත් අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී විෂයයන් හතරකට අඩුවෙන් සමත්වී ඇති අයට සහ එම විභාගයේදී සම්මාන සාමාර්ථය සහ විශිෂ්ඨ සාමාර්ථය ලබා ඇති අයට ඒ සඳහා අමතර ලකුණු ලැබෙන්නේ නැත. ශාස්ත්‍රවේදී හෝ ඊට උසස් උපාධියක් ඇති අයෙකුට අ.පො.ස. (උසස් පෙළ) සඳහා ලැබෙන ලකුණු 30 ද ඇතුළුව අමතර ලකුණු 70ක් ලැබේ. උපාධියක් ඇති අපේක්ෂකයන්ට අ.පො.ස. (උසස් පෙළ) සඳහා වෙනම ලකුණු නොලැබේ. එකකට වැඩියෙන් ඇති උපාධි හෝ මෙහි සඳහන් කොට නොමැති වෙනත් අධ්‍යාපනික සුදුසුකම් සඳහා හෝ ලකුණු ලැබෙන්නේ නැත. අපේක්ෂකයන් සිය ඉල්ලුම් පත්‍රවල ඉහත සඳහන් ලකුණු ප්‍රමාණ කිරීමේ ක්‍රමය අනුව තමන්ම නියමිත ලකුණු ප්‍රමාණය සඳහන් කළ යුතුය.

7. **සම්මුඛ පරීක්ෂණය.**—ඉහත සඳහන් ක්‍රමය අනුව ප්‍රමාණ කිරීමෙන් එක් එක් අපේක්ෂකයාට ලැබෙන මුළු ලකුණු ගණන දැනගත් පසු මෙම කාර්‍යාලයේදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂකණයක් සඳහා අපේක්ෂකයන් සීමාසහිත ප්‍රමාණයක් කැඳවනු ඇත. එම පරීක්ෂණය පැවැත්වෙන දින ඊට කැඳවීමට සුදුසුකම් ලබන අපේක්ෂකයනට පුද්ගලිකව දැනුම් දෙනු ලැබේ. මෙහි පහත සඳහන් 10 (iii) දරණ ඡේදයේ දැක්වෙන සහතිකවල මුල් සහතික මෙම සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කළ යුතුවේ. මෙම සම්මුඛ පරීක්ෂණයේ පරමාර්ථය වනුයේ ග්‍රාම සේවක සේවයට අපේක්ෂකයා සුදුසු දැයි විමසා බැලීමයි. ගම හා එහි ශුභ සාධනය සම්බන්ධයෙන් ඔහුගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙහිදී ප්‍රශ්න අසනු ලැබේ.

8. **සේවා කොන්දේසි.**—(i) රජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදය ආරම්භයේදී දක්වා ඇති, රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්වීම් කිරීමේ දී බලපාන පොදු කොන්දේසි වලට අපේක්ෂකයන්ගේ අවධානය යොමු කරනු ලැබේ.

(ii) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට දයක මුදල් ගෙවිය යුතුය.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයා රාජ්‍ය භාෂා පනතේ පරමාර්ථයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයකු නම්,

(ඒ) ඔහුගේ ආධුනික සේවා කාලය අවුරුදු තුනක් වේ.

(බී) ඔහු 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධි විධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින්නා වූත් මතුවට පනවනු ලැබිය හැක්කාවූත් යම් යම් නීති රීතිවලට හා ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසි පිළිගත යුතුය.

(සී) ඔහුගේ ආධුනික සේවා කාලය තුලදී රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමට සෑහෙන දැනුමක් ලබාගත යුතුය.

(ඩී) ආධුනික සේවා කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර, පත්වීමේ දිනයේ සිට අවුරුද්දක්, අවුරුදු දෙකක් සහ අවුරුදු තුනක් ඇතුළත පිළිවෙලින් I වැනි, II වැනි සහ III වැනි ශ්‍රේණිවල සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම උඩ රඳා පවතී. (නොඑසේ නම්, අදාලවන අවස්ථාවල I වැනි හා II වැනි ශ්‍රේණිවල පරීක්ෂණවලින් පිළිවෙලින් අවුරුද්දක් සහ අවුරුදු දෙකක් ඇතුළත සමත් වීම උඩ රඳා පවතී.) නියමිත කාලසීමා තුළදී නියමිත පරීක්ෂණවලින් සමත් නොවුව හොත් එය වැටුප් වැඩිවීම අත්හිටුවීමට හේතු වේ. නියමිත කාලයෙන් පසු තවත් හය මාසයක් ගතවන්නට පෙර පරීක්ෂණ වලින් සමත් නොවුවහොත් අත්හිටවූ වැටුප් වැඩිවීම නතර කිරීමකට පරිවර්තනය කොට පරීක්ෂණය සමත් වන තෙක් හෝ මෙහි පහත (iii) (ඊ) හි ඇති විධිවිධාන අදල වන කාලය තෙක් හෝ එම නතර කිරීම ක්‍රියාත්මක වනු ඇත.

(ඊ) ආධුනික සේවා කාලය අවසාන වන විට නියමිත සිංහල ප්‍රවීනතාව ලබා නොගත හොත් අංක 120 සහ 121 දරණ පාලන රෙගුලාසි වල නියමයන් අදල වනු ඇත.

සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලබන්නන්ට ඉහත (සී), (ඩී) සහ (ඊ) යන කොන්දේසි අදල නොවේ.

(එෆ්) ග්‍රාම සේවකවරුන් ලෙස පත්කරණු ලබන අපේක්ෂකයෝ පරිපාලන දිසත්‍රික්කය තුළ් කුමන ග්‍රාම සේවක කොට්ඨාශයක හෝ සේවය කිරීමට බැඳී සිටිති.

(ජී) තම තනතුරට අයත් රාජකාරි කටයුතු පිළිබඳ පුහුණුවක් පත්වීම් ලබන සියළුම අපේක්ෂකයන් විසින් ලැබිය යුතුය.

ආධුනික ග්‍රාම සේවකයන් වශයෙන් පත්කරණු ලබන්නේ සතුටුදයක ලෙස පුහුණුවීමක් ලබා ඇති බවටත් ආධුනික ග්‍රාම සේවකයන් වශයෙන් පත්කරණු ලැබීමට සෑම අතින්ම සුදුසුකම් තිබෙන බවටත් පරිපාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත විසින් සහතික කළොත් පමණි.

බඳවා ගැනීමේ ආරම්භයේදීම අපේක්ෂකයන් විසින් ලැබිය යුතු මෙම පුහුණුව මාස තුනක කාලයකට වැඩි නොවනු ඇත. එම කාලය තුළදී පුහුණුවන්නන්ට මසකට රු. 50 ක දීමනාවක් ගෙවනු ලැබේ. පුහුණුවීමේ කාලයතුලදී අපේක්ෂකයෝ නිවාඩු වරප්‍රසාද වලට හිමි නොවෙති.

(එච්) පුහුණුව අවසානයේදී ග්‍රාම සේවකයකු අවුරුදු තුනක කාලයක් සේවය කරන තුරු හා ඔහුගේ පත්වීම ස්ථිර කිරීම මැනවයි ආණ්ඩුවේ ඒජන්ත සෑහීමකට පත්වන තුරු ඔහුගේ පත්වීම ස්ථිර කරනු නොලැබේ.

9. **ඉල්ලුම් පත්‍ර.**—(i) මෙම කච්චේරියෙන් හෝ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්‍යාල වලින් ඉල්ලුම් පත්‍ර පෝර්ම ලබාගත හැක. ඉහත 4 (iv) ඡේදයේ දැක්වෙන සුදුසුකම් ලැබීමේ විභාගය සමත් භාෂාව සහ සිංහල යන මාධ්‍ය දෙකෙන් තමන් කැමති මාධ්‍යයකින් ඉල්ලුම් පත්‍රය තමන්ගේ අත් අකුරින්ම අපේක්ෂකයන් විසින් පිරවිය යුතුය.

නියමිත ඉල්ලුම් පත්‍ර පෝර්මය කිසියම් අයුරකින් වෙනස් කිරීම තහනම්ය. නියමිත පෝර්මයේ නොඑවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරණු ලැබේ.

(ii) 1970 දෙසැම්බර් 20 දිනට පෙර මොනරාගල කච්චේරියේ ආණ්ඩුවේ ඒජන්ත තැනට ලැබෙන සේ ඉල්ලුම්පත්‍ර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. රාජ්‍ය සේවයේ නියුක්ත අපේක්ෂකයන් ගේ ඉල්ලුම් පත්‍ර ද නියමිත දිනට පෙර ආණ්ඩුවේ ඒජන්ත තැනට ලැබෙනසේ කෙළින්ම එවිය යුතුය. ඉල්ලුම් පත්‍රයේ පිටපතක් තම දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන්ද එවිය යුතුය.

(iii) නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරණු ලැබේ. ඉල්ලුම්පත්‍ර ආණ්ඩුවේ ඒජන්ත හෝ කච්චේරියේ වෙනත් නිලධාරියකුගේ පුද්ගලික නමට නොඑවිය යුතුය.

10. **සුදුසුකම් පිළිබඳ ලියකියවිලි.**—(i) ඉල්ලුම් පත්‍රය සමග කිසිම ලියකියල්ලක් නොඑවිය යුතුය. එහෙත් ඉල්ලුම් පත්‍රයේ ඒ ඒ කොටුවල ඉල්ලා ඇති අවශ්‍ය විස්තර සඳහන් කළ යුතුය. මෙම සෑම අතින් සම්පූර්ණ නොමැති ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

(ii) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට තේරෙන අපේක්ෂකයන් විසින් තමන්ගේ සුදුසුකම් සනාථ කිරීම සඳහා ලියකියවිලි ඉදිරිපත් කළ යුතුවේ. එම ලියකියවිලි ඉදිරිපත් කරණ ලෙස එම අපේක්ෂකයන්ට දැනුම් දුන්නොත් එවිට ඒවා ඉදිරිපත් කිරීමට ඔව්හු සූදානමින් සිටිය යුත්තාහ.

(iii) පහත සඳහන් ලියකියවිලි අවශ්‍ය වනු ඇත :—

(ඒ) චරිත සහතිකයක්.

**සටහන.**—කිසියම් අපේක්ෂකයකු දැනුදු රජයේ හෝ ආධාර ලබන පාඨශාලාවක ඉගෙනුම ලබන්නෙහි නම් හෝ පාඨශාලාවෙන් අස්වූයේ මෑතකදී නම් හෝ ඔහු තම චරිතය පිළිබඳ සහතිකය ලබාගත යුත්තේ එම පාඨශාලාවේ ප්‍රධානාචාර්‍යවරයා ගෙනි. නොඑසේ නම්, එය සමාදාන විනිශ්චය කරුවකු, අධිනීතිඥවරයකු, නීතිඥවරයකු හෝ නොතාරිස් වරයකු, ප්‍රාදේශීය ආදායම් නිලධාරියකු හෝ වර්ෂයකට ඒකාබද්ධ වැටුප රු. 4,800 හෝ ඊට වැඩි ස්ථිර රජයේ නිලධාරියකු යන අයගෙන් හෝ කිසියම් නම් දරණ එමෙන්ම අපේක්ෂකයා පිළිබඳව ලෙහෙසියෙන් විමසීම් කර බැලීමට හැකි තැනැත්තෙකු ගෙන් ලබාගෙන ඉදිරිපත් කළ හැක. නිකුත් කරණ තැනැත්තාගේ නම, තනතුර සහ ලිපිනය චරිත සහතිකයේ පැහැදිලිව සඳහන්වී තිබිය යුතු වේ.

දැනටමත් රජයේ සේවයේ නියුක්තව සිටින අපේක්ෂකයන් චරිතය පිළිබඳ සහතිකයක් ඉදිරිපත් කිරීම අනවශ්‍යය. එහෙත් ඔවුන් විසින්, තමන්ගේ සේවය සහ හැසිරීම සතුටුදායක බවටත් තමන් පත්කිරීම සඳහා තෝරාගනු ලැබුවොත් ඒ සඳහා මුදා හැරීමට හැකි බවටත් තමන් සේවය කරණ දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

(බී) අපේක්ෂකයාගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනේ සහතිකයක් හෝ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් වයස පිළිබඳව නිකුත් කරණු ලැබ ඇති විශේෂ සහතිකයත් (උප්පැන්නය ලියාපදිංචි කර නොමැති අපේක්ෂකයන් වෙනුවෙනි). අනුමාන වයස පිළිබඳව සහතිකයක් පමණක් ඉදිරිපත් කළ හැකි කිසියම් අපේක්ෂකයකුගේ උපන් දිනය එම සහතිකයේ දක්වා ඇති උපන් වර්ෂයේ ජූලි මස 1 වැනි දින ලෙස සලකනු ලැබේ.

**සටහන.**—(i) පාසැල් හෝ අධ්‍යාපනික කටයුතු සඳහා නිකුත් කර ඇති විශේෂ උප්පැන්න සහතිකයක් හෝ උප්පැන්න ලියාපදිංචිකිරීමේ සටහනින් උපුටාගත් සහතික කළ උධෘතයක් භාර ගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතික වෙනුවට ආදේශක වශයෙන් දිවුරුම් පෙත්සම් හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.

(iii) උප්පැන්න සහතිකයේ දැක්වෙන නම/නම් අපේක්ෂකයා සාමාන්‍යයෙන් භාවිත කරන නමින්/නම්වලින් වෙනස් වේ නම්, අපේක්ෂකයාට අදාළ වන පරිදි 27 හෝ 28 වගන්තිය (110 පරිච්ඡෙදය) යටතේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහන සංශෝධනය කරවා ගැනීම පිණිස වහාම ක්‍රියා කළ යුතුය.

රජයේ ස්ථිර තනතුරු උසුලන, අංක 394 සහ 1957 අගෝස්තු 18 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව තම නම් වෙනස් කර ඇති අපේක්ෂකයන් උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනේ ඇති තමන්ගේ නම් සංශෝධනය කිරීම පිණිස ක්‍රියා කිරීමට අවශ්‍ය නැත.

(සී) ලාංකික පුරවැසියකු වශයෙන් ලියාපදිංචි කළ සහතිකය හෝ පරම්පරාවෙන් පුරවැසියකු බව පිළිගත් බවට නිකුත් කර ඇති මුල් රාජකාරි ලිපිය (අදාල වූ විට),

(ඩී) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකය හෝ සහතිකය නිකුත් කර නොමැති විටකදී, වෙනත් අධ්‍යාපනික ලියකියවිලි, උදා : ලංකා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) පෞද්ගලික අයදුම්කරුවන් වෙත නිකුත් කර ඇති ප්‍රතිඵල සටහන හෝ අපේක්ෂකයාගේ පාසැල් ප්‍රධානියා නිකුත් කළ මුල් ලිපි ය.

(ඊ) ඉහත 4 (vi) යටතේ සුදුසුකම් ලබා ඇති බවට සාක්ෂි වශයෙන් සහතික.

(iv) ඉල්ලුම් පත්‍ර එවන අවස්ථාව වන විට අවශ්‍ය සියළුම ලියකියවිලි සූදානමින් තබාගන්නා ලෙස අපේක්ෂකයන් වෙත උපදෙස් දෙනු ලැබේ. කිසියම් අපේක්ෂකයෙකු සම්මුඛ පරීක්ෂණයේ දී අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ඔහුගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

11\. **අසත්‍ය විස්තර සැපයීමට දඬුවම්.**—මෙම නිවේදනයේ දැක්වෙන රෙගුලාසිවලට අනුව අපේක්ෂකයකු නුසුදුසු යයි ඔප්පු වුවහොත් ඔහු මෙම තනතුරට තෝරා ගැනීමට පෙර හෝ තෝරාගත් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ ඉල්ලීම අවලංගු කිරීමට භාජනය විය හැකිය.

අපේක්ෂකයන් විසින් සපයා ඇති කිසියම් තොරතුරක් ඔහු දන්නා පරිදි අසත්‍ය බව ඔප්පු වුවහොත් හෝ කිසියම් වැදගත් කරුණක් හිතාමතාම යටපත් කළ හොත් හෝ සේවයේ යෙදී සිටින කාලය තුළ ඕනෑම අවස්ථාවක දී ඔහු ඉල්ලුම් කිරීමට නුසුදුස්සකුව සිටි බව ඔප්පු වුවහොත් වහාම සේවයෙන් පහකිරීමට හෝ සේවය නතර කිරීමට ඉඩ ඇත.

මෙම නිවේදනයෙහි දක්වා ඇති නියමයන් දැඩි ලෙස නොපිළිපදින අපේක්ෂකයන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

12\. **වෛද්‍ය පරීක්ෂණය.**—පත්කරනු ලැබීම සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන් තමන් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා ශාරීරිකව සුදුසු බවට සහතික කෙරෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වන අපේක්ෂකයන් පුහුණුව සඳහා තෝරාගනු නොලැබේ.

13\. මෙම රෙගුලාසිවලට ඇතුළත් නොවන ඕනෑම කාරණයක් පිළිබඳව තීරණයක් ගැනීම ආණ්ඩුවේ ඒජන්ත වරයාගේ අභිමතය පරිදි කෙරෙනු ඇත.

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
මොණරාගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970 නොවැම්බර් 14 වැනි දින,
මොනරාගල කච්චේරියේ දීය.

11–889—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## ග්‍රාම සේවක සේවයට බඳවා ගැනීම—අනුරාධපුර දිස්ත්‍රික්කය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාම සේවක සේවයේ තිබෙන ඇබෑර්තු පිරවීම සඳහා පහත 4 වැනි ඡෙදයේ දැක්වෙන සුදුසුකම් ඇති පිරිමි අපේක්ෂකයන් ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2\. **ඇබෑර්තු.**—එක් එක් ප්‍රාදේශීය ආදායම් නිළධාරි කොට්ඨාශයේ තිබෙයයි ගණන් බලා ඇති ඇබෑර්තු ප්‍රමාණය මෙසේය :—

| | ප්‍ර. ආ. නි. කොට්ඨාශය | | ඇබෑර්තු ගණන |
|---|---|---|---|
| 1. | දකුණු නුවරගම් පළාත | ... | 1 |
| 2. | නැගෙනහිර නුවරගම් පළාත | ... | 2 |
| 3. | උතුරු නුවරගම් පළාත | ... | 2 |
| 4. | උතුරු හුරුළු පළාත | ... | 2 |
| 5. | මධ්‍යම හුරුළු පළාත | ... | 1 |
| 6. | උතුරු කළාගම් පළාත | ... | 1 |

3\. පත්වීම් ලැබීමට සමත්වන අපේක්ෂකයන් පහත 8(iii) (ජී) ඡෙදයේ දැක්වෙන පුහුණුවීම සම්පූර්ණ කළ පසු වර්ෂයකට රු. 3,000 ඒකාබද්ධ වැටුපෙන් පටන්ගෙන රු. 90 වාර්ෂික වැටුප් වැඩිවීම ලබා වර්ෂයකට රු. 5,160 දක්වා නැගෙන වැටුප් ක්‍රමයක් මත පත්කරණු ලැබේ. මෙම වැටුප් ක්‍රමයේ රු. 3,810 ට පෙර කාර්‍යක්ෂමතා කඩඉමක් ක්‍රියාත්මක වේ.

4\. **සුදුසුකම්.**—(i) අපේක්ෂකයන් ඉතා හොඳ චරිතයකින් යුක්ත විය යුතුය.

(ii) අපේක්ෂකයන් ලාංකිකයන් විය යුතුය.*

*රාජ්‍ය සේවයේ පත්වීම් පිළිබඳ සියළුම කරුණු සඳහා " ලාංකිකයා " යන වචනය විග්‍රහ කොට ඇත්තේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ලංකාවේ පුරවැසියකු යනුවෙනි.

(iii) ග්‍රාම සේවකයකුගේ රාජකාරි නිසියාකාර ඉටුකිරීම සඳහා අපේක්ෂකයන් කායික වශයෙන් සුදුසු විය යුතුය.

(iv) අපේක්ෂකයන්ට—

(ඒ) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය යන විෂයයන්ගෙන් සාමාර්ථය ද සම්මාන සාමාර්ථ හතරක් ද සහිත ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය ; හෝ

(බී) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය, හෝ වාණිජ ගණිතය, හෝ මූලික ගණිතය හෝ ශුද්ධ ගණිතය යන විෂයයන් දෙකෙන් සාමාර්ථය ද සම්මාන සාමාර්ථ හතරක් ද සහිතව විෂයයන් හයකින් දෙකකට නොවැඩි වාර ගණනක දී ලබාගත් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකය ; හෝ

(සී) විෂයයන් හතරක් සහිත අධ්‍යයන පොදු සහතික පත්‍රය (උසස් පෙළ) හෝ උපාධියක් වැනි උසස් සුදුසුකම් තිබිය යුතුය.

**සටහන.**—සිංහල කථා කරන ග්‍රාම සේවක කොට්ඨාශවල ග්‍රාම සේවක තනතුරු සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන් සිංහල භාෂාව ද දෙමළ කථා කරන ග්‍රාම සේවක කොට්ඨාශවල ග්‍රාම සේවක තනතුරු සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන් දෙමළ භාෂාව ද ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ සමත්වී සිටිය යුතුය.

(v) 1970.12.28 දිනට අපේක්ෂකයන් වයස අවුරුදු 21 ට අඩු නොවියයුතු අතර වයස අවුරුදු 35 ට වැඩි නොවිය යුතුය. රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරණ අයට උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.

(vi) (ඒ) ඉල්ලුම් පත්‍ර භාරගැනීමේ අවසාන දිනයට පූර්වයෙහිවූ හය අවුරුද්ද තුළ අපේක්ෂකයින් තමන් පත්වීම් බලාපොරොත්තු වන ප්‍රාදේශීය ආදායම් නිළධාරි කොට්ඨාශය තුළ යටත් පිරිසෙයින් අවුරුදු 3 ක කාලයක්

නොකඩවා ස්ථිර ලෙස පදිංචිව සිටි/සිටින අය විය යුතුය. ග්‍රාම සේවක ගෙන් ලබාගත් පදිංචිය පිළිබඳ සහතිකයකින් මෙය ඔප්පු කළ යුතුය.

නැතහොත්

(බී) අපේක්ෂකයන් තමන් පත්වීම් බලාපොරොත්තු වන ප්‍රාදේශීය ආදයම් නිළධාරි කොට්ඨාශයේ උපන් අය විය යුතුය. මෙය ඔවුන්ගේ උප්පැන්න සහතික මාර්ගයෙන් ඔප්පු කළ යුතුය.

නැතහොත්

(සී) අපේක්ෂකයන් තමන් පත්වීම් බලාපොරොත්තු වන ප්‍රාදේශීය ආදයම් නිළධාරි කොට්ඨාශයේ නොකඩවා අවුරුදු පහකට නොඅඩු කාළයක් අධ්‍යාපනය ලැබූ අය විය යුතුය. මෙය ඔවුන් අධ්‍යාපනය ලැබූ පාඨශාලාවල ප්‍රධානාචාර්යවරුන්ගේ සහතික මගින් ඔප්පු කළ යුතුය. තම මව්පියන් රජයේ හෝ සංස්ථාවල මාරුවීම් සහිත සේවයකට අයත් අයදුම්කරුවන්ට තම ස්ථිර පදිංචිය ලෙස මවගේ හෝ පියාගේ උපන් ස්ථානය තෝරාගැනීමට ඉඩ දෙනු ලැබේ.

5. **තේරීමේ ක්‍රමය.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය හෝ උසස් විභාග හෝ සඳහා අපේක්ෂක යන් ලබා ඇති ශ්‍රෙණි උඩ පහත 6 වැනි ඡෙදයේ දක්වෙන ප්‍රමාණ කිරීමේ ක්‍රමය අනුව ලබන ලකුණු සහ පහත 7 වැනි ඡෙදයේ දක්වෙන සම්මුඛ පරීක්ෂණයේදී ලබන ලකුණු සළකා පත්වීම් දීම සඳහා අපේක්ෂකයන් තෝරාගනු ලැබේ.

6. **ප්‍රමාණ කිරීමේ ක්‍රමය.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රයේදී හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහතික පත්‍රයේදී අපේක්ෂකයන් ලබා ඇති ශ්‍රෙණි සඳහා පහත සඳහන් පරිදි ලකුණු දෙනු ලැබේ :—

| | | | | |
|---|---|---|---|---|
| ඩී | — | විශිෂ්ඨ සාමාර්ථය | — | ලකුණු 75 |
| සී | — | සම්මාන සාමාර්ථය | — | ලකුණු 50 |
| එස් | — | සාමාන්‍ය සාමාර්ථය | — | ලකුණු 40 |

විෂයයන් 6 කට වැඩි ගණනකට පෙනී සිට ඒවායින් සමත්වූ අයදුම්කරුවකු විසින් විෂයයන් 6 කට පමණක් පෙනී සිට ඒවායින් සමත්වූ අයදුම්කරුවකුට වඩා වැඩි ලකුණු ලබා වැඩි වාසියක් අත්පත්කර ගැනීමේ ඉඩකඩ වැලැක්වීම පිණිස මුළු ලකුණු ප්‍රමාණය ගණන් බැලීම සඳහා සැළකිල්ලට භාජනය කරන්නේ ඉල්ලුම් පත්‍රයේ සඳහන් කෙරෙන විෂයයන් 6 පමණි. අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී විෂයයන් හතරක් සමත්වී ඇති අපේක්ෂකයෙක් අමතර ලකුණු 30 ක් ලබාගැනීමට සුදුස්සකු වෙයි. කෙසේ වෙතත් අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී විෂයයන් හතරකට අඩුවෙන් සමත්වී ඇති අයට සහ එම විභාගයේදී සම්මාන සාමාර්ථය සහ විශිෂ්ඨ සාමාර්ථය ලබා ඇති අයට ඒ සඳහා අමතර ලකුණු ලැබෙන්නේ නැත. ශාස්ත්‍රවේදී හෝ ඊට උසස් උපාධියක් ඇති අයෙකුට අ.පො.ස. (උසස් පෙළ) සඳහා ලැබෙන ලකුණු 30 ද ඇතුළුව අමතර ලකුණු 70 ක් ලැබේ. උපාධියක් ඇති අපේක්ෂකයන්ට අ.පො.ස. (උසස් පෙළ) සඳහා වෙනම ලකුණු නොලැබේ. එකකට වැඩියෙන් ඇති උපාධි හෝ මෙහි සඳහන් කොට නොමැති වෙනත් අධ්‍යාපනික සුදුසුකම් සඳහා හෝ ලකුණු ලැබෙන්නේ නැත. අපේක්ෂකයන් සිය ඉල්ලුම් පත්‍රවල ඉහත සඳහන් ලකුණු ප්‍රමාණ කිරීමේ ක්‍රමය අනුව තමන්ම නියමිත ලකුණු ප්‍රමාණය සඳහන් කළ යුතුය.

7. **සම්මුඛ පරීක්ෂණය.**—ඉහත සඳහන් ක්‍රමය අනුව ප්‍රමාණ කිරීමෙන් එක් එක් අපේක්ෂකයාට ලැබෙන මුළු ලකුණු ගණන දැනගත් පසු මෙම කාර්යාලයේදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් සඳහා අපේක්ෂකයන් සීමාසහිත ප්‍රමාණයක් කැඳවනු ඇත. එම පරීක්ෂණය පැවැත්වෙන දිනය ඊට කැඳවීමට සුදුසුකම් ලබන අපේක්ෂකයනට පුද්ගලිකව දැනුම් දෙනු ලැබේ. මෙහි පහත සඳහන් 10(iii) දරණ ඡෙදයේ දක්වෙන සහතික වල මුල් සහතික මෙම සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කළ යුතුවේ. මෙම සම්මුඛ පරීක්ෂණයේ පරමාර්ථය වනුයේ ග්‍රාම සේවක සේවයට අපේක්ෂකයා සුදුසු දැයි විමසා බැලීමයි. ගම හා එහි ශුභ සාධනය සම්බන්ධයෙන් ඔහුගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙහිදී ප්‍රශ්ණ අසනු ලැබේ.

8. **සේවා කොන්දේසි.**—(i) රජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡෙදය ආරම්භයේදී දක්වා ඇති, රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්වීම් කිරීමේදී බලපාන පොදු කොන්දේසි වලට අපේක්ෂකයන්ගේ අවධානය යොමු කරනු ලැබේ.

(ii) මෙම තනතුරු ස්ථිරය ; විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දයක මුදල් ගෙවිය යුතුය.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයා රාජ්‍ය භාෂා පනතේ පරමාර්ථයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයකු නම්—

(ඒ) ඔහුගේ ආධුනික සේවා කාළය අවුරුදු තුනක් වේ.

(බී) ඔහු 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධි විධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දනට පවතින්නා වූත් මතුවට පනවනු ලැබිය හැක්කාවූත් යම් යම් නීති රීතිවලට හා ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසි පිළිගත යුතුය.

(සී) ඔහුගේ ආධුනික සේවා කාලය තුලදී රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමට සෑහෙන දැනුමක් ලබාගත යුතුය.

(ඩී) ආධුනික සේවා කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර, පත්වීමේ දිනයේ සිට අවුරුද්දක්, අවුරුදු දෙකක් සහ අවුරුදු තුනක් ඇතුළත පිළිවෙලින් I වැනි, II වැනි සහ III වැනි ශ්‍රෙණිවල සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම උඩ රඳා පවතී. (නොඑසේ නම්, අදලවන අවස්ථාවල I වැනි හා II වැනි ශ්‍රෙණිවල පරීක්ෂණවලින් පිළිවෙලින් අවුරුද්දක් සහ අවුරුදු දෙකක් ඇතුළත සමත්වීම උඩ රඳා පවතී). නියමිත කාළසීමා තුළදී නියමිත පරීක්ෂණවලින් සමත් නොවුවහොත් එය වැටුප් වැඩිවීම අත්හිටුවීමට හේතු වේ. නියමිත කාලයෙන් පසු තවත් හය මාසයක් ගතවන්නට පෙර පරීක්ෂණවලින් සමත් නොවුවහොත් අත්හිටවූ වැටුප් වැඩිවීම නතර කිරීමකට පරිවර්තනය කොට පරීක්ෂණය සමත් වන තෙක් හෝ මෙහි පහත (iii) (ඊ) හි ඇති විධිවිධාන අදල වන කාලය තෙක් හෝ එම නතර කිරීම ක්‍රියාත්මක වනු ඇත.

(ඊ) ආධුනික සේවා කාළය අවසාන වන විට නියමිත සිංහල ප්‍රවීනතාව ලබානොගත හොත් අංක 120 සහ 121 දරණ පාලන රෙගුලාසි වල නියමයන් අදල වනු ඇත.

සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලබන්නන්ට ඉහත (සී), (ඩී) සහ (ඊ) යන කොන්දේසි අදල නොවේ.

(එෆ්) ග්‍රාම සේවකවරුන් ලෙස පත්කරනු ලබන අපේක්ෂකයෝ පරිපාලන දිස්ත්‍රික්කය තුළ කුමන ග්‍රාම සේවක කොට්ඨාශයක හෝ සේවය කිරීමට බැඳී සිටිති.

(ජී) තම තනතුරට අයත් රාජකාරි කටයුතු පිළිබඳ පුහුණුවක් පත්වීම් ලබන සියළුම අපේක්ෂකයන් විසින් ලැබිය යුතුය.

ආධුනික ග්‍රාම සේවකයන් වශයෙන් පත්කරණු ලබන්නේ සතුටුදයක ලෙස පුහුණුවීමක් ලබා ඇති බවටත් ආධුනික ග්‍රාම සේවකයන් වශයෙන් පත්කරනු ලැබීමට සෑම අතින්ම සුදුසුකම් තිබෙන බවටත් පරිපාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත විසින් සහතික කළොත් පමණි.

බඳවා ගැනීමේ ආරම්භයේදීම අපේක්ෂකයන් විසින් ලැබිය යුතු මෙම පුහුණුව මාස තුනක කාලයකට වැඩි නොවනු ඇත. එම කාලය තුලදී පුහුණුවන්නන්ට මසකට රු. 50 ක දීමනාවක් ගෙවනු ලැබේ. පුහුණුවීමේ කාලය තුලදී අපේක්ෂකයෝ නිවාඩු වරප්‍රසාද වලට හිමි නොවෙති.

(එච්) පුහුණුව අවසානයේදී ග්‍රාම සේවකයකු අවුරුදු තුනක කාලයක් සේවය කරන තුරු හා ඔහුගේ පත්වීම ස්ථිර කිරීම මැනවයි ආණ්ඩුවේ ඒජන්ත සෑහීමකට පත්වන තුරු ඔහුගේ පත්වීම ස්ථිර කරනු නොලැබේ.

9. **ඉල්ලුම් පත්‍ර.**—(i) මෙම කච්චේරියෙන් හෝ ප්‍රාදේශීය ආදයම් නිළධාරි කාර්යාල වලින් ඉල්ලුම් පත්‍ර පෝර්ම ලබාගත හැක. ඉහත 4(iv) ඡෙදයේ දක්වෙන සුදුසුකම් ලැබීමේ විභාගය සමත් භාෂාව සහ සිංහල යන මාධ්‍ය දෙකෙන් තමන් කැමති මාධ්‍යයකින් ඉල්ලුම් පත්‍රය තමන්ගේ අත් අකුරින්ම අපේක්ෂකයන් විසින් පිරවිය යුතුය.

නියමිත ඉල්ලුම් පත්‍ර පෝර්මය කිසියම් අයුරකින් වෙනස් කිරීම තහනම්ය. නියමිත පෝර්මයේ නොඑවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(ii) 1970.12.28 දිනට පෙර අනුරාධපුරය කච්චේරියේ ආණ්ඩුවේ ඒජන්ත තැනට ලැබෙන සේ ඉල්ලුම්පත්‍ර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. රාජ්‍ය සේවයේ නියුක්ත අපේක්ෂකයන් ගේ ඉල්ලුම් පත්‍ර ද නියමිත දිනට පෙර ආණ්ඩුවේ ඒජන්ත තැනට ලැබෙනසේ කෙළින්ම එවිය යුතුය. ඉල්ලුම් පත්‍රයේ පිටපතක් තම දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන්ද එවිය යුතුය.

(iii) නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරණු ලැබේ. ඉල්ලුම්පත්‍ර ආණ්ඩුවේ ඒජන්ත හෝ කච්චේරියේ වෙනත් නිළධාරියකුගේ පුද්ගලික නමට නොඑවිය යුතුය.

10. **සුදුසුකම් පිළිබඳ ලියකියවිලි.**—(i) ඉල්ලුම් පත්‍රය සමග කිසිම ලියකිය විල්ලක් නොඑවිය යුතුය. එහෙත් ඉල්ලුම් පත්‍රයේ ඒ ඒ කොටුවල ඉල්ලා ඇති අවශ්‍ය විස්තර සඳහන් කළ යුතුය. මෙම සෑම අතින් සම්පූර්ණ නොමැති ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

(ii) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට තේරෙන අපේක්ෂකයන් විසින් තමන්ගේ සුදුසුකම් සනාථ කිරීම සඳහා ලියකියවිලි ඉදිරිපත් කළ යුතුවේ. එම ලියකියවිලි ඉදිරිපත් කරණ ලෙස එම අපේක්ෂකයන්ට දැනුම් දුන්නොත් එවිට ඒවා ඉදිරිපත් කිරීමට ඔවුහු සූදානමින් සිටිය යුත්තාහ.

(iii) පහත සඳහන් ලියකියවිලි අවශ්‍ය වනු ඇත :—

(ඒ) චරිත සහතිකයක්.

සටහන.—කිසියම් අපේක්ෂකයකු දනුදුනු රජයේ හෝ ආධාර ලබන පාඨශාලාව ඉගෙනුම ලබන්නෙහි නම් හෝ පාඨශාලාවෙන් අස්වූයේ මෑතකදී නම් හෝ ඔහු තම චරිතය පිළිබඳ සහතිකය ලබාගත යුත්තේ එම පාඨශාලාවේ ප්‍රධානාචාර්යවරයා ගෙනි. නොඑසේ නම්, එය සමාදන විනිශ්චය කරුවකු, අධිනීතිඥව රයකු, නීතිඥවරයකු හෝ නොතාරිස් වරයකු, ප්‍රාදේශීය ආදයම් නිළධාරියකු හෝ වර්ෂයකට ඒකාබද්ධ වැටුප රු. 4,800 හෝ ඊට වැඩි ස්ථිර රජයේ නිළධාරියකු යන අයගෙන් හෝ කිසියම් නම් දරණ එමෙන්ම අපේක්ෂකයා පිළිබඳව ලෙහෙසියෙන් විමසීම් කර බැලීමට හැකි තැනැත්

තෙකු ගෙන් ලබාගෙන ඉදිරිපත් කළ හැක. නිකුත් කරණ තැනැත්තාගේ නම, තනතුර සහ ලිපිනය චරිත සහතිකයේ පැහැදිලිව සඳහන්වී තිබිය යුතු වේ.

දැනටමත් රජයේ සේවයේ නියුක්තව සිටින අපේක්ෂකයන් චරිතය පිළිබඳ සහතිකයක් ඉදිරිපත් කිරීම අනවශ්‍යය. එහෙත් ඔවුන් විසින්, තමන්ගේ සේවය සහ හැසිරීම සතුටුදයක බවටත් තමන් පත්කිරීම සඳහා තෝරාගනු ලැබුවොත් ඒ සඳහා මුදහැරීමට හැකි බවටත් තමන් සේවයකරණ දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළයුතුය.

(බී) අපේක්ෂකයාගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනේ සහතික යක් හෝ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් වයස පිළිබඳව නිකුත් කරණු ලැබඇති විශේෂ සහතිකයත් (උප්පැන්නය ලියාපදිංචි කර නොමැති අපේක්ෂකයන් වෙනුවෙනි.) අනුමාන වයස පිළිබඳව සහතිකයක් පමණක් ඉදිරිපත් කළ හැකි කිසියම් අපේක්ෂකයකු ගේ උපන් දිනය එම සහතිකයේ දක්වා ඇති උපන් වර්ෂයේ ජූලි මස 1 වැනි දින ලෙස සළකනු ලැබේ.

සටහන.—(i) පාසැල් හෝ අධ්‍යාපනික කටයුතු සඳහා නිකුත් කරඇති විශේෂ උප්පැන්න සහතිකයක් හෝ උප්පැන්න ලියා පදිංචි කිරීමේ සටහනින් උපුටාගත් සහතික කළ උධෘතයක් භාර ගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතික වෙනුවට ආදේශක වශයෙන් දිවුරුම් පෙත්සම් හෝ බෞතිස්ම සහතික භාරගනු නොලැබේ.

(iii) උප්පැන්න සහතිකයේ දක්වෙන නම/නම් අපේක්ෂකයා සාමාන්‍යයෙන් භාවිතා කරන නමින්/නම්වලින් වෙනස් වේ නම්, අපේක්ෂකයාට අදළ වන පරිදි 27 හෝ 28 වගන්තිය (110 පරිච්ඡෙදය) යටතේ උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සටහන සංශෝධනය කරවා ගැනීම පිණිස වහාම ක්‍රියා කළ යුතුය.

රජයේ ස්ථිර තනතුරු උසුලන, අංක 394 සහ 1957 අගෝස්තු 18 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව තම නම් වෙනස්කර ඇති අපේක්ෂකයන් උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සටහනේ ඇති තමන්ගේ නම් සංශෝධනය කිරීම පිණිස ක්‍රියා කිරීමට අවශ්‍ය නැත.

(සී) ලාංකික පුරවැසියකු වශයෙන් ලියා පදිංචි කළ සහතිකය හෝ පරම්පරාවෙන් පුරවැසියකු බව පිළිගත් බවට නිකුත් කර ඇති මුල් රාජකාරි ලිපිය (අදල වූ විට)

(ඩී) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකය හෝ සහතිකය නිකුත් කර නොමැති විටකදී, වෙනත් අධ්‍යාපනික ලියකියවිලි උද : ලංකා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) පෞද්ගලික අයදුම්කරුවන් වෙත නිකුත් කර ඇති ප්‍රතිඵල සටහන හෝ අපේක්ෂකයාගේ පාසැල් ප්‍රධානියා නිකුත් කළ මුල් ලිපිය.

(ඊ) ඉහත 4(iv) යටතේ සුදුසුකම් ලබා ඇති බවට සාක්ෂි වශයෙන් සහතික.

(iv) ඉල්ලුම් පත්‍ර එවන අවස්ථාව වන විට අවශ්‍ය සියළුම ලියකියවිලි සූදනමින් තබාගන්නා ලෙස අපේක්ෂකයන් වෙත උපදෙස් දෙනු ලැබේ. කිසියම් අපේක්ෂකයෙකු සම්මුඛ පරීක්ෂණයේදී අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ඔහුගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

11. **අසත්‍ය විස්තර සැපයීමට දඬුවම්.**—මෙම නිවේදනයේ දක්වෙන රෙගුලාසිවලට අනුව අපේක්ෂකයකු නුසුදුසුයයි ඔප්පු වුවහොත් ඔහු මෙම තනතුරට තෝරා ගැනීමට පෙර හෝ තෝරාගත් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ ඉල්ලීම අවලංගු කිරීමට භාජනය විය හැකිය.

අපේක්ෂකයන් විසින් සපයා ඇති කිසියම් තොරතුරක් ඔහු දන්නා පරිදී අසත්‍ය බව ඔප්පු වුවහොත් හෝ කිසියම් වැදගත් කරුණක් හිතාමතාම යටපත් කළහොත් හෝ සේවයේ යෙදී සිටින කාළය තුළ ඕනෑම අවස්ථාවක දී ඔහු ඉල්ලුම් කිරීමට නුසුදුස්සකුව සිටි බව ඔප්පුවුවහොත් වහාම සේවයෙන් පහකිරීමට හෝ සේවය නතර කිරීමට ඉඩ ඇත.

මෙම නිවේදනයෙහි දක්වා ඇති නියමයන් දැඩිලෙස නොපිළිපදින අපේක්ෂකයන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

12. **වෛද්‍ය පරීක්ෂණය.**—පත්කරනු ලැබීම සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන් තමන් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා ශාරීරිකව සුදුසු බවට සහතික කෙරෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වන අපේක්ෂකයන් පුහුණුව සඳහා තෝරාගනු නොලැබේ.

13. මෙම රෙගුලාසිවලට ඇතුළත් නොවන ඕනෑම කාරණයක් පිළිබඳව තීරණයක් ගැනීම ආණ්ඩුවේ ඒජන්ත වරයාගේ අභිමතය පරිදි කෙරෙනු ඇත.

අ. පු. බ. මනම්පේරි,
අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970.11.15 වැනි දින,
අනුරාධපුර, කච්චේරියේ දීය.

11–913—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ හුරුළු පලාත කොට්ඨාශයේ තුලාන 26, 26ඒ, 27, 27ඒ, 27බී ප්‍රදේශයේ මුස්ලිම් විවාහ ලේකම් ධූරය

හුරුළු පලාත කොට්ඨාශයේ තුලාන 26,26ඒ,27,27ඒ,27බී මුස්ලිම් විවාහ කොට්ඨාශයේ, ප්‍රදේශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොටගෙන සැලකුම් ලබන විවාහක පිරිමි මුස්ලිම් අයවලුන්ගෙන් ඉහත සඳහන් ධූරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

2. මෙම ධූරය සඳහා ඉදිරිපත්වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිලිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලය, ග්‍රාම සේවක කාර්යාලය, පලාත් පාලන ආයතන කාර්යාලය, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනයකර ඇති දැන්වීම්වල ඇතුලත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස්විය යුතු අතර, ඒවා 1970 දෙසැම්බර් 31 වෙනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අ. පු. බ. මනම්පේරි,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1970 නොවැම්බර් මස 10 වෙනි දින,
අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී.

11–914—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## ලංකා යුද හමුදාවේ දන්ත නිලධාරි තනතුර

අංක 14,928 හා 1970 ඔක්තෝබර් 16 වැනි දින දරණ රජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද යුද හමුදාවේ දන්ත නිලධාරි තනතුරට අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අයදුම්පත් 1970 දෙසැම්බර් 15 වැනි දින දක්වා ඇත් භාරගනු ලැබේ.

එම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුද හමුදාධිපතී වෙනුවට.

1970 නොවැම්බර් මස
කොළඹ දීය.

11–895—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

අංකය වි: ආ/4/108.

## අධ්‍යාපන අමාත්‍යාංශය

### 1971–72 ඉන්දීය රජයේ සාමාන්‍ය සංස්කෘතික ශිෂ්‍යත්ව

ඉන්දීය රජයේ සාමාන්‍ය ශිෂ්‍යත්ව ක්‍රමය යටතේ 1971–72 වර්ෂයේ සිට පශ්චාත් උපාධි අධ්‍යාපන හෝ ප්‍රථම උපාධි අධ්‍යාපනය සඳහා පිරිනැමෙන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව මට්ටමේ ඉගෙනීම සඳහා අධ්‍යයන ක්ෂෙත්‍ර පිළිබඳව සීමාවක් නැත. එහෙත්, පූර්ව උපාධි මට්ටමේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් පත් භාරගනු ලබන්නේ පහත සඳහන් විෂයයන් සඳහා පමණි :—

‘අ’ ගණය.— 1. වාස්තු විද්‍යාව
2. ඉංජිනේරු විද්‍යාව

‘ආ’ ගණය.— 1. කෘෂිකර්මය
2. ආහාර කාර්මික විද්‍යාව
3. වන සංරක්ෂණය
4. ජේෂකර්ම විද්‍යාව
5. බෙහෙත් මිශ්‍රණය
6. ගෘහ විද්‍යාව

‘ඇ’ ගණය.— 1. ව්‍යාපාර පරිපාලනය
2. පුස්තකාල විද්‍යාව
3. පුවත්පත් කලාව

**සංලක්ෂය 1.**—ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැළකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි

මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ. පූර්ව උපාධි ශිෂ්‍යත්ව සඳහා පහත සඳහන් අයගෙන් අයදුම් පත් භාර ගනු නො ලැබේ:—

(අ) ස්ථිර තනතුරු දරන හා තනතුරුවල ස්ථිර කර ලැබ සිටින රජයේ නිලධාරීන් ;

(ආ) මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා එවැනි වෙනත් රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන ආයතනවල සේවයේ යෙදී සිටින ස්ථිර තනතුරු දරන හා තනතුරුවල ස්ථිර කරනු ලැබ සිටින නිලධාරීන් ;

(ඇ) දැනටමත් ලංකාවේ හෝ විදේශයක හෝ විශ්ව විද්‍යාලයක කිසියම් පාඨමාලාවක් අනුගමනය කරන ශිෂ්‍යයින්.

**සංලක්ෂය 2.**—රජයේ සේවකයන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත සමග ඉදිරිපත් කළ යුතු ය.

**සංලක්ෂය 3.**—මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම් පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතු ය.

**සංලක්ෂය 4.**—එක් අයදුම් කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

2. **ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය තෝරා ගනු ලබන පාඨමාලාව අනුව වන්නේ ය. පශ්චාත් උපාධි සඳහා නම්, සාමාන්‍යයෙන් අවුරුදු 2 ක් පමණ ද, පූර්ව උපාධි සඳහා නම්, අවුරුදු 4 සිට 6 පමණ ද විය හැකි යි.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නො පැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නො දැක්වීම හෝ විභාගවලින් සමත් විය නො හැකිවීම නිසා හෝ ඉන්දියානු බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යයත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්ව ධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. **සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(I) ලංකාවේ පුරවැසියන් විය යුතු යි.

(II) පශ්චාත් උපාධිය ශිෂ්‍යත්ව සඳහා අයදුම්කරුවන්ගේ වයස, 1971.6.1 දිනට අවුරුදු 25 ට අඩු විය යුතු යි. එහෙත් අවුරුදු 20–22 අතර අයදුම්කරුවන් කෙරෙහි විශෙෂ සැළකිල්ලක් දක්වනු ලැබේ. පූර්ව උපාධි ශිෂ්‍යත්ව සඳහා අයදුම්කරුවන්ගේ වයස 1971.6.1 දිනට අවුරුදු 17 හා 20 අතර විය යුතුයි.

(III) පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා අයදුම්කරුවන් අනුගමනය කිරීමට අදහස් කරන පාඨමාලාවට අදාල විෂයයන්ගෙන් ලබා ගත්, පිළිගත් විශ්ව විද්‍යාලයක දෙවැනි පෙළ උපාධියක්වත් යටත් පිරිසෙයින් ලබා සිටිය යුතු යි.

(IV) **පූර්ව උපාධි ශිෂ්‍යත්ව සම්බන්ධයෙන්.**—(අ) අයදුම්කරන්නේ (අ) වර්ගයේ පාඨමාලාවක් සඳහා නම්—පහත සඳහන් සාමාර්ථ යන් ද ඇතුළත් ව යටත් පිරිසෙයින් විෂයයන් 6 කින්වත් දෙවතාවකට නො වැඩි වාර ගණනකදී අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සමත්ව සිටිය යුතු යි :—

(1) ශුද්ධ ගණිතය හෝ ව්‍යවහාරික ගණිතය හෝ උසස් ගණිතය හෝ පිළිබඳ සම්මාන සාමාර්ථය ;

(2) භෞතික විද්‍යාව පිළිබඳ සම්මාන සාමාර්ථය ;

(3) රසායන විද්‍යාව හා ඉංග්‍රීසි භාෂාව යන විෂයයන් අතරින් එක් විෂය යකින් සම්මාන සාමාර්ථයක් හා අනික් විෂයයෙන් සාමාන්‍ය සාමාර්ථයක් ද ලබා තිබිය යුතු යි.

නැතහොත්

(4) ඉන්දියාවේ පිළිගත් මේ හා සමාන විභාගයක දී උසස් ශ්‍රේණියේ සාමාර්ථයක් ලබා තිබිය යුතු යි.

(ආ) අයදුම්කරන්නේ (ආ) වර්ගය යටතේ පාඨමාලාවක් සඳහා නම්— පහත සඳහන් සාමාර්ථයන් ද ඇතුළුව, යටත් පිරිසෙයින් විෂයයන් 6 කින් වත්, දෙවතාවකට නො වැඩි වාර ගණනක දී අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සමත් ව සිටිය යුතු යි :—

(1) ජීව විද්‍යාව හෝ උද්භිද විද්‍යාව හා සත්ත්ව විද්‍යාව යන දෙකම හෝ භෞතික විද්‍යාව පිළිබඳ සම්මාන සාමාර්ථයක් ;

(2) රසායන විද්‍යාව පිළිබඳ සම්මාන සාමාර්ථයක් ;

(3) භෞතික විද්‍යාව හා ශුද්ධ ගණිතය හෝ ව්‍යවහාරික ගණිතය හෝ උසස් ගණිතය යන විෂයයන් අතරින් එක් විෂයයකින් සම්මාන සාමාර්ථයක් හා අනික් විෂයයෙන් සාමාන්‍ය සාමාර්ථයක් ;

(4) ඉංග්‍රීසි භාෂාවෙන් සාමාර්ථයක් ලබා සිටිය යුතු යි. නැතහොත් ඉන්දියාවේ පිළිගත් මේ හා සමාන විභාගයක දී උසස් ශ්‍රේණියේ සාමාර්ථයක් ලබා තිබිය යුතු යි.

(ඉ) අයදුම්කරන්නේ (ඉ) වර්ගය යටතේ පාඨමාලාවක් සඳහා නම්— පහත සඳහන් සාමාර්ථයන් ද ඇතුළුව යටත් පිරිසෙයින් විෂයයන් 6 කින් වත්, දෙවතාවකට නො වැඩි වාර ගණනක දී, අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සමත් ව සිටිය යුතු යි :—

(1) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සම්මාන සාමාර්ථයක් ;

(2) ශුද්ධ ගණිතය හෝ ව්‍යවහාරික ගණිතය හෝ උසස් ගණිතය පිළිබඳ සම්මාන සාමාර්ථයක් ;

(3) ආර්ථික විද්‍යාව හෝ ප්‍රජාචාරය හෝ පිළිබඳ සම්මාන සාමාර්ථයක් ;

නැතහොත්

(4) ඉන්දියාවේ පිළිගත් මේ හා සමාන විභාගයක දී උසස් ශ්‍රේණියේ සාමාර්ථයක් ලබා තිබිය යුතු යි.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) ඉගැන්වීමේ ගාස්තු, විභාග ගාස්තු හා වෙනත් සියලුම අනිවාර්ය ගාස්තු ;

(ආ) පී.එච්.ඩී. උපාධි පාඨමාලාවන් සඳහා රු. 300 සීමාවට යටත්ව ද, වෛද්‍ය විද්‍යාව හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පාඨමාලාවන් සඳහා රු. 200 සීමාවට යටත්ව ද, පොත් පත උපකරණ ආදිය වියදම් ;

(ඉ) ඉහත (ආ) යටතේ නියමිත සීමාව ඇතුළත ප්‍රබන්ධය ටයිප් කිරීම පිළිබඳ නියමිත ගණන් අනුව වියදම්, මෙය ගෙවනු ලබන්නේ ඉන්දියාවෙන් පිටත්වීමට පෙර ප්‍රබන්ධය ඉදිරිපත් කළහොත් පමණි ;

(ඊ) පාඨමාලාවට සම්බන්ධ අධ්‍යාපන චාරිකා සඳහා නියමිත ගණන් අනුව වියදම් ;

(උ) ඉඳුම්, හිටුම්, කෑම්–බීම් ආදිය සඳහා මසකට රු. 300 බැගින් යැපීම් දීමනාවක් ;

(ඌ) වෛද්‍ය නිලධාරියාගේ හෝ ආයතන ප්‍රධානියාගේ උපදෙස් පිට ලබන වෛද්‍ය ප්‍රතිකාර පිළිබඳ සියලුම වියදම් ;

(ඍ) ඉන්දියානු රජය අනුමත කළ විවේක කඳවුරු හෝ තරුණ කඳවුරු වලට සහභාගීවීම පිළිබඳව ගමන් වියදම් හා දෛනික දීමනාවක් ;

(ඎ) සන්ධාන පාඨමාලාවලට සහභාගි වන ශිෂ්‍යයින්ට නියමිත ප්‍රමාණයන් අනුව ගමන් වියදම්.

**සැළකිය යුතුයි.**—ඉන්දියාවට යෑමේ හා ආපසු පැමිණීමේ ගමන් වියදම් තෝරාගනු ලබන අපේක්ෂකයින් විසින් ම දැරිය යුතුව ඇත.

සංලක්ෂය—මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීතිරීතීන්ට යටත් වන්නේ ය.

5. **සම්මුඛ පරීක්ෂණය.**—සුදුසුකම් ලත් අයදුම් කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතු ය.

6. **ගිවිසුම.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් ඉන්දියාව බලා පිටත්ව යාමට පෙර —

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදරා සතුටුදයක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද;

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමට ද;
පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

7. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් ඉන්දියාවේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරැදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපේක්ෂකයෙකු තෝරාගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදනයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂෙප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදනයක් සඳහා හෝ ඕහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපේක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදනයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතු ය. ශිෂ්‍යත්ව ප්‍රදනය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපේක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලබන්නේය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙල කළ යුතු අයදුම් පත්, 1970.12.11 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 2,මැලේවිදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතුවන්නේය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන් කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවල ගු කල යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම් පත්, ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් ද එවිය යුතු යි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදනම් වුවද මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන නිලධාරීන් තම අයදුම්පත්, ඒ ඒ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් මගින් එවිය යුතුය.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම් කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේය.

ස්ථිර ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

1970 නොවැම්බර් මස 20 වැනිද,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

11–1227—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## බිම් මැනීම හා තලමිතිය පිළිබඳ විශේෂ ප්‍රායෝගික පරීක්ෂණය

බිම් මැනීම හා තලමිතිය පිළිබඳව සර්වේ ජනරාල්ගේ බලපත්‍රය නිකුත් කිරීම සඳහා විශේෂ ප්‍රායෝගික පරීක්ෂණයක්, අපේක්ෂකයින් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටියහොත්, 1971 පෙබරවාරි මස 25 වෙනි දින සිට පවත්වනු ලැබේ. සර්වේ ජනරාල්ගේ බලපත්‍රය සඳහා වූ පරීක්ෂණයේ ලිඛිත කොටසින් කලින් සමත් වී සිටින්නෝ පමණක් මෙම විභාගයට ඉල්ලුම් කිරීම් සඳහා සුදුස්සෝ වෙත්.

2. පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොළඹ දිස්ත්‍රික්කය ඇතුළතය.

3. ඉහත කී පරීක්ෂණයට ඇතුළත් වීමට ව්‍යවස්ථානුකූලව නියමිත ආකෘතිපත්‍රවල අයදුම්පත් පිළියෙල කළ යුතු වේ. මෙම ආකෘතිපත්‍රය කොළඹ 5, කිරුළ පාරේ සර්වේ ජනරාල් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

4. අයදුම්පත්‍ර භාර ගැනීම අවසාන වන දිනට, එනම්, 1971 ජනවාරි මස 25 දිනට ප්‍රථමයෙන් අයදුම්කරුවෝ පහත සඳහන් පරිදි විභාග ගාස්තු සර්වේ ජනරාල්ට ගෙවිය යුතුය :—

බිම් මැනීම පමණක් පිළිබඳ වන පරීක්ෂණයක් සඳහා රු. 30.00
තලමිතිය පමණක් පිළිබඳ වන පරීක්ෂණයක් සඳහා රු. 30.00
බිම් මැනීම හා තලමිතිය පිළිබඳ වන පරීක්ෂණයක් සඳහා රු. 50.00

5. ලිඛිත පරීක්ෂණයේ බිම් මැනීම් හා තලමිතිය පිළිබඳ නිර්දේශ පත්‍රය අනුව පිළියෙල කරනු ලබන පරීක්ෂණය පැවැත්වෙන වේලාව සහ ස්ථානය සම්බන්ධයෙන් අයදුම්කරුවන්ට යථා පරිදි දැනුම් දෙනු ලැබේ.

6. පරීක්ෂක තැන විසින් නියම කරනු ලබන වේලාවන් අතරතුර අයදුම්කරුවෝ ක්ෂෙත්‍රයේ වැඩ කළ යුතු අතර යහපත් තත්ත්වයක ඇති උපකරණවල ඇති දෝෂ සදොස් වැඩ සම්බන්ධයෙන් සමාවට කාරණයක් සේ නොපිළිගැනේ. පරීක්ෂණ වේලාවල දී කිසිවෙක් හා කථාබස් කරන අයදුම්කරුවන් විභාගයට නුසුදුස්සන් සේ සලකනු ලැබේ.

7. සියළුම අයදුම්කරුවෝ, පෝල් පිටි, කූඤ්ඤ, ඇඳීමේ උපකරණ, ලිපි ද්‍රව්‍ය යනාදී ස්වකීය උපකරණ සහ කම්කරුවන් සපයා ගත යුතු අතර, පරීක්ෂණයේ දී ඔවුන්ගේ අවශ්‍යතාවයන් සපයා දීම සම්බන්ධයෙන් කුමන විධියේ හෝ ආධාරයක් නොදෙනු ඇත.

8. 1971 ජනවාරි මස 25 වෙනි දිනට පසුව කිසිම අයදුම්පතක් භාර ගනු නොලැබේ.

9. පරීක්ෂණය සඳහා පෙනී සිටින සෑම අයදුම්කරුවෙක් ම, පරීක්ෂණයේ දී විභාග පරිපාලකගේ තෘප්තියට හේතු වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. පහත සඳහන් ලිපි ලේඛන වලින් කුමක් වුවත් ඉදිරිපත් කිරීමෙන් එවැනි සාධක සැපයිය හැකිවේ :—

(අ) පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද අනන්‍යතා පත්‍රයක් ;

(ආ) මෙම පරීක්ෂණය පවත්වන දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත දී නිකුත් කරන ලද වලංගු පාස්පෝට් බල පත්‍රයක් ;

(ඇ) මෙම පරීක්ෂණය පවත්වන දිනට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක අධිකාරිත්වය යටතේ නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායා රූපයක් ද සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ අන්‍ය ලියවිල්ලක්.

සංලක්ෂ්‍යය.—පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන අනන්‍යතා පත්‍ර සඳහා අයදුම්පත් පෝරම දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් ලබාගත හැකිය.

10. අවශ්‍ය පරිදි අනන්‍යතාව ඔප්පු කරන සාධක ඉදිරිපත් නොකළහොත් කිසිම අයදුම්කරුවෙකුට එම පරීක්ෂණයට පෙනී සිටීමට හෝ පෙනී සිටීමට හිමිකම් ලැබීමට ද අවසරයක් නොමැත.

11. සියළුම ලියකියවිලි පෞද්ගලිකව මා නමට නොව “ සර්වේ ජනරාල් ” නමට එවිය යුතුය.

12. (අ) වරක් තැන්පත් කරනු ලැබූ විභාග ගාස්තු කිසියම් හේතුවක් නිසා හෝ ආපසු ගෙවනු නොලැබේ.

(ආ) සාධාරණ හේතුන් උඩ විභාගයෙන් ඉවත්වීමේ දන්වීම් 1971.2.12 වැනි දිනට හෝ ඊට ප්‍රථම මෙම කාර්යාලයට ලැබෙන සේ ඉදිරිපත් කරන අයදුම්කරුවන්හට ඊළඟ විභාගයට පමණක් නොමිළයේ පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

(ඇ) සාධාරණ හේතුන් උඩ විභාගයෙන් ඉවත්වීමේ දැන්වීම්, අසනීපයෙන් නම් වෛද්‍ය සහතික සමග 71.2.12 වැනි දිනට පසුව හා විභාගය ආරම්භ කිරීමට පෙර මෙම කාර්යාලය වෙත ලැබෙන සේ ඉදිරිපත් කරන අයදුම්කරුවන්හට, ඊළඟ විභාගයට පමණක් ගාස්තු භාග ප්‍රමාණයක් ගෙවා පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

(ඇ) ඉහත (ආ) සහ (ඇ) හි සඳහන් අනුග්‍රහයන් ලබා නොගන්නා ලද හා විභාගය ආරම්භ කිරීමට පෙර, ඊට පෙනී සිටීමට තමන්හට නොහැකි වන බව දන්වා නොඑවන ලද අයදුම්කරුවන්ගේ විභාග ගාස්තු ඔවුනට අහිමි කරනු ලැබේ.

සී. වන්නියසිංගම්,
වැඩ බලන සර්වේ ජනරාල්.

1970 දෙසැම්බර් මස 2 වැනි දින,
කොළඹ 5,
තැ. පෙ. 506, කිරුළ පාරේ,
සර්වේ ජනරාල් කාර්යාලයේදීය.

11–951—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

## ලංකා විභාග දෙපාර්තමේන්තුව

### පෙරදිග සංගීතය සහ නැටුම් පිළිබඳ සහතික පත්‍ර විභාගය, (මධ්‍යම හා අවසාන) 1970

1. විභාග පවත්වන දිනය .—

විද්‍යාව පිළිබඳ

මෙම විභාගය 1971 පෙබරවාරි මස 16 වැනි දින පවත්වනු ලැබේ.

2. විභාග මධ්‍යස්ථාන.—(i) කොළඹ, මීගමුව, කළුතර, මහනුවර, ගාල්ල, රත්නපුරය, කෑගල්ල, බදුල්ල සහ කුරුණෑගල.

(අභ්‍යාසය පිළිබඳ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොළඹ, මහනුවර, ගාල්ල සහ කුරුණෑගල යන මධ්‍යස්ථානවල පමණකි. එය පවත්වනු ලබන දිනය හා ස්ථානයත් අයදුම්කරුවන්ට පසුව දන්වනු දෙනු ලැබේ.)

(ii) අයදුම්කරුවන් සෑහෙන ගණනක් ඇතුළු වී නැති කවර මධ්‍යස්ථානයක් වුවත් අවලංගු කරනු ලැබේ.

3. විභාග පරිපාටිය.—(i) මේ විභාගය කොටස් තුනකින් පවත්වනු ලැබේ, එනම් :—

(අ) පෙරදිග සංගීතය—ගායනය,

(ආ) පෙරදිග සංගීතය—වාදනය,

(ඉ) උඩරට නැටුම්.

සැ. යු. මෙම වර්ෂයේදී මෙම විභාගයේ ප්‍රාරම්භ කොටස පවත්වනු නොලැබේ.

(ii) අයදුම්කරුවකුට එක අවුරුද්දකදී ඇතුළත් විය හැක්කේ ඉහත සඳහන් කොටස් තුනෙන් එකකට පමණි.

(iii) එක් එක් කොටස සම්බන්ධයෙන් විභාගය අවස්ථා දෙකකින් යුක්ත වේ. එනම් :—මධ්‍යම , අවසාන යනුවෙනි.

(iv) (අ) කොටස හා (ආ) කොටස ශීර්ෂ දෙකකින් යුක්ත වේ. එනම්:—විද්‍යාව හා අභ්‍යාසයත්ය. විභාගයෙන් සමර්ථවීමට අයදුම්කරුවකු එක් එක් ශීර්ෂයෙන් ප්‍රමාණවත් තත්ත්වයකට පැමිණ තිබිය යුතුයි. විද්‍යාව පිළිබඳ ප්‍රශ්න පත්‍රයේ කාලය පැ දෙකකි.

(v) සංගීත වාදනය සම්බන්ධයෙන් පහත සඳහන් තූර්‍ය භාණ්ඩ පමණක් වාදනය කිරීමේ ප්‍රවීණතාව පරීක්ෂා කළ හැක්කේය. එනම් :—(i) රවි කින්නරය, (ii) තබ්ලාව, (iii) සිතාරය, (iv) දිල්රුබාව, (v) වීණාව, (vi) මෘදංගය, (vii) බටනළාව, (viii) සාරංගි, (ix) සරෝද් (x) ජල තරංග, (xi) එස්රාජ්, (xii) ෂෙණයි, (xiii) නළ තරංග.

එක් අවුරුද්දකදී ඇතුළු විය හැක්කේ මේ තූර්‍ය භාණ්ඩවලින් එකක් සම්බන්ධයෙන් පමණි. අභ්‍යාසය පිළිබඳ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් අවශ්‍ය තූර්‍ය භාණ්ඩ ගෙන ආ යුතුය.

(vi) අභ්‍යාසය පිළිබඳ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් තිබෙන්නේ විද්‍යාමය විභාගයෙන් සාමාර්ථය වූ අයදුම්කරුවන්ට පමණි.

(vii) මධ්‍යම, අවසානය යන දෙකොටස සම්බන්ධයෙන් සහතික පත්‍ර ප්‍රදානය කරනු ලැබේ.

4. නිර්දේශ පත්‍ර.—මේ විභාගය පවත්වනු ලබන්නේ ලංකා ගාන්ධර්ව සභාවේ විභාග නිර්දේශ පත්‍රය අනුවය.

5. සුදුසුකම්.—(අ) ගන්ධර්ව සභාවේ ප්‍රාරම්භ සහතිකය ලබා තිබෙන අයට පමණක් මධ්‍යම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් තිබේ.

(ආ) අවසාන විභාගයට පෙනී සිටිය හැක්කේ ගන්ධර්ව සභාවේ මධ්‍යම විභාග සහතිකය ලබා තිබෙන අයට පමණකි.

6. විභාගයට ඇතුළු කර ගැනීම.—මෙම ව්‍යවස්ථා අනුව හා නියමිත ගාස්තුව ගෙවා ඉල්ලුම් කරන සියළුම අයදුම්කරුවෝ ලිඛිත පරීක්ෂණයකට ඇතුළත් කරනු ලැබෙත්.

7. පරීක්ෂණයට ඇතුළුවීමට ඉල්ලීම.—(i) මෙම නිවේදනයෙහි අග පලවන ආදර්ශ ආකෘතිය අයදුම්කරු විසින් ම පිළියෙල කර ගන්නා ලද අයදුම්පතක් නිසියාකාර සම්පූර්ණ කිරීමෙන් මෙම පරීක්ෂණයට ඇතුළුවීමට ඉල්ලුම් කළ යුතුය. මුද්‍රිත අයදුම් පත් මෙම දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු නොලැබේ.

(ii) අයදුම්පත සකස් කිරීමේදී මෙහි පහත දක්වෙන උපදෙස් අකුරටම පිළිපැදිය යුතුය. ඒවා නොසලකා හැරීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ :—

(අ) ෆුල්ස්කැප් ඉරුවක, එනම් 8″ × 13″ ප්‍රමාණයේ කඩදාසියක අයදුම් පත පිළියෙල කරනු විනා වෙනත් ප්‍රමාණයේ කඩදාසියක් ප්‍රයෝජනයට නොගත යුතුය.

(ආ) ටයිප් රයිටරයක් මගින් අයදුම්පත පිළියෙල කළ ද වරදෙක් නැත. අත් අකුරෙන් පිළියෙල කරන්නේ නම් අයදුම්පතෙහි ආකෘතිය රතු තීන්තෙන් විය යුතුය. අයදුම්පත සම්පූර්ණ කිරීම නිල් හෝ කලු තීන්තෙන් කළ යුතුය.

(ඉ) ඉරි ඇඳ අයදුම්පතේ කොටු වෙන් කරන්න. කොටු වෙනස් කිරීම හෝ අත්හැරීම නොකළ යුතුය. කොටු එකටෙක ගොඩ නොගැසෙන ලෙස ද කොටුවල ලිවීමට අපහසු නොවන ලෙසද ඉතා හොඳ අන්දමින් කොටු සඳහා ඉඩ වෙන් කළ යුතුය.

(iii) අයදුම්පත්‍රය අයදුම්කරු විසින් පැහැදිලිව ද නිවැරදිව ද සම්පූර්ණ කළ යුතුය. එසේ සම්පූර්ණ කොට නොමැති අයදුම්පත්‍ර, සපයන ලද කරුණු අනුව සලකා බලා විභාගයට පෙර ප්‍රතික්ෂෙප කරනු ලැබේ. විභාගයට පසුව නම් අයදුම්කරුවන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(iv) අයදුම්කරුගේ අත්සන සහතික කිරීමට බලය ලත් කෙනෙකු විසින් එය සහතික කළ යුතුයි. එනම්, සාමදාන විනිශ්චයකාරයකු, දිවුරුම් කොම සාරිස්වරයෙකු, පෙරකදෝරු කෙනෙකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු, නාවුක ගගන හෝ ගොඩ යුද්ධ හමුදවක කොමිෂන් නිලධාරියෙකු, රුපියල් 4,800 හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු හෝ ආණ්ඩුවේ හෝ අධ්‍යක්ෂ පාලිත හෝ අනුමත කළ පාසලක ප්‍රධානයකු, හෝ එවැනි පාසලක එම තත්ත්වයේ සිට විශ්‍රාම ලත් අයකු, කොට්ඨාශයේ ග්‍රාම සේවක තැන හෝ බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු අන්‍ය ආගමික පූජ්‍යස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන කෙනෙකු හෝ ලවා සම්පූර්ණ කරවා ගත යුතුය.

(v) ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1971 ජනවාරි මස 15 වැනිදය. සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර එදින හෝ එදිනට පෙර කොළඹ 2, මැලේ වීදියේ, විභාග කොමසාරිස් වෙත ලැබෙන සේ රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. අයදුම් පත්‍ර බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ විභාගයේ නමද, තමන් ඉල්ලුම් කරන විභාග මධ්‍යස්ථානය ද සටහන් කළ යුතුය.

(vi) අයදුම් පත්‍ර ලැබුන බව දන්වා එවනු නොලැබේ.

(vii) කිසියම් ලියවිල්ලක් අයදුම්පත්‍රය සමග නොඑවිය යුතුය.

8. විභාග ගාස්තු.—විභාගයේ ඒ ඒ කොටස් සඳහා පහත සඳහන් ගාස්තු ගෙවිය යුතුය.

| | වාදනය විද්‍යාව හා අභ්‍යාසය | ගායනය විද්‍යාව හා අභ්‍යාසය | උඩරට නැටුම් අභ්‍යාසය පමණක් |
|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ, |
| මධ්‍යම ... | 7 50 | 7 50 | 7 50 |
| අවසාන ... | 10 0 | 10 0 | 10 0 |

සෑම අයදුම්කරුවෙකුම තම අයදුම්පත්‍රයට නියමිත මුද්දර අලවා ඒ පිට තම අත්සන හා දිනය යෙදීමෙන් එය අවලංගු කළ යුතුය. අත්සන යෙදීමෙන් අවලංගු නොකර මුද්දර එවීම සම්බන්ධයෙන් කාර්‍යාලය වග කියන්නේ නැත.

9. **අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීම.**—(i) පහත දක්වෙන පරිදි එවනු ලබන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කොට ඒ බැව් අයදුම්කරුවන්ට දන්වනු ලැබේ. අයදුම්කරු විභාගයට පෙනී සිට ඇතොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

(ඒ) අසම්පූර්ණ හෝ දෝෂ සහිත හෝ අන් කිසි විධියකින් ව්‍යවස්ථානුකූල නොවන අයදුම් පත්‍ර.

(බී) නියමිත මුද්දර ගාස්තු නැති අයදුම් පත්‍ර.

(සී) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම් පත්‍ර.

(ii) අයදුම්පත් ප්‍රතික්ෂේප කළ විට මුද්දර ගාස්තු රාජසන්තක වේ.

10. **මුදල් ආපසු නොදීම.**—අසනීප වීම හෝ අන් කරුණක් නිසා විභාගයට පෙනී නොසිටීම ඇතුළු කිසිම කරුණක් සඳහා ගෙවන ලද මුදල් හෝ ඉන් කොටසක් ආපසු ගෙවනු නොලැබේ.

11. **ප්‍රවේශ පත්‍ර.**—විභාගය පැවැත්වීමට දින හතකට පමණ පෙර පුවත්පත් මගින් ප්‍රවේශ පත්‍ර නිකුත් කළ බැව් දනුම් දෙනු ලැබේ. එවැනි දන්වීමක් ගැන සෑම අයදුම්කරුවෙක්ම සැලකිල්ලෙන් සිටිය යුතුය. එය පළ වූ විට එහි සඳහන් උපදෙස් අනුව වහාම ක්‍රියා කළ යුතුය.

(ii) යම් හෙයකින් අයදුම්කරුවෙකුට ප්‍රවේශ පත්‍රයක් නොලැබුනහොත් ඔහු විසින් කොළඹ 2, මැලේ වීදියේ විභාග කොමසාරිස් වෙත (තැපැල් පෙට්ටිය අංක 1503, විදුලි පණිවුඩ ලිපිනය : " විභාග " කොළඹ) ප්‍රවේශ පත්‍රය නොලැබුණ බව නොපමාවම දන්වා එවිය යුතුයි. විදුලි පුවතකින් මෙසේ දන්වීම වඩා හොඳය. හැකි නම් පැමිණ කොළඹ ආදුරුප්පු වීදියේ අංක 130 දරණ ස්ථානයේ පිහිටි ප්‍රවේශපත්‍ර ශාඛාවෙන් විමසන්න. ඒ සෑම විටකම පහත සඳහන් විස්තරය සැපයිය යුතුය. එනම් :—

(i) විභාගයේ නම :————.

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

(iii) සම්පූර්ණ ලිපිනය :————.

(iv) විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ මධ්‍යස්ථානය :————.

(v) අයදුම් පත්‍රය එවූ දිනය, එය රෙජිස්ටර් කළ තැපැල් පළ හා රෙජිස්ටර් අංකය :————.

12. **හැඳින්වීමේ පත්‍ර.**—(i) අයදුම්කරුවන් විසින් විභාග ශාලාවේදී තමන් එක් එක් විෂයකට පෙනී සිටින විට විභාග ශාලාධිපතීන්ට පිළිගත හැකි පරිදි තමන් පිළිබඳ අනන්‍යතාව ඔප්පු කළ යුතුයි. මේ සඳහා පහත සඳහන් වන ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ :—.

(ඒ) පෝස්ට්මාස්ටර් ජනරාල් තුමා විසින් නිකුත් කරන ලද හැඳින්වීමේ පත්‍රිකාවක් (Identity Card)

(බී) විභාග දිනයට කලින් තුන් අවුරුද්ද ඇතුළත නිකුත් කරන ලද්ද වූ ද වලංගුව පවත්නා වූද " පාස්පෝට් " (Pass Port) බලපත්‍රයක්.

(සී) විභාග දිනයට කලින් තුන් අවුරුද්ද තුළ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් විසින් හෝ රජයේ ආඥාවකින් බලය ලත් ආයතනයකින් හෝ නිකුත් කරන ලද්ද වූ ද, තම ඡායා රූපය දරන්නා වූ ද සහතික පත්‍රයක් හෝ බලපත්‍රයක් (Licence) හෝ වෙනත් ලියවිල්ලක්.

(ඩී) පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක්, එහි පිට පැත්තේ පහත දක්වෙන සහතිකය සැපයිය යුතුය. එසේ සහතික කළ යුත්තේ අත්සන් පත්‍රය සහතික කිරීමට බලය ලත් කෙනෙකු විසින් ය :—

පිට පැත්තේ පෙනෙන ඡායාරූපය..................................................................

(අයදුම්කරුගේ සම්පූර්ණ නම)

..........................................................................ගේ බවත්, පහත යොදු ඇත්තේ ඔහුගේ/ඇගේ අත්සන බවත්, මම සහතික කරමි.

————.  
අයදුම්කරුගේ අත්සන.

————.  
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.

————.  
නම සහ තත්ත්වය.

ඉහත දක්වෙන ලියකියවිලිවලින් එකක් ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ විභාග අපේක්ෂකත්වය තාවකාලික ලෙස සලකනු ලැබේ. විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි එවැන්නකුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ.

**වෙනත් කරුණු.**—මෙම ව්‍යවස්ථාවන්හි සඳහන් නොවූ යම්කිසි කරුණක් පිළිබඳ තීරණය විභාග කොමසාරිස් විසින් කරනු ලැබේ.

කේ. ටී. ඩබ්ලිව්. සුමනසූරිය,  
වැඩ බලන විභාග කොමසාරිස්.

1970 නොවැම්බර් මස 8 වැනි දින,  
කොළඹ 2, මැලේ වීදියේ විභාග දෙපාර්තමේන්තුවේදීය.

## ආදර්ශ අයදුම් පත්‍රය

## ලංකා විභාග දෙපාර්තමේන්තුව

### පෙරදිග සංගීත සහ නැටුම් පිළිබඳ සහතික පත්‍ර විභාගය—1970

*..........................විභාගයට ඇතුළුවීමේ අයදුම්පත

(*මධ්‍යම, අවසාන යන දෙකෙන් වුවමනා වචනය නොවරදවාම ලොකු අකුරෙන් ලියන්න)

| | |
|---|---|
| 1. අයදුම්කරුගේ නම (පැහැදිලි අකුරෙන්) — ව්‍යවහාර නාමය මුලකුරු සහිතව ... | |
| සම්පූර්ණ නාමය ... | |
| ව්‍යවහාර නාමය අත්සන් කිරීමේදී පාවිච්චි කරන නාමයම විය යුතුය. සම්පූර්ණ නාමය උප්පැන්න සහතිකයේ සඳහන් වන සම්පූර්ණ නාමයයි. කිසියම් වෙනසක් වේ නම් ඒ බව නීත්‍යානුකූල දිවුරුම් පෙත්සමකින් ඔප්පු කළ යුතුය. | |

| | |
|---|---|
| 2. ලිපිනය ... | ස්ත්‍රී පුරුෂ භාවය |
| | විභාගයට පෙනී සිටීමට කැමැති මධ්‍යස්ථානයේ නම |
| 2. විභාගයට පෙනී සිටින්නේ (අ) ගායනයටද ? (ආ) වාදනයටද ? (ඉ) උඩරට නැටුම්වලට ද? | 1. ..............................<br>2. .............................. |
| 4. වාදනයට නම් ප්‍රයෝජනයට ගන්නා තූර්ය භාණ්ඩ කවරේද? | |

| | |
|---|---|
| 5. (මධ්‍යම විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් පිරවිය යුතුයි.)<br><br>සාමර්ථ්‍යය ලබා ඇති ගන්ධර්ව සභාවේ ප්‍රාරම්භ විභාගයේ විස්තර | වර්ෂය :........................ විභාග අංකය :..........................<br><br>විභාග මධ්‍යස්ථානය : .............................................................. |
| 6. (අවසාන විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් පිරවිය යුතුයි.)<br><br>සමාර්ථය ලබා ඇති ගන්ධර්ව සභාවේ මධ්‍යම විභාගයේ විස්තර ... | වර්ෂය :.................. විභාග අංකය :..........................<br><br>විභාග මධ්‍යස්ථානය : .............................................................. |

7. විභාග ගාස්තු

මා විසින් මෙහි අලවන ලද මුද්දර කලින් පාවිච්චි නොකළ හොඳ මුද්දර බව මම සහතික කරමි.

මුද්දරවල වටිනාකම රු. .........ශ..........

අයදුම්කරුගේ අත්සන :...........................................................

දිනය : ..............................................

**මුද්දර අලවන කොටුව**

> සැලකිය යුතුයි
> මුද්දර එක පිට එක ඇලවිය යුතු නොවේ.
> අයදුම්කරුගේ අත්සන සහ දතම යෙදීමෙන් මුද්දර අවලංගු කළ යුතුයි.
> අත්සන කොටසක් මුද්දරවලද කොටසක් කඩදාසියේද සිටින ලෙස යෙදිය යුතුය.

| | |
|---|---|
| 8. අයදුම්කරුගේ සහතිකය | මේ අයදුම් පතෙහි ලියන ලද කරුණු සැබෑ බව මම සතික කරමි. තවද, විභාග කොමසාරිස් තැන විසින් ප්‍රසිද්ධ කරන ලද මේ විභාගය පිළිබඳ ව්‍යවස්ථාවලට හා විභාග ශාලාවේදී අයදුම්කරුවන් සඳහා පණවන ලද අණපනත්වලටත් මා අවනත බැව් පිළි ගනිමි.<br><br>..........................................<br>දිනය : .............................................. අයදුම්කරුගේ අත්සන. |

9. .......................................................................................................වන මම ඉහත සඳහන් වන අයදුම්කරු .............................................................................................පදිංචි කෙනෙකු බවද, මා ඔහු හොඳාකාර අඳුනන බවද, 19......ක්වූ...........................................................මස.................. වැනි දින මා ඉදිරියෙහි අත්සන් තබන ලද බවද සහතික කරමි.

ලිපිනය :

..................................................................................
..................................................................................
..................................................................................

සහතික කරන අයගේ අත්සන : ..........................................................

තරාතිරම : ..........................................................

දිනය : ..........................................................

## විභාගාපේක්ෂකයන් සඳහා නීති

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි හෝ පමුණුවනු ලැබේ:—

(i) මුළු විභාගයට ම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම;
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයට ම හෝ නුසුදුස්සකු කිරීම;
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම;
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම;
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම;
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලිසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

### නීති

1. සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාගශාලාධිපතීන්ට ද ඔහුගේ සහකාරයන්ට ද අනික් විභාගාපේක්ෂකයන්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්ත දාන්තව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළුවන විටත් ඉන් පිට වන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය බාගයක් ගත වූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන්ගෙන පැය බාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටවී යාම ද තහනම් ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචක පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරණ ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාගශාලාධිපතීන්ගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පනිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතීන්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයකුගේ උත්තර පත්‍රය අඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනා ගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිද්ධ වෙනවා ඇත.

7. තමන් වෙත සපයද ලද කඩදාසියෙහි හැර, තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නො ලිය යුතුයි. මේ නීතිය නොසැළකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකා මකා දැමීම හෝ නො කළ යුතුය. කටු වැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදාසි ඇතුළු පාවිච්චි කරන ලද සෑම කඩදාසියක් ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහි ම කොටසක් විය යුතුයි. (එබඳු කටු වැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි) විභාග ශාලාවේ දී ලියන ලද කිසි ම දෙයක් ඉන් පිටත ගෙන යෑම තහනම්ය. එක ම ප්‍රශ්නයකට පිළිතුරු දෙ තැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුර පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාද හෝ ගණන් කොහෙත් ම නො සද හෝ නිවැරදි පිළිතුරු දක්වීමත්, චිත්‍ර කර්මයෙහි දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයකුගේ චිත්‍රයකට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යානදියකින් සමානව එසේ නැති නම් බොහෝ සෙයින් කිට්ටුව තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙන යාම තහනම්ය. මේ සියලුම ද විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩ කිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත් පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිති උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී, ඒවා හැර, අනාය අත් බෑග්, පසුම්බි, පෙට්ටි හා පාර්සල් ආදිය ද, ෆයිල් කවර, කාර්ඩ් බෝර්ඩ්, පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද විභාග ශාලාව තුළ කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නො ගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසි ම අපේක්ෂකයකු අත කිසි ම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන ලද කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළ හොත් සෑම අපේක්ෂකයා ම තමන් සන්තකව තිබෙන ද මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩ කිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම ද හොර උත්තර ලිවීමට යත්න දැරීම ද තහනම්ය. තවත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නො කළ යුතුය. වෙන අයදුම්කරුවකුට උදවු දීමෙන් ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ උදවු ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුයි. ලියන ලද කඩදාසි මේසය මත විසුරුවා නො දැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොන ම කරුණක් නිසාවත්, ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසි විභාගාපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයකුට ඉන් පිටත යන්නට වුවමනා වුවොත් විභාගශාලාධිපතින්ගේ සහකාර නිළධාරියකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත්, නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජන විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුයි.

16. විභාගාපේක්ෂකයකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදවු දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

### විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස්

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි:—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට වත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොය බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතීන්ට ඒ බැව් සැලකර එම සැකය දුරු කර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේදී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකට ම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළ හොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඊමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්:—ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ලෙජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නො පමාවම විභාගශාලාධිපතීන්ට දැන්විය යුතුය. විභාග ශාලාවේ දී ඔබට ම දෙනු ලබන කඩදාසි හැර වෙන මොන ම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නො කළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නො කර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්ට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මතක රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චිකරන සෑම කඩදාසියක ම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේ ම පැහදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බෙරා ගන්නට නොහැකි ලෙස නො ලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර, ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතු වන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදු විය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම් සහ කටුවැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරු වල දී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊලඟ පිටුවලදීත් සිත් යොමු කර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන නැවත නැවතතත් ඇඳ පෙන්වීම යොග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ල ම ප්‍රශ්න වලට උත්තර ලියූ පිළිවෙළ අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නො ගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින්ම බාර දිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතුය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමටද හේතුවිය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

අංකය : 1/23/2/20 (ජී).

## සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකාර පන්තියේ II වැනි ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය—1970

1970 නොවැම්බර් මස 27 වැනි දින පැවැත්වීමට නියමිතව තිබී, පසුව 1970 දෙසැම්බර් මස 4 වැනි දිනට කල් දමන ලද ඉහත සඳහන් විභාගය තවදුරටත් 1971 ජනවාරි මස 10 වැනි දිනට කල් දමන ලද බව විභාගාපේක්ෂකයින්ගේ දැනගැනීම සඳහා නිවේදනය කරනු ලැබේ.

2. 1970 අගෝස්තු මස 28 වැනි දින අංක 14,921 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ මෙම විභාගය පිළිබඳව පළකරන ලද අනිකුත් කොන්දේසි නොවෙනස්ව පවතී.

එච්. එස්. වනසිංහ,
රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල්.

1970 නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ දී ය.

11–1043—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

1971.1.1 සිට 1971.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ, පළතුරු කර්මාන්ත ශාලාවේ ඇති ප්‍රිමියර් 2 ඒ. ආයිරුම් සන්තුවල 12" තල මුවහත් කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීම් 1970 දෙසැම්බර් මස 17 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30ට අවසන් වේ. ටෙන්ඩර් පෝර්ම 1970 දෙසැම්බර් මස 17 වැනි බ්‍රහස්පතින්දා දහවල් 12 වනතෙක් කොළඹ 5, නාරාහේන්පිට, අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ, පළතුරු කර්මාන්ත ශාලාවේ, අලෙවි කිරීමේ කොමසාරිස් තැන වෙත රු. 50 ක මුදලක් තැන්පත් කිරීමෙන් පසු නිකුත් කරනු ලැබේ.

කේ. ඇම්. ඊ. පෙරේරා,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970 නොවැම්බර් මස 17 වැනිදා,
කොළඹ 5, නාරාහේන්පිට,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ,
පළතුරු කර්මාන්තශාලාවේ දීය.

11–1073—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

1971 ජනවාරි මස 1 වැනි දින සිට 1971 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ කොළඹ 5, නාරාහේන්පිට, අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ, පළතුරු කර්මාන්තශාලාවට අයත් අක්කර හතරක පමණ භූමියේ ඇති තණ කොළ කපා ඉවත් කිරීම සඳහා කැඳවුම් පත් භාර ගැනීම 1970 දෙසැම්බර් මස 17 වෙනි බ්‍රහස්පතින්ද පස්වරු 2.30ට අවසන් වේ.

මිළ කැඳවුම් පත් පෝර්ම 1970 දෙසැම්බර් මස 17 වැනි බ්‍රහස්පතින්දා දහවල් 12 වනතෙක් කොළඹ 5, නාරාහේන්පිට පාරේ, අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේ, පළතුරු කර්මාන්ත ශාලාවේ අලෙවිකිරීමේ කොමසාරිස් තැනගෙන් ලබා ගත හැක.

කේ. ඇම්. ඊ. පෙරේරා,
අලෙවිකිරීමේ කොමසාරිස් වෙනුවට.

1970 නොවැම්බර් මස 17 වැනිදා,
කොළඹ 5, නාරාහේන්පිට,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ,
පළතුරු කම්හලේදීය.

11–1072—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ ආයතනයන්ට 1971.1.1 සිට 1971.6.30 දක්වා කුකුල් මස් සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත් කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970.12.17 දින අ. භා. 2.30 වන තෙක් භාරගනු ලැබේ. කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලෙහි පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 200 ක් බැඳ ලබාගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට, 1970.12.17 දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. ටෙන්ඩර් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පුළුවන.

සී. ඩී. ප්‍රනාන්දු,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970.11.17 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

11–1027—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

### ටෙන්ඩර් භාරගැනීම දීර්ඝ කිරීම

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ත්‍රිපොලි වෙළඳ හලේ පිහිටි එළමස්/කුකුල්මස්/ ගවමස් හා ඌරුමස් කඩපිල් 1971.1.1 සිට 1971.12.31 දක්වා බදුදීම සඳහා, 1970.11.12 දින සහ අංක 14,931 දරණ රජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පළ කරන ලද ටෙන්ඩර් දැන්වීමේ සඳහන්, ටෙන්ඩර් බාරගැනීමේ අවසාන දිනය 1970.12.10 දින අ. භා. 2.30 දක්වා දීර්ඝ කරන ලදී.

ඇන්. වාමදේව,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970.11.17 දින,
කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ
බී. ඇස්. ඇස්. අයි. ගොඩනැගිල්ලෙහි
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ය.

11–1026—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

### ටෙන්ඩර් බාරගැනීම දීර්ඝ කිරීම

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට 1971.1.1 සිට 1971.6.30 දක්වා දර සහ පොල්කටු සැපයීම සඳහා 1970.11.12 දින සහ අංක 14,931 දරණ රජයේ ගැසට් පතේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පළ කරන ලද ටෙන්ඩර් දැන්වීමේ සඳහන් ටෙන්ඩර් බාරගැනීමේ අවසාන දිනය 1970.12.10 දින අ. භා. 2.30 දක්වා දීර්ඝ කරන ලදී.

ඇම්. ඇස්. විජේරත්න,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970.11.17 දින,
කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ
බී. ඇස්. ඇස්. අයි. ගොඩනැගිල්ලෙහි
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ය.

11–1025—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

කොළඹ 1, ලෝටස් පාරේ පිහිටි දෙපාර්තමේන්තුවට අයත් ශීත ගබඩාවේ ඇති පාවිච්චි කළ විවිධ ද්‍රව්‍යයන් මිලදී ඉවත් කරගෙන යාමට කැමැති අයවලුන්ගෙන් ටෙන්ඩර් ඉල්ලුම් පත්, කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. ඇස්. ඇස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 දෙසැම්බර් මස 18 දින ප. ව. 2.30 දක්වා බාරගනු ලැබේ.

කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. ඇස්. ඇස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක රු. 50 ක මුදලක් තැන්පත් කොට ලබාගත්තා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට, 1970 දෙසැම්බර් මස 18 දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. ටෙන්ඩර් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පිළිවන.

ඇම්. ඩී. ඩබ්ලිව්. ආර්. සපරමාදු,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970 නොවැම්බර් මස 19 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ය.

11–1028—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

### ටෙන්ඩර් බාරගැනීම දීර්ඝ කිරීම

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ මුළුතැන්ගෙය හා බේකරියෙහි එකතුවන සත්ව ආහාර සඳහා සුදුසු ද්‍රව්‍ය මිලදී ඉවත් කරගෙන යාම සඳහා 1970.11.12 දින සහ අංක 14,931 දරණ රජයේ ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වැනි ඡේදයේ පළ කරන ලද කෝවේෂන් දැන්වීමේ සඳහන් කෝවේෂන් බාරගැනීමේ අවසාන දිනය 1970.12.10 දින ප. ව. 2.30 දක්වා දීර්ඝ කරන ලදී.

ඇම්. ඇස්. විජේරත්න,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970.11.17 දින,
කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ
බී. ඇස්. ඇස්. අයි. ගොඩනැගිල්ලේ
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ය.

11–1024—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය

### සපත්තු පෙට්ටි සැපයීම සඳහා ටෙන්ඩර්

ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970. 12. 13 වෙනි දින පෙරවරු 10 වන තෙක් 1970/71 මුදල් වර්ෂයට සපත්තු පෙට්ටි සඳා සැපයීම සඳහා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

කැමැති අයවළුන්ට රු. 10 ක මුදලක් ටැන්ඩර් පත්‍රිකා ගාස්තු වශයෙන් ගෙවා ටැන්ඩර් පත්‍රිකා ලබාගත හැක. වැඩි විස්තර පහත අත්සන් තබන අයගෙන් ලබාගත හැක.

සැපයුම් කළමනාකරු,
ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය.

141, පල්ලිය පාර,
මට්ටක්කුලිය, කොළඹ 15.

11–1069—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—රත්නපුර උප කොටස

බටහිර කොටස භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා (තැ. පෙ. 978, ප්‍රාදේශිය වාරිමාර්ග කාර්යාලය, කොළඹ 5) විසින් රත්නපුර උප කොටස යටතේ කල්තොට වම් ඉවුරු ප්‍රධාන ඇළ කණ්ඩිය පාර දෙවන සැතපුමේ (සැ. 1 දම්වැල් 0 සිට සැ. 1 දම්වැල් 40) හා ඞී. 2 ඇළ කණ්ඩිය පාර (සැ. 0 දම්වැල් 0 සිට සැ. 1 දම්වැල් 0) ගල් අතුරා තාර දැමීම සඳහා සිල් තබන ලද ටෙන්ඩර් පත් 1970.12.14 පෙරවරු 11 දක්වා භාරගනු ලැබේ.

2. මෙම දෙපාර්තමේන්තුවේ රු. 60,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමූපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැකිය.

3. 1970 නොවැම්බර් මස 27 දින සිට 1970 දෙසැම්බර් 13 දින දක්වා සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළදී පමණක් රත්නපුර/කොළඹ/කළුතර/ගම්පහ යන වාරිමාර්ග කාර්යාලයන්ගෙන් ලබා ගත හැකි ආකෘති පත්වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත් ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචිය දැක්වෙන පොත් සහ දැනට ඔවුන් යටතේ ඇති දෙපාර්තමේන්තු වැඩ සහ ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශනයක් ඔවුන්ට ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට ඉඩ දිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝර්මයන් නිකුත් කිරීමට පළමු රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉහත සඳහන් ඕනෑම වාරිමාර්ග කාර්යාලයක හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩරය පිළිබඳ වෙනත් අදාල විස්තර රාජකාරි වේලාවන් තුළදී රත්නපුර වාරිමාර්ග කාර්යාලයෙන් ලබා ගත හැක.

ජේ. ටී. ද සිල්වා,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
රත්නපුර උප කොටස.

1970 නොවැම්බර් මස 18 දින,
රත්නපුර, හිදැල්ලන,
වාරිමාර්ග කාර්යාලයේ දී ය.

11–1029—70.11.27 දින අංක 14.934 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### සීතාඑළියේ බීජ අර්තාපල් ගොවිපලට ගංගා වැලි කියුබ් 170 ක් සැපයීම සඳහා ටෙන්ඩර්

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂිකර්ම ගොවිපල්) කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් සීතාඑළියේ බීජ අර්තාපල් ගොවිපල කළමනාකාරතැන වෙත ගංගා වැලි කියුබ් 170 ක් ගෙනවිත් භාර දීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර්පත් 1970 දෙසැම්බර් මස 23 වෙනි දින ප. ව. 2.30 දක්වා භාරගනු ලැබේ.

2. බණ්ඩාරවෙල ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරී තැනගෙන් ලබාගත් ටෙන්ඩර් පෝර්ම වල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මෙම ටෙන්ඩර් පෝර්ම ලබාගැනීම සඳහා රු. 25 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් පෝර්ම ලබාගැනීම සඳහා රු. 25 ක් තැන්පත් කිරීම පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ ඕනෑම දිසාපති කාර්යාලයක හෝ කළ හැකිය.

4. ටෙන්ඩර් පෝර්ම 1970 දෙසැම්බර් මස 23 වෙනි දින දහවල් 12 දක්වා නිකුත් කරනු ලැබේ.

5. ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ " සීතාඑළිය ගොවිපලට වැලි කියුබ් 170 ක් සැපයීම " යනුවෙන් සඳහන් කළ යුතු අතර, පහළ වම් කෙළවරේ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය.

6. ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට ටෙන්ඩර් අතින්ම ගෙනවිත් පේරාදෙනියේ නි. අ. (ගොවිපල්) කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හෝ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති හෝ ඔහුගේ නියෝජිතයෙකුට අතින්ම භාර දීමද කළ හැකිය.

7. නියමිත පෝර්මවල ලියා නැති හෝ නියමිත කොන්දේසි ඉටු වී නැති හෝ ටෙන්ඩර්පත්‍රයක් ටෙන්ඩරයක් ලෙස භාර ගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම පැහැදිලිව තීන්තෙන් ලිවිය යුතු අතර, මිළ ගණන් ඉලක්කමෙන් ද අකුරෙන් ද සඳහන් කළ යුතුය. ටෙන්ඩර් මිළ ගණන්වල යම් වෙනසක් කළහොත් එකී තැන්වල ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන තබා සහතික කළ යුතුය.

8. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දින නියමිත වේලාවට ටෙන්ඩර් පත් පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නි. අ. (ගොවිපළ) කාර්යාලයේදී, ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. අවශ්‍ය නම් එකී වේලාවට ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැක.

9. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බැව් දන්වා දින 7 ක් ඇතුලත තමා ඉදිරිපත් කළ ටෙන්ඩරයේ සඳහන් මුදලින් 5% ක තැන්පත් මුදලක් තබා ටෙන්ඩර්පත් අත්සන් කිරීමට නොහැකි වුවහොත්, ඔහුගේ ටෙන්ඩරය අවලංගු වනවා පමණක් නොව, ඔහුගේ නම ටෙන්ඩර් කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයට ඇතුලත් කිරීමටද සිදුවනවා ඇත.

10. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් ගිවිසුම්පත් අත්සන් කිරීම සඳහා මුද්දර ගාස්තුව ඔහු විසින් දැරිය යුතු අතර, ගිවිසුම්පත් අත්සන් කර මාසයක් ඇතුලත මෙම සම්පූර්ණ වැලි තොගය සීතාඑළිය ගොවිපල කළමනාකාරතැන වෙත සපයා අවසන් කළ යුතුය.

11. ගිවිසුම්පත් අත්සන් කළ ටෙන්ඩර්කරුට නියමිත දිනයේදී මෙම සැපයීම ඉටු කිරීමට අපහසු වුවහොත් හෝ ගිවිසුම සම්පූර්ණයෙන් කඩකළහොත් හෝ ඔහුගේ නම ටෙන්ඩර් කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයට ඇතුලත් කිරීමට සිදුවනවා ඇත.

12. යම්කිසි ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ වග කීම කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයා තබා ගනී.

13. වැඩි විස්තර සඳහා බණ්ඩාරවෙල ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ කෘෂිකර්ම නිලධාරි තැනගෙන් විමසන්න.

එම්. එල්. සී. ඉලංගකෝන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ : (කෘෂිකර්ම ගොවිපල්).

70.11.16,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙනිය.

11–968—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

කුණ්ඩසාලේ, කෘෂිකර්ම විද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් ද්‍රව්‍යය ලබා ගැනීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත්‍ර 1970.12.18 දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ :—

**රෙදිවලින් මසා නිම කරන ලද ඝනකම අඟල් 6 ක් ඇති අඟල් 72ක් දිග, අඟල් 30 ක් පළල කොහු මෙට්ට සියයක්.**

2. කුණ්ඩසාලේ, කෘෂිකර්ම විද්‍යාලයීය කාර්යාලයෙන් ටෙන්ඩර් අයදුම්පත් ලබාගෙන ටෙන්ඩර් පත්‍රයෙහි (ෆෝර්ම) ඔබගේ අඩුම මිළ ගණන සඳහන් කර, අනුපිටපතක් සහිතව ලියුම් කවරයක බහා මුද්‍රා කර, "මෙට්ට සැපයීම" යන්න ලියුම් කවරයේ වම් කෙළවරේ සඳහන් කර, සභාපති, කුණ්ඩසාලේ, කෘෂිකර්ම විද්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලය, කුණ්ඩසාලේ යන ලිපිනයට ලේඛන ගත තැපෑලෙන් එවිය යුතුය.

3. ටෙන්ඩර් භාරගන්නා අවසාන දින දහවල් 12 වන තුරු ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. එම නිකුත් කිරීම කරනුයේ, එක් ටෙන්ඩර් ෆෝර්මයක් වෙනුවෙන් රු. 25 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළහොත් පමණි. මුදල් තැන්පත් කිරීම ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කල හැක. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර්පත්‍රය පිළිගත් බව දන්වා දින 7 ක් ඇතුලතදී අවශ්‍ය ඇප තැබීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත්, ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඇතුලත් වන්නටද ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් නොඑවුවහොත්, ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් ඉහතකී ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමට ඒවා අනින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් බහාලන ලද කවරයෙහි "මෙට්ට සැපයීම" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කල යුතුයි. ලියාපදිංචි කරන ලද, තැපෑලෙන් එවන ලද ටෙන්ඩර්පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදී සියලුම ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර භාර ගැනීමට නියමිත දින සිට දින හතරක් (4) ඇතුලතදී යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දන්වීමක් නොලැබුණහොත්, ඔහු කුණ්ඩසාලේ, ඉහතකී ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට උවමනා නම්, ඔවුන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයෙකුට ටෙන්ඩර්පත්‍ර විවෘත කරන වේලාවේදී එනම්, 1970.12.10 වැනි දින පස්වරු 2.30 ට ඉදිරියේ සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේදී යටකී වේලාවේදී කුණ්ඩසාලේ, කෘෂිකර්ම විද්‍යාලයීය කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත අයදුම්පත්‍රයේ (ෆෝර්මයේ) ලියා නැති, නැතහොත් එකී නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති, කිසිම ටෙන්ඩර්පත්‍රයක්, ටෙන්ඩර්පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කල යුතුවාත් හැර, ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනස් කිරීමක් කළහොත්, ඒ තැන්වලට ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුයි.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයේ ලිවිය යුතුයි.

8. ටෙන්ඩර්පත්‍රයේ සඳහන් වූද, පිළිගනු ලැබුවාවූද, මෙට්ට සැපයීම සඳහා වැයවන මුලු ගණනින් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂතුමාගේ නමින් තැන්පත් කිරීමටත්, ගිවිසුම්පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරබු ලැබුවහොත් එසේ කළ යුතුයි. මේ මුදල ආපසු දෙනු ලබන්නේ, මේ කොන්ත්‍රාත්තු නිසි පරිදි ඉටුකර නිමවූ විට පමණී. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකල හොත්, ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයටද ඇතුලත් වෙනවා ඇත.

9. ගිවිසුම්පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුය.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති 3 කට වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

11. කොන්ත්‍රාත්කරුට භාර දිය යුතු සියලුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම දුන්නා සේ සලකනු ලැබේ.

12. වර්ෂ 1934 හි 19 අංක දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු විසින් හෝ සේවකයෙකු වෙනුවෙන් හෝ වන්දි ඉල්ලා එවන ඉල්ලුම්පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු විසින් ආණ්ඩුව නිදහස් කල යුතුයි.

13. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරු වැඩට ගැනීම ගැන විද්ධ වීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

14. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලේඛනයට තනි තනිව හෝ ඒ ලේඛනයේ නම් සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නාම ඇතුලත්ව හෝ තමාට සෑහේයැයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා විරුද්ධ වන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

15. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් ඒ බව ඔහුට දන්වන ලද දිනයේ සිට සති තුනක් ඇතුලත අවශ්‍ය මෙට්ට ප්‍රමාණය කුණ්ඩසාලේ, කෘෂිකර්ම විද්‍යාලයට ගෙනවිත් භාර දිය යුතුයි.

16. අසතුටුදායක වැඩකටයුතු නිසා හෝ කොන්ත්‍රාත්තුවේ සඳහන් නියමයන් ඉටු නොකිරීම නිසා හෝ කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමේ අයිතියද කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයා සතු වන්නේ ය. එවැනි අවස්ථාවක කොන්ත්‍රාත්කරුගේ වියදමින් එවැනි වැඩ සම්පූර්ණ කර ගැනීම සඳහා වෙනත් විධිවිධාන යොදා ගැනීමේ අයිතියද කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයා සතු වන්නේ ය.

17. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ, ටෙන්ඩරයක හෝ ටෙන්ඩර්වල කොටසක් පමණක් පිළිගැනීමේ අයිතිය රජය සතුවේ.

18. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දින සිට සති තුනක් තුල භාර ගැනීම සඳහා තම ටෙන්ඩර්පත්‍ර විවෘතව තැබීමට ටෙන්ඩර්කරුවන්ට සිදුවේ.

19. වැඩි විස්තර කුණ්ඩසාලේ, කෘෂිකර්ම විද්‍යාලයේ විදුහල්පතිගෙන් දැනගත හැක.

ඊ. අබේරත්න,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති).

1970.11.5 වැනි දින,
පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදීය.

11–969—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

## පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය

### වේයන්, මකුණන් සහ මැස්සන් වඳ කිරීම සඳහා රසායනික බෙහෙත් ඉසීම

කොළඹ 7, ටොරිංටන් පෙදෙස අංක 33 දරණ ස්ථානයේ පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයෙහි ස්ථිර ලේකම්, එම අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ ගැවසෙන වේයන් විනාශ කිරීම හා ක්‍රීඩා මන්දිරයේ බෝවී ඇති මකුණන් සහ මැස්සන් වඳ කිරීම පිණිස රසායනික බෙහෙත් ඉසීම සඳහා සීල් තබන ලද මිළ ගණන් ලාංකිකයින්ගෙන් හා ලාංකික ආයතනවලින් කැඳවනු ලැබේ.

රසායනික බෙහෙත් ඉසීම පිණිස ගොඩනැගිලි පරීක්ෂා කිරීමට අමාත්‍යාංශයේ කාර්යාල සහකාර මහතාගෙන් කලින් අවසර ලබා ගත යුතුයි.

මේ සඳහා මිළ ගණන් 1970.12.15 දින පෙ. ව. 10 ට පෙර පහත අත්සන් තබන ස්ථිර ලේකම් විසින් භාරගනු ලැබේ. මිළ ගණන් බහාලන කවරයේ වම් කෙළවරේ, "රසායනික බෙහෙත් ඉසීම" කියා සටහන් කර සීල් තබා එවිය යුතුයි. මෙම මිළ ගණන් එදිනම පෙරවරු 11.15 ට විවෘත කරනු ලැබේ. මිළ ගණන් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටිය හැක.

ටෙන්ඩරයක් සම්පූර්ණයෙන්ම හෝ කොටස් වශයෙන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ස්ථිර ලේකම් සතුය.

ඒ. රාජකරුණා,
ස්ථිර ලේකම් වෙනුවට.

1970 නොවැම්බර් 18 ද,
33, ටොරිංටන් පෙදෙස, කොළඹ 7,
පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ දීය.

11–1103—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## 1970–71 මුදල් වර්ෂය තුළ වැලිකඩ බන්ධනාගාරීය කර්මාන්ත අංශයට රබර් පතුල් සහ විලුම් සැපයීම

පහත අත්සන් කරනු ලබන මවිසින් වැලිකඩ බන්ධනාගාරීය කර්මාන්ත අංශයට 1970–71 මුදල් වර්ෂය තුලදී පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර්, 1970 දෙසැම්බර් 14 වැනි දින පෙරවරු 10.30 දක්වා බාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පිළිගනු ලබන්නේ ලාංකිකයන්ගෙන් පමණි.

3. ටෙන්ඩර් හා ආරක්ෂක තැන්පත් මුදල් පහත සඳහන් වේ.

| සැපයුම | | ටෙන්ඩර් තැන්පත් මුදල | | ඇප තැන්පත් මුදල |
|---|---|---|---|---|
| රබර් පතුල් සහ විලුම් සැපයීම | ... | රු. 20 | ... | රු. 300 |

4. **විශේෂ විස්තර:**—මෙම ද්‍රව්‍ය වැලිකඩ බන්ධනාගාරයට ගෙනවිත් බාර දිය යුතුයි.

(අ) රබර් පතුල් :—නොයෙක් ප්‍රමාණයන්ගෙන් විය යුතුයි. රබර් විලුම්:—මිම් ප්‍රමාණයන් 2¼" සිට 4" දක්වා වූ ප්‍රමාණයන්.

5. එකී ද්‍රව්‍ය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන අය විසින් ආදර්ශක (සැම්පල්) ඉදිරිපත් කරන විට ඒවායේ නම සහ ලිපිනය ලියා ලියුම් කවරයක බහා පහත අත්සන් කරනු ලබන අයගේ කායඨාලයේ තැන්පත් කළ යුතුයි. ආදර්ශක නොමැතිව ඉදිරිපත් කොට ඇති ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ඇත. තවද ඒවා ලංකා විද්‍යාත්මක හා පර්යේෂණ ආයතනය මගින් පනවා ඇති නියමිත ද්‍රව්‍ය ප්‍රමාණයන්ට අනුකූලව එම රබර් පතුල් සහ විලුම් සාද තිබිය යුතු බවට එම ආයතනයේ අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත් සහතිකයක් සමග ආදර්ශක ඉදිරිපත් කළ යුතුයි. එම ආදර්ශකවල ලං. වි. හා ප. ආයතනයේ මුද්‍රාවද වැදී තිබිය යුතුයි.

6. පහත සඳහන් ආයතනයන්ගෙන් නියමිත ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමේදී ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නොවේ:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන.

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලබන ග්‍රාම සංවර්ධන සමිති.

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

7. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ, ඒ සඳහා නියමිත පෝර්මයන් මගින් පමණකි. එය ලබා ගත හැක්කේ 1970 දෙසැම්බර් මස 13 වැනි දින ප. ව. 2.30 දක්වා ඉහත සඳහන් ද්‍රව්‍ය සඳහා මුදල් තැන්පත් කර ලබාගත් රිසිට් පත් ඉදිරිපත් කිරීමෙන් පමණක් බවත්, මේ ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ කායඨාලයේදීත් කොළඹින් පිටතදී ඕනෑම කච්චේරියකදීත් තැන්පත් කළ හැකි බවත් සලකනු ලැබේ.

8. ටෙන්ඩර් පත්‍ර සීල් තැබූ කවරයන්හි බහා එහි වම්පස කෙලවරේ "රබර් පතුල් සහ රබර් විලුම්" යනුවෙන් සඳහන් කොට ලියා පදිංචි කළ තැපෑලෙන් එවීම හෝ පහත අත්සන් කරන ලද අයගේ කායඨාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම කළ හැක.

9. නියම කරන ලද මිළ ගණන් ටෙන්ඩර් පත්‍රයන්හි අකුරෙන් හා ඉලක්කම්වලින් දැක්විය යුතුයි. එසේ අකුරෙන් සහ ඉලක්කම්වලින් සඳහන් නොකළ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත. ටෙන්ඩර් පත්‍රයක් පිරවූවාට පසු කිසියම් වෙනස් කිරීමක් හෝ අමුතු එක් කිරීමක් කළහොත් ඒ බව ටෙන්ඩර්කරුවන් විසින්ම අත්සන් යොදා සැබෑ බවට සහතික කළ යුතුයි.

10. වර්ෂ 1970 දෙසැම්බර් මස 14 දින පෙරවරු 10.30ට පහත අත්සන් කරන අයගේ කායඨාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එහිදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට පුළුවන.

11. නියමිත කාල සීමාව තුල අවශ්‍ය සැපයීම් කිරීමට නොහැකි වුව හොත් එම කාල සීමාව සැපයීම ප්‍රමාදවන සෑම දිනයක් වෙනුවෙන්ම වන්දි ගෙවීමට කොන්ත්‍රාත්කරුවන්ට සිදුවේ. එවැනි අවස්ථාවකදී කොන්ත්‍රාත්කරුවන්ට සැපයීමට නොහැකිවන සැපයීම කොන්ත්‍රාත්කරුගේ වියදමෙන් වෙනත් මාර්ගවලින් ලබා ගැනීමේ අයිතිය බන්ධනාගාර කර්මාන්ත අධිකාරි සතුවේ.

12. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් කරන ලද කායඨ ඉටු කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

13. ඕනෑම ටෙන්ඩර් පතක් හෝ සියළු ටෙන්ඩර් පත් හේතු රහිතව ප්‍රතික්ෂේප කිරීමට හා කොන්ත්‍රාත්තුව ඕනෑම අවස්ථාවකදී නවතාලීමේ සම්පූර්ණ අයිතිය බන්ධනාගාර කර්මාන්ත අධිකාරි වෙත පැවරී ඇත.

14. කොන්ත්‍රාත්තුව ලබා ගැනීමට හැකි කොන්ත්‍රාත්කරුට ඒ බව දන්වා දින 10ක් ඇතුළතදී බන්ධනාගාර කර්මාන්ත අධිකාරි සමග ගිවිසුමකට අත්සන් තැබිය යුතුයි. එම කාල සීමාව තුලදී කොන්ත්‍රාත් ගිවිසුමකට අත්සන් කිරීම සඳහා ටෙන්ඩර්කරු අපොහොසත් වුණි නම් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කොට ඔහුගේ නම සහ ලිපිනය වගකීම් පැහැර හැර ගිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියෙහි ඇතුළත් කරනු ඇත.

15. තවත් වැඩි විස්තර දැන ගැණීමට අවැසි නම්, පහත අත්සන් කරන අයගෙන් ලබා ගැනීමට පුළුවන.

ආ. ඒ. එස්. ඩබ්ලිව්. පෙරේරා,
බන්ධනාගාර කර්මාන්ත අධිකාරි වෙනුවට.

බන්ධනාගාර කර්මාන්ත අංශය,
වැලිකඩ බන්ධනාගාරය,
කොළඹ,
1970 නොවැම්බර් 16 වැනි දින.

11–1030—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයීය "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපති තැන විසින් අඟල් 1½ කළුගල් කියුබ් 300ක් බෝලවත්ත දුම්රිය අංගනයට සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1970 දෙසැම්බර් මස 28 වැනි සඳුදා පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් භාරගෙන සාර්ථක අන්දමින් කරගෙන යාමට මුදල් අතින් හැකියාවක් තිබෙන බව පෙන්වීමට ටෙන්ඩර්කරුවන් විසින් අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කළ යුත්තේ මෙහි පහත 3 වන ඡේදය පරිදි තැන්පත් මුදල ගෙවීමට ප්‍රථමයෙන් බව විශේෂයෙන් සැළකිය යුතුයි.

3. ටෙන්ඩරය සඳහා තැන්පත් කළයුතු මුදල වන රුපියල් 50 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10ක් ද කොළඹ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීගේ කාර්යාලයේ තැන්පත් කර ලබා ගත් රිසිට් පත්‍ර පහත සඳහන් ඉංජිනේරු තැන වෙත 1970 දෙසැම්බර් මස 10 වැනි දින පස්වරු 4ට පෙර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබාගත හැකිය.

4. මේ සඳහා තවත් විස්තර හා ටෙන්ඩර් පෝර්ම ද කොළඹ ඩී. ආර්. විජේවර්ධන මාවතේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ජේ. පෝල් සේනාරත්න,
ප්‍රධාන ඉංජිනේරු තැන,
ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.

කොළඹ,
තැ. පෙ. 370,
1970. 11. 18 වැනි දින.

11–1070—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

## ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, කිරුළ පාරේ අංක 200 දරණ ස්ථානයේ ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලීය සභාපති තැන විසින් පහත සඳහන් වැඩය සඳහා මුද්‍රා තබා ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රිකා 1970. 12. 11 දින පූ. භා. 10 වන තෙක් භාරගනු ලැබේ :—

(1) රත්මලානේ ගාලු පාරේ, බොරුපන හන්දියේ සිට ලං. ග. ම. වේරහැර වැඩපළට අගල් 6ක ජලනලයක් ඇමීම.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබා ගත් ආකෘතිපත්‍රවල පිළියෙල කොට අනු පිටපතින් යුතුව වෙන වෙනම ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ අවශ්‍ය සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි අතර, අදාල සැලසුම් පත් යනාදය ඔහුගේ කායභාලයේදී පරීක්ෂාකර බැලීමට පුළුවන. ලංකා ගමනාගමන මණ්ඩලයේ හෝ රජයේ දෙපාර්තමේන්තුවල සිවිල් ඉංජිනේරු වැඩ සම්බන්ධයෙන් රු. 2,50,000 ක් හෝ එයට අධික වැය වන කර්මාන්ත සම්බන්ධයෙන් ලියාපදිංචි වී සිටින, ජලනල ඇමීමට පළපුරුද්දක් ඇති කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍රිකා එවීමට සුදුස්සෝ වෙති.

අවශ්‍ය ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කිරීම සඳහා රු. 500ක මුදලක් ටෙන්ඩර් ඇප මුදල් වශයෙන් ද, ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් ෆෝර්ම ගාස්තු වශයෙන් රු. 25 ක් ද, ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත ගෙවා, එම කුවිතාන්සි 1970. 12. 7 දින දහවල් 12 ට පෙර භාරවන ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

තවද, ටෙන්ඩර්කරුවන් සුදුසු දැයි පරීක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ සහතික පත්‍ර ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. ඉහත සඳහන් ටෙන්ඩර් ගාස්තු ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත මුදලින් පමණක් තැන්පත් කළ යුත්තේ එම සහතික පත්‍ර පිළිගනු ලැබුවේ නම් පමණකි.

අංක 200, කිරුළ පාර, ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන.
නාරාහේන්පිට.

11–1067—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## ආහාර දෙපාර්තමේන්තුව

ප්‍රයෝජනයට ගත නොහැකි මෝටර් රථ අමතර කොටස් තොග 16 ක්, මිළදී ගෙනයාම සඳහා ටෙන්ඩර් පත්‍ර 1970 දෙසැම්බර් 22 දින පස්වරු 2.30 දක්වා කොළඹ, යුනියන් පෙදෙසේ, අංක 330, දරණ ස්ථානයෙහි ආහාර කොමසාරිස් විසින් බාරගනු ලැබේ.

ආහාර කොමසාරිස් වෙත මුදලින් රු. 50ක් තැන්පත් කිරීමෙන් 1970 දෙසැම්බර් 21 දින දහවල් 12.00 දක්වා ලබාගත හැකි ෆෝර්මවල ටෙන්ඩර් (පිටපත් දෙකකින් යුකත්ව) ඉදිරිපත් කළ යුතුයි.

මෙම අමතර කොටස් තොග දහසය (16) පිළිවෙලින් සකස් කර ගබඩාකර ඇත්තේ කොළඹ, කොටුවේ චාමර්ස් ධාන්‍යාගාරයේ ප්‍රවාහන අංශයේ ය. එම ධාන්‍යාගාරය භාර සහකාර ආහාර පාලක හමුවී මෙම භාණ්ඩ පරීක්ෂා කළ හැක.

ටෙන්ඩර් පිළිබඳ සියළුම කොන්දේසි සහ අවශ්‍ය විස්තර ආහාර කොමසාරිස්ගෙන් ලබාගැනීමට පුළුවන.

මිල්ටන් අපොන්සො,
ආහාර කොමසාරිස් වෙනුවට.

1970.11.14 දින,
කොළඹ 2, ආහාර දෙපාර්තමේන්තුවේදීය.

11–863—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

කොළඹ දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩය සඳහා 1970.12.14 දින පස්වරු 2.30 දක්වා කොළඹ තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ. ටෙන්ඩර් එදිනම පස්වරු 2.30 ට විවෘත කරනු ලැබේ :—

| වැඩෙහි ස්වභාවය | ලියාපදිංචි විය යුතු මුදල |
|---|---|
| 1. කොළඹ කාසල් වීදියේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් ගබඩාව වැඩිදියුණු කිරීම. | රුපියල් 5,000 |

2. ටෙන්ඩර් ෆෝර්ම අපේක්ෂකයින් විසින් කොළඹ, ඉඩම් කොමසාරිස් කායභාලයේ ඉඩම් කොමසාරිස් තුමා නමින් අදාල වැඩය වෙනුවෙන් රු. 10 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉඩම් කොමසාරිස් තුමා වෙත ඉදිරිපත් කලවිට ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. අනුමත කරන ලද ග්‍රාමසංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද මෙම වැඩය සඳහා මුදල් ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචි වී තිබේනම් මෙකී වැඩය සඳහා ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ හැකිය. ටෙන්ඩර් තැන්පත් මුදල ගෙවීමෙන් අනුමත කරන ලද සමිති නිදහස් ය. එහෙත් ඉහත සඳහන් මුදල් ප්‍රමාණයට ලියාපදිංචි ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඒවාට ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් ෆෝර්ම සම්පූර්ණ කර පිටපත් 2 කින් යුතුව ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර කවරයේ උඩ වම් කෙළවරේ වැඩෙහි නම ලියා තැබිය යුතුය. ටෙන්ඩර් ෆෝර්ම තැපෑලෙන් නොඑවන්නේ නම් ගාලු මුවදොර මහා ලේකම් කායභාලයේ අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

4. 1970.12.11 වෙනි දින පෙරවරු 10 දක්වා පමණක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

5. තමන්ගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියකින් දන්වූ පසු සතියක් ඇතුලත් ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හා ඇප තැබීමට අපොහොසත් වුවහොත් ඔහු විසින් ටෙන්ඩර් ෆෝර්මය සඳහා තැන්පත් කරන ලද මුදල් රාජසන්තක කරනු ලැබේ.

6. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවා ගැනීමට පුහුණු නුපුහුණු දෙපාර්ශවයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟවිය යුතු අතර ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

7. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු ඉඩම් කොමසාරිස්ගෙන් දැනගත හැකිය.

ඩී. ඩී. වික්‍රමතුංග,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1970 නොවැම්බර් 19 වැනි දින,
ඉඩම් කොමසාරිස් කාර්යාලයේදීය.

11–1031—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

මාන්කුළම, ඉඩම් සංවර්ධන කාර්යාල අංගනයේ, ප්‍රාදේශීය ගබඩාවේ හා කිලිනොච්චිය ලී මෝලේ තිබෙන මෙහි පහත දැක්වෙන ප්‍රයෝජනයට ගත නොහැකි බඩු මිළයට ගැනීමට හා ගෙන යාමට මාන්කුළම ඉඩම් සංවර්ධන නිලධාරී විසින් 70.12.15 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ :—

| අංකය | | විස්තරය |
|---|---|---|
| 1 | ... | ටයර්ස්, ටියුබ්ස්, මෝටර් රථ අමතර කොටස් ආදිය. |
| 2 | ... | විවිධ ද්‍රව්‍ය : ඇලුමිනියම් තහඩු, ඇස්බැස්ටෝස් පීලි තහඩු, ජී. අයි. බාල්දි, පෙට්රෝ මැක්ස්, විදුලි පන්දම්, ක්‍රීඩා භාණ්ඩ, කාර්යාලීය ලී බඩු, පින්තාරු බුරුසු ආදිය. |
| 3 | ... | ඉරාපු ලී සහ පරණ දොර ජනෙල් රාමු. |
| 4 | ... | හිස් තාර පීප්ප සහ ගැලුම් 45 හිස් පීප්ප. |

සැ. යු.—මාන්කුළම, ඉඩම් සංවර්ධන නිලධාරීගෙන් භාණ්ඩවල ලැයිස්තුවක් ලබා ගත හැක.

2. සියලුම ටෙන්ඩර් පත්‍ර 70.12.11 වැනි දින දවල් 12 දක්වා මාන්කුළම, ඉඩම් සංවර්ධන නිලධාරීගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල පුරවා පිටපත් දෙක බැගින් එවිය යුතුයි. ටෙන්ඩර් ආකෘතියක් ලබා ගැනීමට පෙර, මාන්කුළම, ඉඩම් සංවර්ධන කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක රුපියල් 50 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩර්කරුවෝ තැන්පත් මුදල් කුවිතාන්සි සුරක්ෂිතව තබා ගෙන තැන්පත් මුදල නැවත ඉල්ලුම්කරන විට එය ඉදිරිපත් කළ යුත්තාහ. කුවිතාන්සිය ටෙන්ඩර්වලට ඇමිණිය යුතු නොවේ.

4. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම, කවරයේ වම් පස මුදුනේ "ප්‍රයෝජනයට ගත නොහැකි බඩු සඳහා ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා මුද්‍රා තබා මාන්කුළම, ඉඩම් සංවර්ධන නිලධාරී නමට එවිය යුතුයි. කවරයේ වම් පස පහලින් ටෙන්ඩර් කරුගේ නම සහ

ලිපිනය ලිවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. නැතහොත් ඒවා මාන්කුළම, ඉඩම් සංවර්ධන නිලධාරීගේ කාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

5. මාන්කුළම, ඉඩම් සංවර්ධන නිලධාරීගේ කාමරයේදී 70.12.15 වැනි දින දී ප. ව. 3 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ඇත. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍යනම් ඒ වෙලාවට එහි පැමිණ සිටිය හැක.

6. කොන්දේසි නොමැති වන අතර, ටෙන්ඩර් සම්පූර්ණ විය යුතුයි. ටෙන්ඩර් පත් එවීමට අදහස් කර සිටින්නවුන්ට මාන්කුළම, ඉඩම් සංවර්ධන කාර්යාල අංගනයේ, ප්‍රාදේශිය ගබඩාවේදී හා කිලිනොච්චිය ලී මෝලේදී කාර්යාල වේලාවන් තුළ එම බඩු පරීක්‍ෂා කරන මෙන් දන්වා සිටිනු ලැබේ.

7. එක් අංකයකට හෝ අංක කීපයකට ටෙන්ඩර් පත්‍ර එවීමට ටෙන්ඩර්කරුවන්ට හැක. එකිනෙක භාණ්ඩය සඳහා ඉල්ලුම්කළ මුදල වෙන වෙනම විය යුතුයි. මුදල ඉලක්කම්වලින් මෙන්ම අකුරුවලින් ද සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍ර පිරවීමේදී යම් අඩුපාඩුවක් ඇතිව හෝ අකුරු වලින් හා ඉලක්කම්වලින් මුදල් ලිවීමේදී වෙනසක් ඇතිව හෝ එවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්‍ෂේප කිරීමට ඉඩ තිබේ.

8. තෝරාගත් ටෙන්ඩර්කරුවන් විසින් ඒ බව ඔවුන්ට දන්වා දස දිනක් තුළ එහි සඳහන් මුළු මුදල ගෙවිය යුතුයි. මුදල ගෙවා දින දහ හතරක් තුළ එම බඩු ගෙන යා යුතුයි. ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යැවීමෙන් හෝ එහි සඳහන් ස්ථානයේ තැබීමෙන් හෝ ටෙන්ඩරය භාරගත් බව ඔහුට දැන්වූවා සේ සළකනවා ඇත. මාන්කුළමේ ඉඩම් සංවර්ධන නිලධාරී විසින් වෙන අන්දමකට තීරණය නොකළහොත් නියමිත කාලසීමාව තුළ දී ගෙන නොගොස් ගබඩාවේ ඉතිරිවන බඩු නැවත විකුණා දැමීමට හෝ වෙනත් සුදුසු දෙයක් කිරීමට හෝ ඉඩ තිබේ. එවිට ටෙන්ඩර්කරුවන්ට ඒවා ගැන කිසිම අයිතිවාසිකමක් ඉදිරිපත් කළ නොහැක.

9. (අ) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට කලින් ටෙන්ඩරය අස් කර ගන්නා බව නොදන්වුවහොත් හෝ (ආ) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට කලින් ඒවා නොඑවුවහොත් හෝ (ඇ) ටෙන්ඩරය තෝරාගත් බව දන්වීමෙන් පසුව නියමිත කාලසීමාව තුළදී මුදල නොගෙවා හෝ බඩු ඉවත් නොකර හෝ හැරියොත්, තැන්පත් මුදල රාජසන්තක කරනවා ඇත.

10. තෝරාගත් ටෙන්ඩර්කරුවකු බඩු ගෙන යෑම ප්‍රතික්‍ෂේප කළහොත් හෝ ගෙන යාමට බැරි වුවහොත් තැන්පත් මුදල රාජසන්තක කරනු හැර, කොන්දේසි කඩ කරන කොන්තරාත්තුකරුවන්ගේ ලේඛනයේ ඔහුගේ නම ඇතුළත් කිරීමට ද ඉඩ තිබේ.

11. කිසිම හේතුවක් නොදක්වා ඕනෑම ටෙන්ටරයක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්‍ෂේප කිරීමට හෝ ඕනෑම ටෙන්ඩරයක් හෝ ඉන් කොටසක් භාර ගැනීමේ අයිතිය මාන්කුළම ඉඩම් සංවර්ධන නිලධාරී වෙත තිබේ.

එස්. කුමාරස්සාමි,
මාන්කුළම, ඉඩම් සංවර්ධන නිලධාරී.

1970 නොවැම්බර් 15 දින,
මාන්කුළම, ඉඩම් සංවර්ධන කාර්යාලයේදීය.

11–1019—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මැලේරියා මර්දන ව්‍යාපාරය

### පාවිච්චියට අයෝග්‍ය රසායනාගාර උපකරණ සහ වෙනත් විවිධ බඩු බාහිරාදිය විකිණීම

කොළඹ 5, නාරාහේන්පිට පිහිටි මැලේරියා මර්දන ව්‍යාපාරයේ ඇති ඉහත සඳහන් පාවිච්චියට අයෝග්‍ය වූ බඩු බාහිරාදිය සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර 1970 දෙසැම්බර් මස 16 වන දින පූ. භා. 11 වන තෙක් මැලේරියා මර්දන ව්‍යාපාරයේ අධිකාරී තැන විසින් භාර ගනු ලැබේ. ඉහත සඳහන් බඩු පිළිබඳ සම්පූර්ණ විස්තර ඇති ලැයිස්තුවක් මෙම කාර්යාලයෙන් ලබාගත හැක. කොළඹ 5, නාරාහේන්පිට මැලේරියා මර්දන ව්‍යාපාරයේ ලේකම්වරයාගේ මාර්ගයෙන්, කාර්යාලය ඇරතබා ඇති කාලය ඇතුලත මෙම බඩු පරීක්‍ෂා කර බැලීමට පුළුවන.

2. භාරගනු ලබන්නේ මෙම කාර්යාලයෙන් නිකුත් කරනු ලබන ටෙන්ඩර් පත්‍රවල පිළියෙල කරනු ලැබූ ඒවා පමණී. කොළඹ කච්චේරිය හැර වෙන ඕනෑම කච්චේරියක හෝ කොළඹ යෝර්ක් වීදියේ පිහිටි ලංකා බැංකුවේ හෝ මැලේරියා මර්දන ව්‍යාපාරයේ අධිකාරී නමින් (ගිණුම් අංක 141) ටෙන්ඩර් සඳහා රු. 50 ක තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන්, 1970 දෙසැම්බර් මස 14 වෙනි සඳුදා දක්වා මැලේරියා මර්දන ව්‍යාපාරයේ අධිකාරී තැනගේ කාර්යාලයෙන් නිකුත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර පිටපතක් ලබාගත හැක.

3. සියළුම ටෙන්ඩර් බහාලන කවරයේ උඩ වම් පැත්තේ "පාවිච්චියට අයෝග්‍ය බඩු බාහිරාදිය මිලයට ගැනීම සඳහා ටෙන්ඩර්" යන්න ලියා කොළඹ 5, තැ. පෙ. 1472, මැලේරියා මර්දන ව්‍යාපාරයේ අධිකාරී තැන කියා ලිපි යොමුව ලිවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. නැතහොත් ඒ සඳහා මෙම කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

4. පළමුවන ඡේදයේ සඳහන් දිනය සහ වේලාව ඉකුත් වූ විගස සියළුම ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. සියළුම ටෙන්ඩර්කරුවන්ට ඒ වෙලාවේ පැමිණ සිටීමට පුළුවන. ටෙන්ඩර් ඉල්ලුම්කරුවන්ගේ නම් සහ ඔවුන් ඉදිරිපත් කර ඇති ගණන් එහිදී කියවනු ලැබේ.

5. ටෙන්ඩර් පිළිගත් බව දන්වා දින තුනක් ඇතුළත ටෙන්ඩර් පතෙහි සඳහන් මුළු මුදල, මුදලින් ගෙවා බඩු බාහිරාදිය ඉවත් කර නොගතහොත්, ටෙන්ඩර්පත්‍ර තැන්පත් මුදල් කිසිම අයිතිවාසිකමක් නැති වන සේ රාජසන්තක කරනු ලැබේ.

6. ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මැලේරියා මර්දන ව්‍යාපාරයේ අධිකාරී සතුය.

එස්. ඇන්ටනිපිල්ලෙයි,
අධිකාරී වෙනුවට,
මැලේරියා මර්දන ව්‍යාපාරය.

1970 නොවැම්බර් 18 දින,
කොළඹ 5,
මැලේරියා මර්දන ව්‍යාපාරයේදීය.

11–1032—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයීය "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපතිතැන විසින් අඟල් එකහමාර කළුගල් කියුබ් 300ක් වැල්ලවට සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1970 දෙසැම්බර් මස 28 වැනි සඳුදා පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් භාරගෙන සාර්ථක අන්දමින් කරගෙන යාමට මුදල් අතින් හැකියාවක් තිබෙන බව පෙන්වීමට ටෙන්ඩර්කරුවන් විසින් අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කළ යුත්තේ, මෙහි පහත 3 වන ඡේදය පරිදි තැන්පත් මුදල ගෙවීමට ප්‍රථමයෙන් බව විශේෂයෙන් සැළකිය යුතුය.

3. ටෙන්ඩරය සඳහා තැන්පත් කළයුතු මුදල වන රුපියල් 50 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක් ද කොළඹ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීගේ කාර්යාලයේ තැන්පත් කර ලබා ගත් රිසිට් පත්‍ර පහත සඳහන් ඉංජිනේරු තැන වෙත 1970 දෙසැම්බර් මස 10 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 4 ට පෙර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබාගත හැකිය.

4. මේ සඳහා තවත් විස්තර හා ටෙන්ඩර් පෝර්ම ද කොළඹ ඩී. ආර්. විජේවර්ධන මාවතේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ජේ. පෝල් සේනාරත්න,
ප්‍රධාන ඉංජිනේරු තැන,
ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.

තැ. පෙ. 370,
කොළඹ.
1970.11.18 වැනි දින,

11–1071—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 දෙසැම්බර් මස 17 වැනි බ්‍රහස්පතින් දා ප. ව. 2.30 වන තෙක් මෙහි පහත වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ දකුණ ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| 1. කො/පැලැන්වත්ත මහා විද්‍යාලයය | වාසුමනී 60 × 20 ගොඩනැගිල්ල තැනීම. |
| 2. කො/පැලැන්වත්ත මහා විද්‍යාලයය | වාසුමනී කර්මාන්තශාලාව තැනීම. |

**සංලක්ෂ්‍යය.**—කො=කොළඹ දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2 මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශ කාර්යාලයේ හෝ එක් වැඩක් සඳහා රු. 100 මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය හෝමාගම ප්‍රධාන අධ්‍යාපන නිළධාරි වෙත ඉදිරිපත් කිරීමෙන් පහත සඳහන් මුදල් වලට හෝ ඊට වැඩි ගණනකට හෝ අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට 1970 දෙසැම්බර් මස 16 දින පෙ.ව. 12 දක්වා ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාතීමේන්තුවේ රු. 15,000 අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන් ටැන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්) චැක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. ටැන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ හෝමාගම අධ්‍යාපන කාර්යාලයේ ප්‍රධාන අධ්‍යාපන නිළධාරිගෙන් හෝ ලබා ගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සිය නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කරණ අයට පමණි.

**අවශ්‍ය ලියපදිංචිය** අංක 1 සඳහා රුපියල් 15,000 ; අංක 2 සඳහා රුපියල් 25,000.

3. දෙවැනි ඡේදයේ සඳහන්ව ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටැන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටැන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යයි. ඔවුන් දෙවන ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර දෙවැනි හා තුන්වැනි ඡේදවල සඳහන් පරිදි හෝමාගම අධ්‍යාපන කාර්යාලයේ ප්‍රධාන අධ්‍යාපන නිළධාරිගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලාගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි තැපැලෙන් කොළඹ දකුණ ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත එවිය යුතුයි. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර කවරයක බිහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය පැහැදිලි ලෙස ලියා ටෙන්ඩර් කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පෞද්ගලිකව කොළඹ දකුණ ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේ කායඹීල සහකාර/ප්‍රධාන ලිපිකරු වෙත භාර දිය යුතුයි.

5. 1970 දෙසැම්බර් මස 17 වැනි බ්‍රහස්පතින් දා පස්වරු 2.30 ට කොළඹ දකුණ ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේ දී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරණ නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6 ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ දින සිට සති හයක් ගත වන තුරු තමන් සඳහන් කළ මිළ ගණන් වලට එම වැඩය කිරීමට ටැන්ඩර් කරුවන් කැමති විය යුතුයි.

7. වෙනත් අවශ්‍ය විස්තරයක් වේනොත් හෝමාගම ප්‍රධාන අධ්‍යාපන නිළධාරි තැනගේ කායඹීලයෙන් දැන ගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කිරීම සඳහා මෙම කායඹීලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේ දී 1966. 9. 30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් කරණ ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත් කරුවන්ගේ ලියාපදිංචි කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් කරණ ලද ලියාපදිංචි කිරීම හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

පී. ඞී. පෙරේරා,
ප්‍රධාන අධ්‍යාපන නිළධාරී
හෝමාගම.

1970 නොවැම්බර් මස 18 දින,
හෝමාගම අධ්‍යාපන කාර්යාලයේ දී ය.

11–970—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### පාසැල් ගොඩනැගිලි තැනීම් සහ අළුත්වැඩියා කිරීම්

1970 නොවැම්බර් මස 5 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද වැඩ අතුරෙන් අංක 1 දරණ "මහ/හයිලන්ඩ්ස් මහා විද්‍යාලය—දෙමහල් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ" යනුවෙන් සඳහන් වැඩය වෙනුවෙන් ටෙන්ඩර්පත් නිකුත් නොකරන බව මෙයින් දන්වමි.

පියසිරි වන්නිආරච්චි,
නුවරළිය ප්‍රදේශයේ
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 නොවැම්බර් මස 17 වැනි දින,
නුවරඑළිය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ය.

11–971—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—යාපනය කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1971 ජනවාරි 1 වෙනිද සිට 1971 දෙසැම්බර් 31 වෙනිද දක්වා (දින දෙකම ඇතුළුව) කාලය තුළ, මේ සමඟ ඇති උප ලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර යාපනයේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කායඹීලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාර ගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිති වලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ එවා එවැනි ඉල්ලුම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිළිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කායඹීලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකළපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි වරුන්ගේ කායඹීලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාර ගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝරම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම පත් කල් වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේදී ටෙන්ඩර් පත්‍ර අවසාන දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තම ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරින්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝරම ඉහත සඳහන් දෙවන ඡේදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීමට හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් පත්‍ර එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරි " යාපනය කියා එවිය යුතුයි. සිල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිළිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය පැහැදිළිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහාලන ලද ටෙන්ඩර් පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ලේකම් තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උප ලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයේදී පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම මෙම කාර්‍යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර් කරු විසින් පෝර්මයේ " බී " උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි " සී " උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අයකිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් නම් ඒවා පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත් කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැතිනම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උප ලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩුබාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සළසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැන ගත යුතුවාක් මෙන් ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

13. (i) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 4½ක් ඇතුළත් වනසේ බත් වේල් සැපයීමට ටෙන්ඩර් කරුවන් මිළ ගණන් දක්විය යුතු ය.

(ii) දැනට ආහාර උප ලේඛනයේ දක්වා ඇති සහල් අවුන්ස 12 ප්‍රමාණය අවුන්ස 9 වශයෙන් වෙනස් කර ඇති නිසා 1970 ඔක්තෝබර් සිට ඒ වෙනුවෙන් අමතරව පාන් සැපයීම අත්‍යවශ්‍ය වනු ඇත.

(iii) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිළට සපයන අතර ඒ සඳහා ටෙන්ඩර්කරු මුදල් ගෙවිය යුතුය. දැනට සලාක නොවන සහල් රාත්තලක මිළ ශත 50 කි.

පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිළයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත් ඒ සඳහා සලාක නොවන සහල් මිළට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ.

කිසියම් අවස්ථාවකදී සලාක සහල් සැපයුවහොත් ඒ සහල් සඳහා සලාක මිළට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිළේ සහ සලාක සහල් මිළේ වෙනස කොන්ත්‍රාත් කරුගේ ආහාර වවුචරයෙන් අඩු කරගනු ලැබේ.

(iv) කූපන් භාර නොදුන හොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන් ය. කූපන් භාර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ.

(අ) කූපන් වලට ලබාගන්නා සහල් දැනට මෙන් නොමිලයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩු කරනු ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සහල් මිළට නම් නොසපයනු ලබන පාන් වල මිලේත් සලාක සහල් මිලේත් වෙනස අඩුකරගනු ලැබේ.

ඇස්. රාසරත්නම්,
සෞඛ්‍ය සේවා අධිකාරි, යාපනය.

1970
සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය, යාපනය.

## උපලේඛනය

| (1) ආයතනය | (2) කැන්පත් මුදල් රුපියල් | (3) ඇප මුදල් රුපියල් | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයන්ට — මාළු | කරවල | එළවළු | රෝගීන්ට — මාළු | කරවල | එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|
| අලවෙඩ්ඩි මා.නි. | 100 | 300 | | 120 | 230 | 450 | 20 | 50 | 100 |
| අම්පන් මා.නි. | 100 | 300 | | 200 | 400 | 800 | 400 | 800 | 1,600 |
| ධර්මපුරම් ග්‍රා.රෝ. | 100 | 300 | | 180 | 300 | 600 | 600 | 600 | 1,200 |
| කාරෙයිනගර් මා.නි. | 100 | 300 | | 140 | 290 | 560 | 190 | 390 | 780 |
| කොඩිකාමම් මා.නි. | 100 | 300 | | 210 | 430 | 840 | 40 | 80 | 170 |
| කරේවූර් මා.නි. | 100 | 300 | | 475 | — | 600 | — | — | — |
| කරවෙඩ්ඩි මා.නි. | 100 | 300 | 6.12.70 | 290 | 220 | 580 | 10 | 5 | 10 |
| මන්ඩතීව් මා.නි. | 100 | 300 | | 120 | 230 | 470 | 130 | 240 | 520 |
| මානිපායි මා.නි. | 100 | 300 | | 220 | 440 | 880 | 10 | 15 | 50 |
| වරනි මා.නි. | 100 | 300 | | 220 | 400 | 800 | 80 | 160 | 310 |
| වේලනෙයි මා.නි. | 100 | 300 | | 160 | 320 | 650 | 50 | 80 | 160 |
| වේරාවිල් මා.නි. | 100 | 300 | | 200 | 400 | 820 | 270 | 510 | 1,050 |
| උරුතිරපුරම් මා.නි. | 100 | 300 | | 190 | 380 | 750 | 100 | 190 | 380 |
| අනලතීවු මා.නි. | 100 | 600 | | 800 | — | 1,700 | 600 | — | 1,000 |

11–880—70.11.27 දින අංක 14,934 දරන දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1971 ජනවාරි 1 වන ද සිට 1972 දෙසැම්බර් 31 වන ද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම්වලින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මාතලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්‍යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (1) **ටෙන්ඩර් සඳහ මුදල් තැන්පත් කිරීම.**—එම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ චේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(2) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්‍යාලයෙන් හෝ අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය අධිකාරිවරුන්ගේ කාර්‍යාලවලින් හෝ ලබාගත හැක. නියමිත ආකෘති පත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර ආකෘති පත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි ආකෘති පත්‍ර සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුය.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ආකෘති පත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා ආකෘති පත්‍ර ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (2) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට, මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී වෙත '' ට කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම් තැනට හෝ භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන්වූ වහාම ඒවා මෙම කාර්‍යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවනට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක ම විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් ආකෘති පත්‍රයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි ''සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයෙහි සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩුබාහිරාදිය තබාගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩුබාහිරාදිය ගබඩා කර තබාගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම් තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

13. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුට රෝගීන් සහ සේවකයන් විසින් භාර දී ඇති කූපන් වෙනුවෙන් සහන මිළ යටතේ හෝ නොමිළයේ හෝ 1966.12.19 දින සිට පවතින ක්‍රමයට අවශ්‍ය සහල් ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට ආයතන භාර ප්‍රධානියා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

ඒ. උඩවත්ත,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී.

1970 නොවැම්බර් මස 16 වැනි දින,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්‍යාලයේ දී ය.

### උපලේඛනය

| 1 | 2 | 3 | 4 | 5 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආයතනය | ටෙන්ඩර් තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් බාරගන්නා අවසාන දිනය හා වේලාව | ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් | | | | | | | |
| | | | | සේවකයින්ට | | | | නොගෙවන රෝගීන්ට | | | |
| | රු. | රු. | | මාළු | මස් | කරවල | එළවළු | මාළු | මස් | කරවල | එළවළු |
| 1. අත්තනකඩවල ග්‍රා. රෝ. | ... 100... | 300 | 70.12.23 වැනි දින පෙරවරු 10ට | 276... | 275... | 275... | 1,120... | 300... | 320... | 310... | 1,250 |
| 2. මනම්පිටිය මා. නි. | ... 100... | 300 | | 90... | — ... | 120... | 400... | 225... | — ... | 300... | 1,050 |
| 3. ඉලුක්කුඹුර මා. නි. | ... 100... | 400 | | 275... | 275... | 550... | 90... | 160... | 140... | 300... | 475 |
| 4. ගල්අමුන මා. නි. ... | ... 100... | 400 | | 100... | 100... | 100... | 100... | 100... | 100... | 200... | 500 |

11-967—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

### පිත්තල පිඩු විකිණීම සඳහා ටෙන්ඩර්

විවිධ ප්‍රන්බුන්වලින් සාදන ලද පිත්තල පිඩු ටොන් 5ක් විකිණීමට තිබේ. රු. 500ක ආපසු ලබාගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා, කොළඹ 5, අංක 242, හැව්ලොක් පාරේ ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්ම මාර්ගයෙන් මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. අප සංස්ථාවේ යක්කල ලෝහ භාණ්ඩ කම්හලේ තිබෙන මෙම පිත්තල පිඩු වැඩ කරන වේලාවන්හිදී පරීක්ෂා කිරීමට පිළිවන. 1970 දෙසැම්බර් මස 15 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

මිළට ගැණුම් කළමනාකරු.

242, හැව්ලොක් පාර,
කොළඹ 5.

11-1002—70.11.27 දින අංක 14,934 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

### බැටරි චාජ් කිරීමේ උපකරණයක් සඳහා ටෙන්ඩර් කැඳවීම

1971 ජනවාරි මස 6 වැනි දින පෙරවරු 10 වනතෙක් ඉහළ සඳහන් සැපයීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ. රු. 100ක ආපසු ලබාගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා අවශ්‍ය ටෙන්ඩර් පෝර්ම කොළ මෙම කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් තැන්පත් මුදල ටෙන්ඩර්පත් භාරගන්නා දිනට කලින් දින දහවල් 12න් පසු භාරගනු නොලැබේ. අවලංගු කරන ලද ටෙන්ඩර් පෝර්ම කොළ රු. 5ක් ගෙවීමෙන් ලබාගත හැක.

මිළට ගැනුම් කළමනාකාර.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 672, 242, හැව්ලොක් පාර,
කොළඹ 5.

11-1003—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1970 දෙසැම්බර් මස 10 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30 දක්වා කොළඹ 15, අලුත් මාවත පාරේ, සමර්හිල්හි පිහිටි වරාය කොමිෂන් සභාවේ එකතු පොල් තෙල් ටැන්කියේ ඇති පොල්තෙල් ටොන් 4,43,482 තොගය විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1970 දෙසැම්බර් මස 10 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාරදී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. නැතහොත් ටෙන්ඩර්කරුවන්ට තමන්ගේ ටෙන්ඩර්, දෙපාර්තමේන්තු ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව තැන්පත් කළ හැක.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛණ කොළඹ වරාය කොමිෂන් සභා කායඹාලයේදී පරීක්ෂා කළ හැක. රු. 100 මුදලක් වරාය කොමිෂන් සභා කායඹාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1970 දෙසැම්බර් මස 8 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1.
1970.11.15

11-891—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### දැන්වීමයි

කැනේඩියානු ආධාර යටතේ නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලයට රීල් වශයෙන් යුත් සාමාන්‍ය ඇම්. ඇස්. නිව්ස් ප්‍රින්ට් සැපයීමට කැනඩාවේ සැඅයුම් කරුවන් වෙතින් පමණක් මිළ ගණන් කැඳවේ.

ටෙන්ඩර් ලියවිලි කැනේඩියානු මූලිකයන්ගේ නම හා ලිපිනය සඳහන් කර ලියා අයදුම්කර මෙම කාර්යාලයෙන්ද, ඔන්ටාරියෝ, ඔටාවා 2, රේන්ජ් පාරේ 103 හා 104, 85 ස්ථානයන්හි "ද සැන් ග්‍රින්හැම්" ලංකා මහා කොමසාරිස් කාර්යාලයෙන්ද ලබාගත හැක.

1970 දෙසැම්බර් 15 වැනි දින පස්වරු 2 ට ටෙන්ඩර් බාරගැනීම අවසන් කෙරේ.

නි. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරි,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

356, යුනියන් පෙදෙස,
කොළඹ 2,
1970 නොවැම්බර් 7 දින.

11-908—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## පොලිස් දෙපාර්තමේන්තුව

### කොම්පඤ්ඤවීදියේ පොලිස් නිරෝධායන කඳවුරේ අයථා ආගමිකයන්ට පිසින ලද ආහාර සැපයීම

(අ) ලත් ටෙන්ඩර්වල මුළු ගණන ... 6

(ආ) පිළිගත් ටෙන්ඩර්කරුගේ නම ... නාගූර් මීරා පෙයිනුල් ආබ්දීන් මහතා, අංක 42, කුමාරන් රත්නම් පාර, කොම්පඤ්ඤ වීදිය, කොළඹ 2.

(ඇ) කෑම පිළිගත් මිල ගණන්—

| | කෑම වේලක මිල ගණන රු. ශ. |
|---|---|
| (1) (අ) උදේ තේ ... ... | 0 26 |
| (ආ) දවල් කෑම— | |
| (i) දින 3ක් තුළ එළවළු ව්‍යංජන දෙකක් සහ සම්බල් සමග බත් ... ... | 0 42 |
| (ii) දින 2ක් තුළ එළවළු ව්‍යංජන දෙකක් හා කරවල සමග බත් ... ... | 0 43 |
| (iii) දින 2ක් තුළ එළවළු ව්‍යංජන දෙකක් හා මාළු සමග බත් ... ... | 0 44 |
| (ඇ) සවස තේ හෝ කෝපි ... ... | 0 05 |
| (ඈ) රාත්‍රි කෑම ... ... | 0 28 |
| (2) රෝගීන්ගේ කෑම ... ... | 0 80 |

පොලිස් කාර්යාලය,
එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1,
1970 නොවැම්බර් 10.

ඩී. මහේන්ද්‍රම්,
කොළඹ පොලිස් අධිකාරි වෙනුවට.

11-915 —70 .11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

## පොලිස් දෙපාර්තමේන්තුව

### තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම

1970.7.31 දින අංක 14,917 දරණ රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම පරිදි තලෙයිමන්නාරමේ පිහිටි අයථා ආගමිකයින් රඳවා සිටින කඳවුරට සහ නිරෝධායන කඳවුරට කෑම සැපයීම සඳහා ලැබුනු ටෙන්ඩර් සම්බන්ධ තීරණයන්.

| ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර් කරුගේනම | පිළිගත් මිල ගණන | | රු. ශ. |
|---|---|---|---|---|
| 2 ... | කේ. වේලුප්පිල්ලෙයි මයා., | උදේ කෑම | ... | 0 30 |
| | කලපූම්, කාරෙයිනගර් | දවල් කෑම | ... | 0 55 |
| | | සවස තේ (ප.ව.2ට) | ... | 0 10 |
| | | රෑ කෑම | ... | 0 70 |
| | | රෝගීන්ගේ කෑම | ... | 0 90 |

ආර්. සුන්දරලිංගම්,
පොලිස් අධිකාරි, උතුරු පලාත.

පොලිස් කායඹාලය,
යාපනය,
1970 ඔක්තෝබර් මස 31 දින.

11-972—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

# බඩු බාහිරාදිය විකිණීම්

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### කො/මාලිගාකන්ද ක්ලිප්ටන් බාලිකා මහා විද්‍යාලයේ වෙන්දේසියේ විකිණීමයි

කොළඹ 9, මාලිගාකන්ද පාරේ පිහිටි ක්ලිප්ටන් බාලිකා මහා විද්‍යාලය යේ කඩා දමන ලද පරණ ගොඩනැගිලිවල ගොඩනැගිලි උපකරණ තොග යක් 1970 දෙසැම්බර් මස 28 වෙනි දින පෙරවරු 10 ට එම ස්ථානයේ දී, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසි කිරීමට ඇති ද්‍රව්‍යවල උපලේඛනයක් මෙයට සම්බන්ධ කර ඇත.

වෙන්දේසිය සම්බන්ධ කොන්දේසි මෙසේ ය :—

(අ) වෙන්දේසියේ විකිණීමට ඇති ද්‍රව්‍ය තොගය ඉහත සඳහන් ස්ථාන යේ දී පරීක්ෂා කර බැලීමට පුළුවන. වෙන්දේසියේ දී ද්‍රව්‍ය තොගය මිළයට ගැනීමට අදහස් කරන ඉල්ලුම්කරුවන් විසින් එම ද්‍රව්‍ය තොගය කලින් පරීක්ෂා කර බලා ඒවායේ තත්ත්වය හා ප්‍රමාණයද පිළිබඳව සෑහීමට පත්විය යුතුයි. වෙන්දේසියෙන් පසුව ලැබෙන කිසිම පැමිණිල්ලක් පිළිගනු නො ලැබේ.

(ආ) වෙන්දේසිය අවසානයේ දී ගැනුම්කරුවා විසින් ද්‍රව්‍යවල වටිනාකම ලෙස තක්සේරු කරනු ලබන මුදල වෙන්දේසිය පවත්වන නිලධාරි මහතාට ඒ වේලාවේ දීම ගෙවා රිසිට් පතක් ලබා ගත යුතුයි.

(ඇ) මිලයට ගත් ද්‍රව්‍ය ඉහත විද්‍යාලයේ භූමියෙන් ඉවත් කර ගන්නා තුරු ඒවායේ ආරක්ෂාව ගැනුම්කරුවන් සතුය.

(ඈ) ගැනුම්කරුවන් විසින් ද්‍රව්‍ය තොගය ගෙන යා යුත්තේ පාසැලේ විදුහල්පතිනිය ඉදිරිපිට දීය. මේ අවස්ථාවේ දී දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලට හෝ වත්තේ වැටිලි ආදියට හෝ කිසියම් හානියක් නොවන ලෙසට ක්‍රියා කළ යුතුයි.

ඩී. ජී. සුගතදාස,
කො. ප්‍ර./අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 නොවැම්බර් මස 12 වන දින,
කොළඹ 7, ග්‍රීන්පාත්හි,
ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

### උපලේඛනය

1. රට උළු කැට 310 යි.
2. සිංහල උළු කැට, බාගත් සමග 5,000ක් පමණ
3. දිග අඩි 10—6″ × 4″ ලී කෑලි 12 යි.
4. දිග අඩි 8—4″ × 2″ ලී කෑලි 20 යි.
5. දිග අඩි 15 කිතුල් පරාල කෑලි 22 යි.
6. දිග අඩි 8 පොල් පරාල කෑලි 30 යි.
7. 4′ × 4′ ප්ලේන් ඇස්බෙස්ටෝස් ෂීට් 60 යි.
8. 5′ × 2′ ප්ලේන් ඇස්බෙස්ටෝස් ෂීට් 40 යි.
9. 8′ × 2′ ඇළුමිනියම් ෂීට් 7 යි.
10. දර සඳහා පාවිච්චියට සුදුසු පරාල සහ රීප්ප කැබලි ගොඩක් ඇත.

11–859—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් දෙපාර්තමේන්තුව

### හිමිකම් නොපෑ තැපැල් පැකැට්ටුවල බහා තිබුණු භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

අභිමි ලිපි කාර්යාලයට ලැබුණු හිමිකම් නොපෑ තැපැල් පැකැට්ටුවල තිබූ පහත සඳහන් භාණ්ඩ 1970 දෙසැම්බර් මස 21 වෙනි සඳුද පස්වරු 1.30ට කොළඹ 3, කොල්ලුපිටියේ 19 වෙනි පටුමග, අංක 20 දරණ ස්ථානයේ පිහිටි අභිමි ලිපි කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

සාධාරණ මිලකට නොඉල්ලනු ලබන භාණ්ඩ විකිණීම අත්හිටවනු ලැබේ.

ඇම්. පී. ද සිල්වා,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ
වෙනුවට.

තැපැල් කොට්ඨාශය,
තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානය,
කොළඹ 1.
1970 නොවැම්බර් 9 දින.

| භාණ්ඩ අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|
| 1. | පරණ පත්තර හොණ්ඩරයක් |
| 2. | එම |
| 3. | එකක් රාත්තල් 40 බැගින් වූ පරණ මුද්‍රිත කඩදාසි මලු 25ක් |
| 4. | එම |
| 5. | ඉංග්‍රීසි සඟරා 100 යේ මිටියක් |
| 6. | එම |
| 7. | එම |
| 8. | එම |
| 9. | එම |
| 10. | එම |
| 11. | එම |
| 12. | එම |
| 13. | එම |
| 14. | එම |
| 15. | ඉංග්‍රීසි සඟරා 100 යේ මිටියක් |
| 16. | එම |
| 17. | එම |
| 18. | එම |
| 19. | එම |
| 20. | ඉංග්‍රීසි වෛද්‍ය සඟරා 100යේ මිටියක් |
| 21. | ආගමික සඟරා 100යේ මිටියක් |
| 22. | එම |
| 23. | එම |
| 24. | දෙමළ සඟරා 100 යේ මිටියක් |
| 25. | එම |
| 26. | විදේශ භාෂාමය සඟරා 100 යේ මිටියක් |
| 27. | පරණ ''රීඩර්ස් ඩයිජෙස්ට් '' සඟරා තොගයක් |
| 28. | එම |
| 29. | එම |
| 30. | එම |
| 31. | ඉංග්‍රීසි පොත් 14ක් '' කිම් ඉල් සුං බයෝග්‍රෆි (III) |
| 32. | විදේශ භාෂාමය පොත් 5ක් |
| 33. | ඉංග්‍රීසි පොත් තොගයක් |
| 34. | එම |
| 35. | ආගමික පොත් තොගයක් |
| 36. | විදේශ වෙළෙඳ නාමාවලි 4ක් |
| 37. | ඉංග්‍රීසි යාඥ පොත් තොගයක් |
| 38. | මුද්‍රිත සිල්ක් සාරියක් |
| 39. | සෙරෙප්පු කුට්ටම් දෙකක් |
| 40. | සාය 2ක්, බ්ලවුස් 2ක් හා අත්නැති මේස් බැනිමයක් |
| 41. | කළුවර අලි දෙන්නෙක් |
| 42. | පාවිච්චි කළ පිරිමි කුඩයල් හා බෝල් පොයින්ට් පෑනක් |
| 43. | පාවිච්චි කළ මුද්දර 20,000ක පමණ තොගයක් |
| 44. | එම |
| 45. | එම |

11–964—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ගලෙන්බිඳුනුවැව ට්‍රැක්ටර් මැදිහලේ අප්‍රයෝජනවත් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගලෙන්බිඳුනුවැව ට්‍රැක්ටර් මැදිහලේ ඇති මෙහි පහත සඳහන් අප්‍රයෝජන වත් භාණ්ඩ 1970 දෙසැම්බර් මස 15 වැනි දින පෙ.ව. 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

| | | |
|---|---|---|
| 1. | විවිධ වර්ගයේ ස්පැනර් | 4 |
| 2. | 400 × 19 ටයර් | 12 |
| 3. | 700 × 16 ටයර් | 1 |
| 4. | 600 × 16 ටයර් | 14 |
| 5. | 11 × 28 ටයර් | 5 |
| 6. | 10 × 28 ටයර් | 11 |
| 7. | 550 × 16 ටයර් | 1 |
| 8. | 525 × 16 ටයර් | 1 |
| 9. | 750 × 16 ටයර් | 5 |
| 10. | වෝල්ට් 6 බැටරි | 15 |
| 11. | ''නාර්'' පොම්ප | 5 |
| 12. | ගැලුම් 120 බැරල් | 1 |
| 13. | ටොන් 5 ජැක් | 1 |
| 14. | ටොන් 3 ජැක් | 1 |
| 15. | ලන්තෑරුම් | 13 |
| 16. | ලයිසන් හෝල්ඩර් | 12 |
| 17. | ගැලුම් 45 බැරල් | 20 |
| 18. | වෝල්ට් 12 බැටරි | 3 |
| 19. | වෝල්ට් 12 කොයිල් | 1 |

| | | |
|---|---|---|
| 20. | පා පොම්ප | 1 |
| 21. | බ්ලෝ ලාම්පු | 1 |
| 22. | විවිධ වර්ගයේ පිරි | 6 |
| 23. | පොඩි ග්‍රිස් ගන් | 3 |
| 24. | උදළු | 1 |
| 25. | මනින ටේප් පෙට්ටි | 1 |
| 26. | පීඩන මාපක | 1 |
| 27. | යේල් ඉබ්බන් | 1 |
| 28. | කැලි 19 සොකට් සෙට් | 1 |
| 29. | ඉලෝරා වූල් කිට් කැලි | 28 |
| 30. | 13 × 50 × 32 ටයර් | 1 |

2. මෙම ද්‍රව්‍යයන් ගලෙන්බිඳුනුවැව ට්‍රැක්ටර් මැදිහලේදී සාමාන්‍ය වැඩ කරන වේලාවන් අතර පරික්ෂා කර බැලිය හැක.

3. ගැනුම්කරු විසින් එවේලේම මුදල් ගෙවා තමන් මිළදී ගත් බඩු බාහිරාදිය එම ස්ථානයෙන් ඉවත් කර ගත යුතුය. ඉන් පසු එම භාණ්ඩ එහි තබා ගනු ලබන්නේ ගැනුම්කරුගේම වගකීම පිටය.

4. දැනුම් දීමක් නොමැතිව ඕනෑම භාණ්ඩයක් වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ බලය රජය සතුය.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1970 නොවැම්බර් මස 3 වැනි දින,
පේරාදෙණියේ දීය.

11–351—70.11.27 දින අංක 14,934 දරණ ගැසට් පත්‍රය

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## 1971 වර්ෂය සඳහා කළුතර දිස්ත්‍රික්කයේ තොටුපල් රේන්ද විකිණීම

1971 ජනවාරි මස 1 වැනි දින සිට 1971 දෙසැම්බර් මස 31 වැනි දින තෙක් පහත සඳහන් තොටුපලවල් වෙනුවෙන් රේන්ද ගාස්තු අය කිරීමේ සහ එකතු කිරීමේ තනි අයිතිවාසිකම් මිලට ගැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත විසින් කළුතර කච්චේරියේ දී 1970 දෙසැම්බර් මස 21 වැනි දින පෙ. ව. 10.30 තෙක් භාරගන්නා බව මෙයින් දන්වමි :—

1 අඟුරුවාතොට
2. කලවැල් ලාව
3. කිතුල්ගහවත්ත
4. රුක්ගහ තොටුපල
5 වෙරළුගස් තොටුපල හෙවත් පොසැස්ටර්
6 එගොඩඋයන, හේනමුල්ල හා ගොරකාපොල
7. ඉඳිගහ තොටුපල
8. මෝල්කාව
9. හල්වතුර

2. හැකි සෑම අවස්ථාවකදීම තොටුපල් සේවා කටයුතු සමුපකාර සමිතිවලට භාරදීමට වැඩි සැලකිල්ල දක්වනු ලැබේ.

3. එක් එක් ටෙන්ඩර් පත්‍රය ලියුම් කවරයක බහා සීල් (මුද්‍රාව) තබා එකී ලියුම් කවරයේ වම් පස මුදුනේ කෙලවරෙහි "1971 වර්ෂය සඳහා කළුතර දිස්ත්‍රික්කයේ තොටුපල් රේන්ද පිළිබඳ ටෙන්ඩර් පත්‍ර" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර 1970 දෙසැම්බර් මස 21 වෙනි දින පෙරවරු 10.30 ට කලින් කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත වෙත ලැබිය යුතුයි. ඉහතකී දින ඉහත සඳහන් වේලාවට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරණ වේලාවට ටෙන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට කච්චේරියට පැමිණ සිටිය හැක.

4. රු. 50 ක් තැන්පත් කළ බවට දිසාපති කාර්යාලයකින් ලබාගත් කුවිතාන්සියක් එක් එක් ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතු අතර ටෙන්ඩර් පත්‍රයේ මුල්පිටේ එකී කුවිතාන්සියේ අංකය හා දිනය ලකුණු කළ යුතුය.

5. පත් කරුණු ලැබූ ටෙන්ඩර් කරුවාට රේන්ද විකුණන දිනයේ දී එනම් 1970 දෙසැම්බර් මස 21 වැනි දින ගැණුම් මුදලින් 1/10 ක් එවලේම කච්චේරියෙහි මුදලින් තැන්පත් කොට රේන්ද විකුණුම් කොන්දේසි පත්‍රයෙහි අත්සන් කිරීමටත්, තොටුපල් රේන්ද විකුණු දින සිට දින 14 ක් ඇතුලතදී මුළු ගැණුම් මුදලින් 1/3 ක් ඇප මුදලක් වශයෙන් තැබීමටත් නියම කරනු ලැබේ. රේන්ද විකුණුම් කොන්දේසි පත්‍රයට ඔහු රු. 1 ක මුද්දරයක් ඇමිණිය යුතුයි. ඉහත සඳහන් කොන්දේසි කඩකළහොත් රේන්දය විකුණු දින රේන්දකරු විසින් තැන්පත් කළ ගැණුම් මුදලින් 1/10 ක් රාජසන්තක වනු ලැබේ.

6 මගීන් ගෙනයාම සඳහා උවමනා වන සියළුම බෝට්ටු හෝ ඔරු රේන්ද කරු තම වියදමින්ම සපයා ගෙන කැඩී බිඳී යා නොදී අළුත්වැඩියා කරවාගෙන තබා ගැනීමට බැඳී සිටිය යුතුයි. යාත්‍රාව සඳහා බෝට්ටුවල යෝග්‍යතාවන් වරකට බෝට්ටුවකින් ගෙන යා හැකි මගීන් ගණනත් කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත විසින් අනුමත කරණ පරිදි විය යුතුයි. ඉහතකී තොටුපල් වලින්, වැලි, රොන්මඩ ආදිය තම වියදමින් ඉවත් කළ යුතුයි.

7. කිසිම හේතුවක් නොදන්වා ඕනෑම ටෙන්ඊ පත්‍රයක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත සතුව ඇත.

8 මේ සම්බන්ධයෙන් වැඩි විස්තර කළුතර කච්චේරියෙන් දැනගත හැක.

ඇස්. ඩී. සී. සමරතුංග,
කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970 නොවැම්බර් මස 11. වැනි දින,
කළුතර දිසාපති කාර්යාලයේ දී ය.

11–965—70.11.27 දින අංක 14,934 දරණ ගැසට් පත්‍රය

---

# ✓ වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## වෙන්දේසියේ විකිණීමයි

කොළඹ, විත්තම්පලම් ගාඩිනර් මාවතේ ජාතික නිවාස සහකාර කොමසාරිස්, ඩී. එස්. වීරසිංහ මහතාගෙන් මට ලැබී ඇති බලය අනුව කොළඹ, ආර්. සිවයෝගන් ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද 1956. 2. 8 දින අංක 755 දරණ උකස් කරය යටතේ සහ 1957.12.13 දින සහ 1958.1.3 දින ආර්. සිවයෝගන් සහ එෆ්. ඒ. අයි. රත්නායක ප්‍රසිද්ධ නොතාරිස්වරු විසින් සහතික කරන ලද අංක 969/1002 දරණ අතිරේක ඔප්පුව යටතේද මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින් අයි. එස්. රයිමනාතු උම්මා මිය., එම්. සී. එච්. ලපිර් මයා., එම්. සී. එම්. fපාසි මයා. සහ එම්. සී. ඇම්. මැකී මයා. ගෙන් 69.5.31 දින තෙක් අය විය යුතු රුපියල් අනූදස් හයසිය විසිඅටයි ශත අසූහය (රු. 90,628.86) 70.2.18 දින ගෙවන ලද රු. 10,000 හැර අය කර ගැනීම සඳහාත්, එසේම 69.5.31 දින සිට විකිණීම පැවැත්වෙන දිනය හෝ සම්පූර්ණයෙන් ගෙවන දිනය දක්වා තවදුරටත් වූ රුපියල් හතලිස් එකදස් හත්සිය අසූ අට (රු. 41,788) ක මුදලක් සම්බන්ධයෙන් වන පොළී මුදල වර්ෂයකට සියයට හතර (4%) ප්‍රමාණයට යථෝක්ත උගස්කර ප්‍රකාර 69.5.31 දින සිට විකිණීමේ දිනය තෙක් එකතුවන සියලුම දඩ මුදල් සමග අය කර ගැනීමත්, එසේ අය කර ගැනීමේදී, දැරීමට සිදුවන වියදම් සහ ගාස්තු ගැනීම සඳහාත්, මීට අමුණා ඇති උපලේඛනයේ දක්වා ඇති ඉඩම සහ එයට අදාල සියලු දේත් 1970 දෙසැම්බර් 19 වෙනි දින සවස 4 ට පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා ජාතික නිවාස කොමසාරිස්තුමාගෙන් විමසන්න.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ නාගරික සභා සීමාව තුල, මාලිගාවත්තේ පිහිටි උතුරින් : අංක 9 දරණ කැබැල් ලෙන්ද (පාරකට වෙන් කරණ ලද බිම) : නැගෙනහිරින් : අංක 64 දරණ කැබෙල් ලෙන්ද ; දකුණින් : මාලිගාවත්ත පාරේ වරිපනම් අංක 64 සහ ජී. 60 දරන දේපලවලින් සහ බටහිරින් : අංක 2 දරණ කැබැල් ලෙන්ද මායිම් වූ එස්. ඩී. නවරත්නම් බලයලත් මිණින්දෝරු තැන විසින් සකසන ලද අංක 281 හා 1954.4.3 දිනැති මානක සැලැස්ම අනුව පර්චස් හයයි දශම පහයි බිංදුවක (අක්. 0, රු. 0, පර්. 6.50) ප්‍රමාණයෙන් යුත් මාලිගාවත්ත පාරේ වරිපණම් අංක 76/26ඒ දරණ තෙලඹුගහවත්ත නොහොත් තෙලඹුගහඹිවිට නැමැති අංක 3 දරන ඉඩම සහ එහි තනා ඇති මහල් නිවාස.

පෙරකී මාලිගාවත්තේ පිහිටි උතුරින් : කොටහේනේ රෝමානු කතෝලික පල්ලියට අයත් දේපොලවලින් සහ අඩි 10 ක් පලල පාරට වෙන් කරණ ලද බිමෙන්ද ; නැගෙනහිරින් : අඩි 10 ක් පලල පාරට වෙන් කරණ ලද බිමෙන්ද ; දකුණින් : පෙරේරා සහ නවත් අයට අයිති දේපොලින් සහ බටහිරින් : අංක බී1 දරණ කැබැල් ලෙන්ද මායිම් වූ පර්චස් දහයයි දශම අටයි හතක (අක්. 0, රු. 0,

පර්. 10.87) ප්‍රමාණයෙන් යුත් කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් අංක ඒ. 285/292 යටතේ ලියා පදිංචි කරැති තෙලඹුගහවත්ත නොහොත් තෙලඹුගහඹිවිට නමැති ඉඩමේ අංක බී2 දරණ කැබැල්ලෙන් බෙදා වෙන් කරණ ලද කොටසකි, ඉහත සඳහන් අංක 3 දරණ කැබැල්ල.

පෙරකී මාලිගාවත්තේ පිහිටි උතුරින් : අංක 9 දරණ කැබැල්ලෙන් (පාරකට වෙන් කරණ ලද බිම) ද; නැගෙනහිරින් : අංක 5 දරණ කැබැල්ලෙන් ද; දකුණින් : මාලිගාවත්ත පාරේ වරිපනම් අංක ජී. 60 දරණ දේපලින් සහ බටහිරින් : අංක 3 දරණ කැබැල්ලෙන් ද මායිම්වූ එස්. ඩී. නවරත්නම් බලයලත් මිණින්දෝරු තැන විසින් සකසන ලද ඉහත කී අංක 281 හා 1954.4.3 දින දරණ මානක සැලැස්ම අනුව පර්චස් ගතරයි දශම තුනයි එකක (අක්. 0, රූ. 0, පර්. 04.31) ප්‍රමාණයෙන් යුත් කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් අංක ඒ. 353/281 යටතේ ලියා පදිංචි කරැති මාලිගාවත්ත පාරේ වරිපනම් අංක 76/26 දරණ තෙලඹුගහවත්ත නොහොත් තෙලඹුගහඹිවිට නැමැති ඉඩමේ අංක 4 දරණ කැබැල්ල සහ එහි තනා ඇති මහල් නිවාස.

පෙරකී මාලිගාවත්තේ පිහිටි උතුරින් : අංක 9 දරණ කැබැල්ලෙන් ද (පාරකට වෙන් කරණ ලද බිම); නැගෙනහිරින් : අංක 6 දරණ කැබැල්ලෙන් ද; දකුණින් : මාලිගාවත්ත පාරේ වරිපණම් අංක ජී. 60 දරණ දේපලින් සහ බටහිරින් : අංක 4 දරණ කැබැල්ලෙන් ද මායිම් වූ, ඉහත කී එස්. ඩී. නවරත්නම් බලයලත් මිණින්දෝරු තැන විසින් සකසන ලද අංක 281 හා 1954.4.3 දිනැති මානක සැලැස්ම අනුව පර්චස් හතරයි දශම තුනයි එකක (අක්. 0, රූ. 0, පර්. 4.31) ප්‍රමාණයෙන් යුත් කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් අංක 353/282 යටතේ ලියා පදිංචි කරැති මාලිගාවත්ත පාරේ වරිපණම් අංක 76/25 දරණ තෙලඹුගහවත්ත නොහොත් තෙලඹුගහඹිවිට නැමැති ඉඩමේ අංක 5 දරණ කැබැල්ල සහ එහි තනා ඇති මහල් නිවාස.

පෙරකී මාලිගාවත්තේ පිහිටි උතුරින් : අංක 9 දරණ කැබැල්ලෙන් ද (පාරකට වෙන් කරණ ලද බිම); නැගෙනහිරින් : අංක 9 දරණ කැබැල්ලෙන් ද; දකුණින් : මාලිගාවත්ත පාරේ වරිපනම් අංක ජී. 60 දරණ දේපලින් සහ බටහිරින් : අංක 5 දරණ කැබැල්ලෙන් ද මායිම් වූ ඉහත කී එස්. ඩී. නවරත්නම් බලයලත් මිණින්දෝරු තැන විසින් සකසන ලද අංක 281 හා 1954.4.3 දිනැති මානක සැලැස්ම අනුව පර්චස් හතරයි දශම තුනයි එකක (අක්. 0, රූ. 0, පර්. 4.31) ප්‍රමාණයෙන් යුත් කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් අංක ඒ. 353/283 යටතේ ලියාපදිංචි කරැති මාලිගාවත්ත පාරේ වරිපනම් අංක 76/24 දරණ තෙලඹුගහවත්ත නොහොත් තෙලඹුගහඹිවිට නැමැති ඉඩමේ අංක 6 දරණ කැබැල්ල සහ එහි තනා ඇති මහල් නිවාස.

පහත සඳහන් ඉඩම උඩින් පයින් හා වාහන වලින් යැම් ඊමේ මාර්ග අයිතිය :—

පෙරකී මාලිගාවත්තේ පිහිටි, උතුරින් : මාලිගාවත්ත පාරේ වරිපනම් අංක 86 සහ ජී. 100 දරණ දේපලවලින් ද; නැගෙනහිරින් : වරිපනම් අංක 76/21 සහ 22 සහ 76/23 දරණ අංක 7 සහ 8 දරණ කැබැලිවලින් ද; දකුණින් : වරිපනම් අංක 76/23, 76/26, 76/27 සහ 28 සහ 76 දරණ අංක 8, 6, 5, 4, 3, 2 සහ 1 දරණ කැබැලි වලින් සහ බටහිරින් : මාලිගාවත්ත පාරෙන් ද මායිම් වූ, එස්. ඩී. නවරත්නම් බලයලත් මිණින්දෝරු තැන විසින් සකසන ලද අංක 281 හා 1954. 4. 3 දිනැති මානක සැලැස්ම අනුව පර්චස් දහ අටයි දශම අටයි බිංදුවක (අක්. 0, රූ. 0, පර්. 18.80) ප්‍රමාණයෙන් යුත් කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් අංක ඒ352/3 යටතේ ලියා පදිංචි කරැති තෙලඹුගහවත්ත නොහොත් තෙලඹුගහඹිවිට නැමැති ඉඩමේ අංක 9 දරණ කැබැල්ල.

ඇස්. ආර්. ඇල්. පෙරේරා,
වෙන්දේසිකරු.

253, උසාවිය පාර,
කොළඹ 12.

11–1054—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

### කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොඩනැගිලි වැඩ සඳහා ගොඩනැගිලි උපකරණ සැපයීම

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොඩනැගිලි වැඩ සඳහා අවශ්‍ය වන ගොඩනැගිලි උපකරණ මහනුවර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ මධ්‍යම කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු තැනගේ කායසීලයේ ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් පමණක් වරින් වර කැඳවනු ලබන මිල ගණන් අනුව ලබා ගන්නවා ඇත.

මෙසේ ගොඩනැගිලි උපකරණ සැපයීමට අදහස් කරන සියලුදෙන ලියාපදිංචි වීම සඳහා ඔවුන්ගේ අයදුම්පත් 1970. 12. 18 වෙනි දින පෙරවරු 10.30ට පෙර ලැබෙන සේ මහනුවර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු තැන වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ "ගොඩනැගිලි උපකරණ සැපයීම" යනුවෙන් සඳහන් කළ යුතු ය. අයදුම්පත් සමග පහත සඳහන් විස්තරද සැපයිය යුතු ය :—

(අ) සැපයිය හැකි ගොඩනැගිලි උපකරණ වට්ටෝරුවක්.

(ආ) බඩු ප්‍රවාහනය සඳහා වාහන අයිතිව ඇති බවට සාධක;

(ඇ) වත්කම පිළිබඳව හා රජයේ දෙපාර්තමේන්තු වලට ගොඩනැගිලි උපකරණ සැපයීමට ඉල්ලුම්කරුට ඇති හැකියාව පිළිබඳව ප්‍රාදේශිය ආදායම් නිලධාරි තැනගේ වාර්තාවක්.

(ඈ) රජයේ දෙපාර්තමේන්තු හෝ ප්‍රසිද්ධ පුද්ගලික ව්‍යාපාර සඳහා මින් පෙර භාරගත් කොන්ත්‍රාත් වෙතොත් ඒවා සතුටුදායක ලෙස ඉටු කළ බවට සාධක.

මිල ගණන් මත ලබාගැනීමට සිදුවිය හැකි ගොඩනැගිලි උපකරණ පහත දක්වමි :—

1. කඩාපු කළු ගල් අඟල් $\frac{3}{4}$
2. කඩාපු කළු ගල් අඟල් 1
3. කඩාපු කළු ගල් අඟල් $1\frac{1}{2}$
4. කඩාපු කළු ගල් අඟල් 2
5. ගඩොල්
6. ගඟේ වැලි
7. අළු හුණු
8. දියකළ හුණු
9. අඟල් 6ත් 9ත් අතර සක්ක කළු ගල්
10. වට ලී
11. පලංචි සඳහා උණ ගස්
12. වියාපු පොල් අතු
13. උළු.

සී. යොගරාජා,
මධ්‍යම කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු
(ගොඩනැගිලි).

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
මහනුවර,
1970. 11. 14.

11–996/1—70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

### මහනුවර දිස්ත්‍රික්කයේ ගොඩනැගිලි වැඩ සඳහා ගොඩනැගිලි උපකරණ සැපයීම

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ මහනුවර දිස්ත්‍රික්කයේ ගොඩනැගිලි වැඩ සඳහා අවශ්‍යවන ගොඩනැගිලි උපකරන මහනුවර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ මධ්‍යම කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු තැනගේ කායසීලයේ ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් පමණක් වරින් වර කැඳවනු ලබන මිල ගණන් අනුව ලබා ගන්නවා ඇත.

මෙසේ ගොඩනැගිලි උපකරණ සැපයීමට අදහස් කරන සියලුදෙන ලියාපදිංචි වීම සඳහා ඔවුන්ගේ අයදුම්පත් 1970. 12. 18 වෙනි දින පෙරවරු 10.30ට පෙර ලැබෙන සේ මහනුවර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු තැන වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ "ගොඩනැගිලි උපකරණ සැපයීම" යනුවෙන් සඳහන් කළ යුතු ය. අයදුම්පත් සමග පහත සඳහන් විස්තරද සැපයිය යුතු ය.

(අ) සැපයිය හැකි ගොඩනැගිලි උපකරණ වට්ටෝරුවක්.

(ආ) බඩු ප්‍රවාහනය සඳහා වාහන අයිතිව ඇති බවට සාධක.

(ඇ) වත්කම පිළිබඳ හා රජයේ දෙපාර්තමේන්තුවලට ගොඩනැගිලි උපකරණ සැපයීමට ඉල්ලුම්කරුට ඇති හැකියාව පිළිබඳව ප්‍රාදේශිය ආදායම් නිලධාරි තැනගේ වාර්තාවක්.

(ඈ) රජයේ දෙපාර්තමේන්තු හෝ ප්‍රසිද්ධ පුද්ගලික ව්‍යාපාර සඳහා මින් පෙර භාරගත් කොන්ත්‍රාත් වෙතොත් ඒවා සතුටුදායක ලෙස ඉටු කළ බවට සාධක.

මිල ගණන් මත ලබාගැනීමට සිදුවිය හැකි ගොඩනැගිලි උපකරණ පහත දක්වමි :—

1. කඩාපු කළු ගල් අඟල් $\frac{3}{4}$
2. කඩාපු කළු ගල් අඟල් 1
3. කඩාපු කළු ගල් අඟල් $1\frac{1}{2}$
4. කඩාපු කළුගල් අඟල් 2
5. ගඩොල්
6. ගඟේ වැලි
7. අළු හුණු
8. දියකළ හුණු
9. අඟල් 6ත් 9ත් අතර සක්ක කළු ගල්
10. වට ලී
11. පලංචි සඳහා උණ ගස්
12. වියාපු පොල් අතු
13. උළු.

සී. යොගරාජා,
මධ්‍යම කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු
(ගොඩනැගිලි).

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
මහනුවර,
1970. 11. 14.

11-996/2 —70.11.27 දින 14,934 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

### නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොඩනැගිලි වැඩ සඳහා ගොඩනැගිලි උපකරණ සැපයීම

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොඩනැගිලි වැඩ සඳහා අවශ්‍යවන ගොඩනැගිලි උපකරන මහනුවර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ මධ්‍යම කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු තැනගේ කාර්‍යාලයේ ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් පමණක් වරින් වර කැඳවනු ලබන මිල ගණන් අනුව ලබා ගන්නවා ඇත.

මෙසේ ගොඩනැගිලි උපකරණ සැපයීමට අදහස් කරන සියලුදෙන ලියාපදිංචි වීම සඳහා ඔවුන්ගේ අයදුම්පත් 1970. 12. 18 වෙනි දින පෙරවරු 10.30ට පෙර ලැබෙන සේ මහනුවර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු තැන වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ “ගොඩනැගිලි උපකරණ සැපයීම” යනුවෙන් සඳහන් කළ යුතු ය. අයදුම්පත් සමග පහත සඳහන් විස්තරද සැපයිය යුතු ය.

(අ) සැපයිය හැකි ගොඩනැගිලි උපකරණ වට්ටෝරුවක්.

(ආ) බඩු ප්‍රවාහනය සඳහා වාහන අයිතිව ඇති බවට සාධක.

(ඇ) වත්කම පිළිබඳව හා රජයේ දෙපාර්තමේන්තු වලට ගොඩනැගිලි උපකරණ සැපයීමට ඉල්ලුම්කරුට ඇති හැකියාව පිළිබඳව ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ වාර්තාවක්.

(ඇ) රජයේ දෙපාර්තමේන්තු හෝ ප්‍රසිද්ධ පුද්ගලික ව්‍යාපාර සඳහා මීන් පෙර භාරගත් කොන්ත්‍රාත් වෙතොත් ඒවා සතුටුදායක ලෙස ඉටු කළ බවට සාධක.

මිල ගණන් මත ලබාගැනීමට සිදුවිය හැකි ගොඩනැගිලි උපකරණ පහත දක්වමි :—

1. කඩාපු කළු ගල් අඟල් $\frac{3}{4}$
2. කඩාපු කළුගල් අඟල් 1
3. කඩාපු කළු ගල් අඟල් $1\frac{1}{2}$
4. කඩාපු කළු ගල් අඟල් 2
5. ගඩොල්
6. ගඟේ වැලි
7. අළු හුණු
8. දියකළ හුණු
9. අඟල් 6ත් 9ත් අතර සක්ක කළු ගල්
10. වට ලී
11. පලංචි සඳහා උණ ගස්
12. වියාපු පොල් අතු
13. උළු.

සී. යොගරාජා,
මධ්‍යම කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු
(ගොඩනැගිලි).

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
මහනුවර,
1970 11. 14.

11-996/3 —70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

---

## ජාතික කිරි මණ්ඩලය

### 1971 දෙසැම්බර් මාසය දක්වා වූ සැපයීම් සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කරවීම

පහත සඳහන් සැපයීම් සඳහා ලියාපදිංචි වීමට කැමති ලාංකික සැපයුම්කරුවන්ගෙන් 1970 දෙසැම්බර් මස 15 දින අපරභාග 2 දක්වා ඉල්ලුම්පත් භාරගනු ලැබේ :—

(1) රසකරන සාරයන් සහ ආහාර සායම්
(2) රසායනාගාර උපකරණ හා රසායනික ද්‍රව්‍ය
(3) වානේ කැබිනෙට්ටු සහ අල්මාරි, යකඩ සේප්පු සහ අනෙකුත් කාර්යාල උපකරණ
(4) යතුරු ලියන, එකතු කිරීමේ, ගණන් බැලීමේ යන්ත්‍ර යනාදිය
(5) මුද්‍රණ වැඩ සහ ලිපි ද්‍රව්‍ය
(6) කඩදාසි, ප්ලාස්ටික් පොලිතින් රිජිෆෝම් වලින් සෑදූ භාජන
(7) ඉංජිනේරු උපකරණ හා ආයුධ
(8) විදුලි භාණ්ඩ සහ උපකරණ
(9) ලෝහ භාණ්ඩ
(10) ගොඩනැගිලි උපකරණ (ගඩොල් වැලි යනාදිය)
(11) ලී
(12) වීදුරු
(13) තීන්ත
(14) ලීබඩු
(15) මෝටර් රථ අමතර කොටස්
(16) ටයර් සහ ටියුබ්.

2. ලියාපදිංචිවීම සඳහා ඉල්ලුම්පත් කොළඹ 5, නාරාහේන්පිට කිරි මණ්ඩලීය කාර්යාලයේ සැපයුම් කළමනාකරුගෙන් ලබාගත හැක.

3. එක් කරුණකට වඩා වැඩි ගණනක් සඳහා ලියාපදිංචි වීමට අදහස් කරන සැපයුම්කරුවන් එක් එක් කාණ්ඩය වෙනුවෙන් ඉල්ලුම්පත් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.

4. සම්පූර්ණ කරන ලද සියලුම ඉල්ලුම්පත් කොළඹ 5, නාරාහේන්පිට කිරි මණ්ඩලීය කාර්යාලයේ සැපයුම් කළමනාකරුහට 1970 දෙසැම්බර් මස 15 දින අපරභාග 2 ට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

5. මේ සම්බන්ධව වැඩි විස්තර කොළඹ 5, නාරාහේන්පිට සැපයුම් කළමනාකරුගෙන් ලබාගත හැක.

සභාපති,
කිරි මණ්ඩලය.

කිරි මණ්ඩලීය මූලස්ථානය,
33, එලිබෑන්ක් පාර,
කොළඹ 5.

11-1052 —70.11.27 දින අංක 14,934 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් ඉවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුයි.**

උපලේඛනය

**1970**

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූලි ... | 70. 7. 2 බ්‍රහස්පතින්ද ... | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70 7 10 සිකුරාද | 70 7 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද ... | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද ... | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු ... | 70. 8. 7 සිකුරාද ... | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද ... | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද .. | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් ... | 70. 9. 4 සිකුරාද .. | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද .. | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද ... | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද ... | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් .. | 70.10. 2 සිකුරාද .. | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් ... | 70.11. 5 බ්‍රහස්පතින්ද ... | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද ... | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද ... | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද .. | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | 70.12. 4 සිකුරාද ... | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද ... | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද ... | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 ජූනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී